**වර්ෂ 2025. 10.14 වන දින පෙ.ව. 09.30 ට පවත්වන්නට යෙදුනු කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහා සභා රැස්වීමේ වාර්තාව :-**

- **සභාපතිතුමා මුලසුන ගැනිම** :- ගරු සභාපතිතුමා විසින් පැමිණි සිටි සියළු දෙනා පිලිගන්නා ලදී. මහ සභාව පෙ.ව. 9.30 ට ආරම්භ කරන ලදී.මෙදින රැස්වීම සඳහා පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමන්ලා සහ ගරු මන්ත්‍රිතුමියන්ලා සහභාගි විය.

| අනු අංකය | තනතුර | පක්ෂය | නම | පැමිණීම |
|---|---|---|---|---|
| 1. | ගරු සභාපති | ජා.ජ.බ. | එම්. විකසිත පුෂ්පසූරිය මහතා | 08.00 |
| 2. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ඩී.කේ. පී. කුමාර ජයනෙත්ති මහතා | 08.10 |
| 3. | ගරු ප්‍රා.ස.ම | ජා.ජ.බ | කේ.වී.ආර්.ධර්මසිරි | 08.20 |
| 4. | ගරු ප්‍රා.ස.ම. | ප්‍රජා.වාමාංශික 1 | එච්.එම්. සිසිර සේනාරත්න මහතා | 08.25 |
| 5. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඩී. ආශා සමන්කුමාරි | 08.25 |
| 6. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඩී.ජී. ජස්ටින් රණවීර මහතා | 08.30 |
| 7. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා | 08.37 |
| 8. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා | 08.40 |
| 9. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.පී. මහින්ද ජයලාල් පතිරණ මහතා | 08.40 |
| 10. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එම්. ගයාන් වික්‍රමසූරිය මහතා | 08.41 |
| 11. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ඩී. පත්මසිරි දෙල්ගොල්ල | 08.41 |
| 12. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ඒ. දමින්ද නලින් අදිකාරම් මහතා | 08.48 |
| 13. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | ජී. රංගනාත් ගහබඩගේ මහතා | 08.48 |
| 14. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්.ජී. එම්.නිරෝෂණ නාපාවල මහතා | 08.48 |
| 15. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රි.ල.පො.පෙ | බී.ඒ. එස්.පී. කැලුම් ශ්‍රී ධර්මදාස මහතා | 08.47 |
| 16. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එන්. කපිල අබේසිරි මුණසිංහ මහතා | 08.49 |
| 17. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජේ.ටී. ඒ. රංගන විජේසුන්දර මහතා | 09.00 |
| 18. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | කේ.ඩී. චූලා ශාන්ති | 09.00 |
| 19. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | කේ.කේ. දුමින්ද කසුන් අමරසිංහ මහතා | 09.01 |
| 20. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රි.ල.පො.පෙ | ඩී.ඒ. මොහාන් චන්දික අමරසේන මහතා | 09.02 |
| 21. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රි.ල.පො.පෙ | ඒ. ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා | 09.03 |
| 22. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.මහින්ද ගුණසිංහ මහතා | 09.04 |
| 23. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන - 1 | අයි. මංගල කිත්සිරි ඩයස් මහතා | 09.15 |
| 24. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එච්. තනූජා දීපානි චන්ද්‍රකා | 09.15 |
| 25. | ගරු ප්‍රා.ස.ම | ස.ජ.බ | ඉරෝෂා උදයන්ගනී විජේසිංහ | 09.16 |
| 26. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | සතා සිවම් චන්ද්‍රකුමාර් මහතා | 09.16 |
| 27. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | එච්.වී. මහින්ද මහතා | 09.17 |
| 28. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.ඒ. දේවින්ද කුමාර් මහතා | 09.18 |
| 29. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ටී.එම්. උමේෂා මල්කාන්ති | 09.20 |
| 30. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | අජිත් නන්දසිරි මනම්පේරි මහතා | 09.21 |
| 31. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්.ඒ. ඉනෝකා මල්ලව ආරච්චි | 09.25 |
| 32. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රි.ල.පො.පෙ | පී.වී. සුදර්ශන සම්පත් බොතේජු මහතා | 09.26 |
| 33. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.පී. රොෂාන් මධුසංක දේශප්‍රිය මහතා | 09.30 |
| 34. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | බී.එල්. සුධීරා සේමිනි ලියනගේ | 09.25 |
| 35. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන -2 | ඒ. නයනා ජීවනී අතුකෝරළ මිය | 09.30 |
| 36. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රි.ල.පො.පෙ | කේ.කේ. දයාවතී මිය | 09.30 |
| 37. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඒ. සෂිකලා මදුභාෂිනී | 09.30 |
| 38. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ජී.ඩබ්.ජයරත්න මහතා | 09.30 |
| 39. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | අනිල් ජගත් කුමාර ලියනගේ මහතා | 09.30 |
| 40. | ගරු ප්‍රා.ස.ම. | ස්වාධීන - 1 | ඩී.එච්.හරිසිංහ මහතා | 09.30 |
| 41. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | අයි.කේ. රන්ජන් ප්‍රදීප් මහතා | 09.31 |
| 42. | ගරු ප්‍රා.ස.ම. | එ.ජා.ප. | ජී.ඒ.ඊ. රනිල් එදිරිසිංහ මහතා | 09.32 |

| | | | | |
|---|---|---|---|---|
| 43. | ගරු ප්‍රා.ස.ම. | පො.එ.පෙ. | එම්. ප්‍රේමරත්න මහතා | 09.50 |
| 44. | ගරු ප්‍රා.ස.ම. | ස.ජ.බ. | එම්.කේ. විජේසිරි මහතා | 10.05 |
| 45. | ගරු ප්‍රා.ස.ම. | ශ්‍රී.ල.පො.පෙ | කේ.එම්. ජයසේකර මහතා | 12.04 |
| 46. | ගරු ප්‍රා.ස.ම. | ජා.ජ.බ. | ආර්.එල්. එන් මල්කාන්ති ලියනගේ | 12.30 |

**01.පසුගිය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි මහේෂ් නිරෝෂන නාපාවල මහතා -

2025.09.16 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කරන ලෙස යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.කපිල අබේසිරි මුණසිංහ මහතා:-**

2025.09.16 වන දින මහ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීමේ යෝජනාව ස්ථිර කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා-**

**පිටුව අංක 2,හි මාගේ නම නිවැරදිව පත්මසිරි දෙල්ගොල්ල ලෙස සඳහන් විය යුතුයි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-**

**10 පිටුවේ මා විසින්, මනුසත් බලකාය සම්බන්ධකොටගෙන කුරුවිට නගරයේ කසළ ගැටළුව විසඳීමට කටයුතු කිරිම පිළිබඳව අදහස් දැක්වීමේදී මහජන සෞඛ්‍ය පරික්ෂක ප්‍රසාද් මහතා ගේ සහායද මෙම කටයුත්තට ලබාගමු . ලෙස ප්‍රකාශ කලා. එය සඳහන් කරන්න.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-**

**74 පිටුවේ සභාවේ රියදුරන් බඳවා ගන්න කොට වාහන එලවන්න හැකියාව ඇති ,කම්කරු තනතුරේ සිටින නමුත් සුදුසුකම් ඇති අය ඉන්නවා. ඒ අය පිලිබඳවත් සලකා බලන්න ලෙස නිවැරදි විය යුතුයි.**

**70 පිටුවේ පාරේ මුල පළල ට වඩා මාර්ගයේ අග පළල අඩුයි යන්න ඇතුලත් විය යුතුයි.**

**2025.09.16 වාර්තාවේ 06-109 යෝජනාවට අදහස් දැක්වීමේදි අත්‍යාවශ්‍ය,හදිසි කාරණා විතරක් මුදල් කමිටු අනුමැතියෙන් සිදුකිරිමටත් අනෙක්වා මහා සභාවේ අනුමැතිය ඇතිව සිදුකිරිමටත් කටයුතු කලයුතුයි ලෙස සංශෝධනය විය යුතුයි.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා-**

**35 පිටුවේ මාගේ අදහස් දැක්වීම යටතේ තෙප්පනාව ප්‍රධාන මාර්ගයේ පරණ බෝක්කු හතරක් තියෙනවා. ඒ බෝක්කු ගිලාබැසීමකට ලක් වෙලා. ඒවා අඩියෙන් ගැලවිලා කැඩිලා ඇති. පාරේ කාපට් එක බැහැලා ලෙස සඳහන් කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා-

91 පිටුවේ ලිකර් ෂොප් සම්බන්ධව අදහස් දැක්වීමේදී ඇමතිතුමාට යොමුකර ඇති නිර්නාමික ලිපියේ පිටපතක් මටත් ආවා. අපි මැදිහත්වෙලා ප්‍රජා සමිති හා පන්සලෙන් තොරතුරුත් අහලා සුරාබදු එකට දන්වා ඇරියා . විරෝධය පිලිබඳව දැනුම්දුන්නා ලෙස සඳහන්කරන්න.

02. ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා විසින් සභාව වෙත ඉදිරිපත් කල යුතු නිවේදන -

1. වලදූර බන්ධනාගාරයේ තනිමහල් ගොඩනැගිල්ලේ වැඩ අවසන් බිල්පත ගෙවීම සම්බන්ධ 2025.06.16 මහා සභාවේ අංක 06-112 යෝජනාව අවස්ථාවේ තොරතුරු ලබාදෙන ලෙස කල ඉල්ලීම අනුව ඒ පිලිබඳව තොරතුරු ලබා දෙමි. කුරුවිට ප්‍රාදේශීය සභාවේ අරමුදල් යටතේ සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාර අනුමැතිය සහිතව විවෘත ලංසු කැඳවීම තුලින් තෝරාගත් ඉදිකිරීම් ආයතනය සමඟ රු. 10,585,120.47 ක විටිනාකමින් ගිවිසුම්ගතව ක්‍රියාත්මක කරන ලද වලදූර කසළ කළමණාකරන තනි මහල් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය හා පුළුල් කිරීම ව්‍යාපෘතිය මේවන විට වැඩ අවසන් ව ඇති අතර කොටස් බිල්පත් සඳහා දෙවරක් මුදල් ගෙවීමෙන් පසුව කොන්ත්‍රාත් සිදු කළ එල්.පී. කන්ස්ට්‍රක්ෂන් ආයතය විසින් අදාළ වැඩ අවස්න ගෙවීම් ලබාගැනිමට බිල්පත ඉදිරිපත් කර ඇත. 2025.06.16 මහා සභාවේ සභා තීරණය අනුව 25.10.02 දිනැති ලිපිය මගින් මෙම ව්‍යාපෘතිය සඳහා කල කොටස් ගෙවීම් හා විගනන විමසුම මගින් පෙන්වා දි ඇති කරුණු පිලිබඳ විස්තරාත්මකව සඳහන් කර මෙම ගෙවීම සම්බන්ධ උපදෙස් ඉල්ලා පළාත් පාලන සහකාර කොමසාරිස් මගින් පළාත් පාලන කොමසාරිස් වෙත ලිඛිතව යොමු කර ඇත. ඒයට පිලිතුරු ලෙස විගනන විමසුම මගින් දක්වා ඇති වැඩිපුර ගෙවන ලද රු. 180124.00 ක මුදල සම්බන්ධව විගනනයට කරුනු ඉදිරිපත් කර එකගතාවක් ලබාදෙන තුරු ඒම රැඳවුම් මුදලින් අඩුකර පොදු තැම්පත් ගිනුමේ රඳවා ගැනීම සුදුසු බවද ඒවනතෙක් රු. 180124.00 ක මුදල හැර ඉතිරි රැදවුම් මුදල් සභාවේ අවිච්චින්න පැවැත්ම හා අනුප්‍රාප්තික සභාවේ බැදීම් ලෙස සලකා වර්තමාන සභාව විසින් ගෙවිමට සුදුසු බවට නිර්දේශ කර පළාත් පාලන කොමසාරිස් වෙත යොමු කර ඇත. මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස්ගේ පිලිතුරක් මේවන තෙක් ලැබී නොමැති බවද මෙම ගෙවීම සම්බන්ධව සහකාර පළාත් පාලන කොමසාරිස්ගේ ඉහත නිර්දේශය සභාවට දැනගැනිමට ඉදිරිපත් කරමි.

2. පළාත් පාලන කොමසාරිස්ගේ 2025.09.25 දිනැති ලිපිය අනුව ගරු මන්ත්‍රිතුමන්ලාගේ වත්කම් බැරකම් ප්‍රකාශ පළාත් පාලන කොමසාරිස්කාර්යාලය වෙත යොමු කිරිමට , ලේකම්

වරයා වෙත ලබාදෙන ලෙස වට්ස්ඇප් මගින් හා ගරු මන්ත්‍රීතුමන්ලා වෙත දැනුවත් කර තියෙනවා. නමුත් මේවන විටත් ලබාදී ඇත්තේ පස්දෙනෙක් පමනයි. සියළු ප්‍රකාශ එකවර යොමු කරන ලෙස දන්වා ඇති හෙයින් වරින් වර යොමු කරන්නත් බෑ. ඒ නිසා කඩිනමින් මේ වත්කම් ප්‍රකාශ ලබා දෙන්න. මේක අත්‍යවශ්‍ය කාරණයක්.

**03.** සභා රැස්වීමට නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා -

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතා-</u>
නිරෝෂා ලියනගේ මන්ත්‍රීතුමිය අත්‍යවශ්‍ය කටයුත්තක් නිසා මඳක් ප්‍රමාද වී පැමිනෙන බවට සභාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටියා.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-</u>
කේ.එම්.ජයසේකර මන්ත්‍රීතුමා අත්‍යවශ්‍ය කටයුත්තක් නිසා මඳක් ප්‍රමාද වී පැමිනෙන බවට සභාව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටියා.

**04.** ප්‍රාදේශීය සභාව අමතා එවනලද සංදේශ ,පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම.

<u>**1.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා.</u>
පී.ජී.උපාලි සමරකෝන් මහතාගේ ජීවිත හා දේපල අනතුරු ගස් සම්බන්ධව ඉදිරිපත් කර ලිපියක් තිබෙනවා.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>
අවශ්‍ය ඉදිරි කටයුතු සඳහා විෂයනිලධාරීට යොමු කරමු.

**2.** <u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා.</u>
කුරුවිට නගරයේ වෙළඳ ප්‍රජාව විසින් ලිපියක් ඉදිරිපත් කර තිබෙනවා. කුරුවිට නගරයට එරත්න බස්රථයෙන් පැමින පංසල අසල බහින් ජනතාව පරිහරනය කල කෙටි මාර්ගය පිලිබඳව. එතන යම් අවහිරවීමක් සිදුවන ලෙසට පුද්ගලයෙකු පලතුරු මැස්සක් තබාගැනීම නිසා. මේ පිලිබඳව විසඳුමක් දෙන්න.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>
ඒ සම්බන්ධව කාර්මික නිලධාරී මගින් පරික්ෂා කරවා විසඳුමක් ගමු.

**05.** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත

**06.** යථා පරිදි කල් දී ඇති යෝජනා

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06-01. 2025 - 2026** සිරිපා වන්දනා සමය ඇරඹීමට පෙර එරත්න ශ්‍රී පාද මාර්ගය හැරමිටිපාන දක්වා නඩත්තු කටයුතු හා එලිපෙහෙලි කටයුතු සිදුකිරිමට හා ඒ සඳහා ක්‍රමවේදයක් තෝරාගැනීමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>**

එම යෝජනාව ස්ථිර කරමි.

**<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**2025 - 2026** සිරිපා වන්දනා සමය ඇරඹීමට පෙර එරත්න ශ්‍රී පාද මාර්ගය හැරමිටිපාන දක්වා නඩත්තු කටයුතු හා එලිපෙහෙලි කටයුතු සිදුකිරිමට අවශ්‍යයි. පසුගිය කාලේ මේ කටයුතු වලදි සිදු උන අඩුපාඩු ත් සලකලා බලලා ක්‍රමවේදයක් අනුව කරමු. වර්ණගල දක්වා මාර්ගයේ වාහන යන්න පුළුවන්. මේ මාර්ගය එලිකරලා යන්න පුළුවන් තත්වයට ගන්න ඕනි. යම් ඇස්තමේන්තුවක් අනුව යම් බාහිර පාර්ශවයකට දීලා මේ කටයුත්ත කරමු කියලා මම හිතනවා. අමතරව වෙනත් ක්‍රම තියේ නම් කියන්න.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>**

අපි හැම සිරිපා වාරෙකදිම මේ කටයුත්ත කරනවා. මේ මාර්ගයේ විශාල වර්ෂාවලදි සෝදාපාළුවට ලක්වෙලා තියෙන ස්ථාන ,ගල්වැටි ගලවගෙන ගිහින් , පාර ඉතාම අබලන් තත්වේ තියෙන කොට අපි ඒ ස්ථාන නඩත්තුවක් කරනවා. හදනවා. නමුත් ඒවා තාවකාලිකවයි .ඒ කටයුතු කරන්නේ ස්ථිර විසඳුම් විධිහට නෙමෙයි. පලාබද්දල රත්නපුර සිරිපා මාර්ගය ඉතාම අලංකාර ලෙස හමුදාව මැදිහත්වෙලා සිදු කලා. දැන් ඒ පාර සෝදාපාළුවට ලක් වෙන්නේ නෑ. වල්කපලා එලිපෙහෙලි කරන්න විතරයි තියෙන්නේ. වර්ණගල දක්වා වාහන යන නිසා සභාව මගින් කඩ දැම්මොත් වෙලෙඳුන්ට දීලා මුදලක් ගන්නත් පුළුවන්. ගියවර ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් කම්කරුවන් දැම්මේ. සභාව කුණු අදින්න විතරද? කම්කරුවෝ සිරිපා මාර්ගයේ රැස්වෙන කසළ ඉවත් කරනවා. විශාල මුදලක් වැයවෙනවා. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය මගින් කඩ වලින් විශාල මුදලක් වසරකට උපයනවා. ලක්ෂ හතෙන් එහා එක කඩයක්. සභාව කසළ අදිනවා, පාර හදනවා. වෙනත් අය අධික ලාභ ලබනවා. අපිට බැරිද මේ කඩ වලට මැදිහත් වෙන්න. කඩ වෙන්දේසි කරන්න. එතනට වියදම් කරන්නෑ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය . ඒ අය බලනවා විතරයි. ගමේ අය මේ මාර්ගය

පවිත්‍රකිරීම ගැන ස්වේච්ඡාවෙන් කටයුතුත් කරනවා. සරසනවා. අපි තොරන් ගහනවා. මිනිස්සුන්ගේ හදවතට කිඳාබැහැලා මේ කටයුත්ත. සූදාගල මිනිස්සු මේ කටයුත්තට හදවතින්ම කැපවෙලා වැඩ කරන්නේ. සංවිධාන එකතු වෙලා ඉතා අලංකාරව මේ කටයුත්ත සිදු කරන්නේ. අපි සභාවටත් යම් ආදායමක් ලබලා මේ කටයුතුත් කරමුකෝ.සෝදාපාළුව තාවකාලිකව නැතුව ස්ථිරව හදලා අර කඩ මුදලින් ඒවා නඩත්තු කරමුකෝ. ජනතා බදු මුදල් විතරක් නැතිව ඒ වගේ දේටත් යමු. බේරුමණ්ඩිය පඩිපෙල් බඳින එකටත් පෙත්සම් ගහලා. ඒ නම් හරි දෙයක් නෙමෙයි. ඒ කටයුතු නිසිපරිදි කෙරෙනවා. අපි මේ කඩ කටයුත්ත සභාවට අරන් ආදායම් ලබලා හරියට කරමු. සමන් දෙවියෝ වඩින පාර හරියට, ස්ථිරව හදමු. යුධ හමුදා කඳවුරේ සහාය ගන්නත් පුළුවන් වෙයි. මේ පාර ස්ථිරව හැදුවොත් විශාල සෙනගක් යනවා. දැනට අපහසුතා විශාලයි. ගල් උඩ සෝදාගෙන යන විශාල වලවල්. වැටුනොත් දැඩි අනතුරු වෙන්න පුළුවන්. පඩි බඳින්න තියෙනවා. ලබන මාසේ මේක කරන්න බෑ. ස්ථිරව. නමුත් මේ කටයුත්ත ස්ථිරව කරන්න අදාල වාර්තා අරන් කල් ඇතිව සිරිපා නායක හාමුදුරුවෝ මුණ ගැසී හෝ කතා කරන්න. කඩ මුදලි අපතේ යනවා. එරත්න මිනිස්සුන්ගේ මුදල් ඒ පැත්තටම යොදවමු. අපි දැනට කරන්නේ කසළ අදිනවා විතරයි. වෙනත් පිරිසක් සාරය ගන්නවා. නැවත නැවත සභා වාර්තා වල මේ යෝජනාව වසරින් වසර යයි. නමුත් ස්ථිරව , ලස්සනට මේ කටයුතු කරමු. අපි ස්ථිරව මේ මාර්ගය හදන්න ක්‍රමවේදයක් සකසමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා -</u>

මෙතුමා කී පරිදි යුධ හමුදාකඳවුරෙන් සහාය මේ කටයුත්තට ගන්න පුළුවන්. මමත් හමුදා නිලධාරියෙක් ලෙස හිටියා. ඒ සහාය ලබාගමු. කරඬුව වඩම්මන තැන සිටම හමුදාව උදව් කරනවා. අපි අපෙත් ශ්‍රමය දීලා මුල සිටම හරියට කලොත් දිගු කාලයක් මේ මාර්ගය නිසිපරිදි පවත්වාගෙන යන්න පුළුවන්. ලංකාවේ උතුම්ම ස්ථානයක්. මේ කටයුත්තට සහාය දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

රුවන්පුර අපේ මුදුන් මල්කඩ සිරිපා පුදබිම. අපිට ළඟම සිරිපා වන්දනා මාර්ගය එරත්න මාර්ගය. දැන් ක්‍රමයෙන් මේ මාර්ගය භාවිතය අඩුවෙනවා. හැටන් මාර්ගයෙන් ජනතාව බහුල ලෙස යනවා. එරත්න දුෂ්කර මාර්ගයක් නමුත් පඩිපෙල් නිසිපරිදි බැඳලා නඩත්තු කලොත් දෙස් විදෙස් සංචාරක ආකර්ෂනය බහුල වන මාර්ගයක්. කුරුවිට නගරය හරහා යන මේ ගමනේදි ව්‍යාපාර , සේවා ක්ෂේත්‍රයට මේ කටයුතු බලපානවා. නගරයේ පහසුකම් වැඩි විය යුතුයි. මගේ 06-42 යෝජනාව මේකට සම්බන්ධයි. වර්ණගල අවසානයේ වාහනයෙන් බැහැලා යන්න තියේ නම් හොඳයි. අපි අඩුපාඩු මගඅරවලා සභාවේ මූල්‍ය වටිනාකමත් වැඩිකරන එක වටිනවා. ප්‍රෙද්ශයේ ජනතාවගේ ආර්ථිකයට මූල්‍ය වටිනාකමක් එයි. අපි කඩ අරගෙන අපේ නිමයුම් දාලා අලෙවි කේන්ද්‍රයක් කලොත් ඒක අපිට ලාභයක්. බැතිමතුනට පහසුකම් දීලා සභාවට ආදායම් උපයන්න පුළුවන්. මේ යෝජනා ක්‍රියාත්මක උනොත් මූල්‍ය අතින් ජනතාවටත් සභාවටත් වාසියි. අංක එක මාර්ග නඩත්තුව. ලස්සන කුරුවිට වගේ ස්වේච්ඡා සංවිධාන, යුධහමුදාව, වලඳුර බන්ධනාගාරය, වගේ එකතු කරගෙන මේ කටයුතු

සාර්ථකව කරමු. අපි ලඟම සම්පත් තියාගෙන දුක්වෙන්න ඕනි නෑ. අපි එකතුවෙලා මේ කටයුත්ත සාර්ථකව කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>

කැළුම් මන්ත්‍රී තුමා පසුගිය කාලෙත් මේ මතයේ හිටියා. සභාපතිතුමා කිව්වා අඹගමුව සභාව කඩ ආදායම් ගන්නවළු. අපේ කාලේ කරන්න බැරිඋනා. පසුගිය කාලේ සභාව ලක්ෂ පහක් හයක් වැයකලා කැලේ කපන්න විතරක්. කඩ ආදායමෙන් කොටසක් වත් සභාවට ගන්න පුළුවන් නම් වැදගත්. උත්සාහා කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -</u>

කැළුම් මන්ත්‍රීතුමා කිව්වා වගේ මේ කටයුත්ත කාලෝචිතව වැදගත්. සිරිපා සමය අතලඟ. කඩිනම්ව ක්‍රියාත්මක විය යුතුයි. අපි යම් මැදිහත්වීම් කරලා, සාකච්ඡාවක්කරලා ඒ පිලිබදව ඉදිරි වසරේ වත් ක්‍රියාවට නඟමු. සභාවට ආදායමක් එන ලෙස කටයුතු කරන්න. අපිට සංවේදී පරිසර පත්ධතියක් තියෙන්නේ. මේ සිරිපා මාර්ගයේ. දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය ලැබෙන දියඇළි, ගංඟා, බහුලයි. විදුලි බලාගාර රජය මැදිහත්වෙලා සාර්ථකව කරනවා. විදුලිබලාගාරය කෙලවරේ වාහන නැවැත්වීමට පාක් එකක් හැදුවොත් වැදගත්.සංචාරකයින්ට අවශ්‍ය පහසුකම්, සනීපාරක්ෂාව දීලා සැකසිය යුතුයි. දියඇල්ල ලඟ මාර්ගය හා ඇල්ල අවට ප්‍රදේශය සභාවට පවරාගත්තොත් ආර්ථික අතින් සභාවට වැදගත් වෙනවා. මේ කටයුතු සභාවෙන් කලොත් කුරුවිට සංචාරක කර්මාන්තය දියුණු වෙයි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

යෝජනා ව සම්බන්ධයෙන් කැළුම් මන්ත්‍රී තුමාගේ අදහස් වැදගත්. මම තවත් සංශෝධනයක් එකතු කරනවා. සිරිපා ප්‍රෙද්ශය ඉතාමත් සුන්දරයි. එරත්න පාර. නමුත් දුෂ්කරමත් එරත්න පාර. මේ අපේ සිමාවට අයත් මාර්ගය. හැරමිටිපාන දන්වා. මේ ස්ථානය දක්වා වෙළඳ ස්ථාන ගනනක් තියෙනවා. ප්‍රතිපාදන සභාවට ලැබෙන්නෑ. අපි ඒකමතිකව අනුමැතිය දෙමු. 2025 – 2026 වර්ෂයේ වෙළඳ ස්ථාන ටෙන්ඩර් කිරීමේදි ප්‍රාදේශීය සභාවට ඒ කටයුතු කරන්න අනුමැතිය දෙන්න කියලා. දිස්ත්‍රික් ලේකම්ට ඒ බව දැනුම් දෙන්න.

මේ ස්ථානයේ සුන්දරත්වය සිරිපා වාරේ අවාරේ දෙකේම රැකගත යුතුයි. සභාවේ සහාය දෙමින් වෙනත් ආයතනවලත් සහාය අරන් වාරේ අවාරේ පවිත්‍රත්වය, සුන්දරත්වය රැකගත යුතුයි. ඒ සම්බන්ධව ජනතාව දැනුවත් වෙන පරිදි දැන්වීම් පුවරු කීපයක් ප්‍රදර්ශනය කිරීමත් වැදගත්. මාස හයක කාලසිමාවක සිරිපා වාරේ අපේ ආදායම වැඩිකරගන්නත් උත්සහා කරමු. 2026 වසරට වෙළඳ ස්ථාන ටෙන්ඩර් කිරිමට අයිතිය සභාවට ලබාගමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා -</u>

මාස කිපයකට පෙර අපි අඩවිකන්දේ අවසානේ තියෙන පන්සලට ගියා. අලංකාර මාර්ගයක තියෙන්නේ. සිරිපා සමයේ විශාල පිරිසක් මේ මාර්ගයේ යනවා. පාක්එකක් හදන්න පුළුවන්නම් වැදගත්. සිරිපා බිමේ වනවාසි හිමිනමක් මේ පන්සලේ වැඩ සිටිනවා. ඒ හිමි නම කිව්වා ඒ පන්සගේ දාහකට විතර නවාතැන් ගන්න පුවවන්ළු. නාන්න තැන් තියෙනවා. වෙන කාලවල උත්සවත් තියනවා. රනිල් මන්ත්‍රීතුමා කියයි. නමුත් මේ තරම් විශාල ඉදිකිරිම් කරලා අවසානේ වැසිකිලි හදන්න ගියාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඒක නවත්තලා. තහනම් කරලා. දහස්ගානක සෙනඟට යන්න වැසිකිලි නෑ. කැලේට යන්න වෙලා. මම කිව්වා අපි මැදිහත්වෙන්නම් කියලා. මේ කටයුත්තතක් එකතු කරන්න මේ සිරිපා මාර්ග කටයුත්තට. අඩවිකන්දේ අවසානේ නවාතැන. විශාල පන්සලක්. සිරිපා බැතිමතුන්ට වැදගත් මේ ස්ථානය. වැසිකිලි විතරක් නෑ. මේ කටයුත්තට මැදිහත් වෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

මේ සිරිපා මාර්ගය එරත්න පාර කඳු, තැනිතලා, පල්ලම්, විවිධයි. දුරයි, ලස්සනයි. ජනතාව අඩුවෙන් යන්නේ දැන්. කුරුවිට අම්බලමේ ඉඳලා ඒ කාලේ ඉඳන් මිනිස්සු වන්දනාවේ ගියා පයින්. බස් නෑ. ලොරි තට්ටු තිබුනා. ඒකාලේ රෑට කුරුවිට වෙළඳාමට හොඳයි. එරත්න පාර හරියට හැදුවා කියන්නේ කුරුවිටට යහපතක්. නගරේ ආර්ථිකයට හොඳයි. ගමේ සංවර්ධනයට මුදල් එන්න ඕනි පිටින්. දැන් තේ මිලත් අඩුයි. පෝර මිළ වැඩියි. ගාමන්ට් වල පිට ආදායමක්. සිරිපා බැතිමතුන්ට පහසුකම් දීලා හරියට මේ කටයුත්ත කලොත් කුරුවිටට යහපතක්. පිටින් මුදල් ඒමයි වැදගත්ම. අපි කුරුවිට නගරය මේ කටයුත්තට සූදානම් කරමු. උදාහරණයක් විධිහට කුරුවිට නගරයේ වැසිකිළිය හවසට වහනවා. සිරිපා කාලෙට යන්න තැනක් නෑ. ඉස්සර මම අපේ හිටිය නගරේ මන්ත්‍රී සෝමරත්න මන්ත්‍රීතුමාගේ ගෙදරට මිනිස්සු අරිනවා. මිනිස්සු දිවා රෑ එනවා ඒ කාලෙට. පිරිමි කොහේට හරි යනවා. කාන්තාවෝ මොකද කරන්නේ? ඒ හින්දා මේ සිරිපා සමයත් එක්කම රෑට වැසිකිලි පහසුකම් දෙන්න පිලිවෙලක් යොදන්න. දැනට නගරයේ තියෙන්නේ වැසිකිළි දෙකයි. රාත්‍රියට ප්‍රමාණවත් ආලෝකයක් නගරයට අවශ්‍යයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>

අපි කලිනුත් වසරක් ගානේ මේ කටයුතු කලා. නමුත් දැන් ජනතාව වැඩියි. පාර පටු නිසාත් ප්‍රශ්න. අපි ත්‍රීවිල් එකක ගියොත් පැය ගානක් බ්ලොක් එක. පාර පටු නිසාවාහනයක් අයින් කරගන්න තැනක් නෑ. වන්දනා නඩ අඩු වෙනවා. තදබදය නිසා මෙහෙන් එන්නෑ. කුරුවිට අම්බලම ගැන අතීත කතාවල තියෙනවා. මාර්ග පටු තැන් කීපයක් හරි විශාල කලොත් වැදගත්. වන්දනා කාලේ ගමට එන දළු ලොරි, බස්රථ, මාර්ග තදබදය වැඩියි. වන්දනා සමය

ආරම්භයත් එක්ක දේව ප්‍රතිමාව වඩම්මනවා. අපි ජල බවුසර්, කහදියර දීලා මාර්ගය පවිත්‍ර කරනවා. මාර්ග නඩත්තුවත් කරනවා. මේ මාර්ගයේ අවධානම් තැන් කීපයකුත් තියෙනවා. පළාත් මාර්ග එකටත් කියමු. අර එරත්න පාරේ ගියවර යෝජනා කලා ආරක්ෂිත වැට ගැන . ඒක පළාත් මාර්ග සංවර්ධනයටත් කියන්න. අවශ්‍ය අංශ ,ආයතන දැනුවත් කරමු.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා –</u>

සිරිපා වන්දනා සමයේ කුරුවිටට විශාල සෙනඟක් එනවා. ලංකාව පුරාම ජනතාව එනවා. සමන් දෙවියෝ අපේ සබරගමුවට වැදගත්ම දෙවියෝ. රත්නපුරට වැදගත් ආගමික, සංස්කෘතිකමය වටිනාකම් රැසක් වෙනම අනන්‍යතාවක් මේ කටයුතු හරහා බිහිඋනා. සිරිපා සමය සමඟ කුරුවිට සංවර්ධනයට වැදගත් වෙන කටයුතු රැසක් සිදුවෙනවා. වන්දනා නඩවලට පහසුකම් සැපයීම තුලින් ඔවුන් නැවතත් කුරුවිට හරහා ගමන් කරනවා. ඒ නිසා මන්ත්‍රීතුමන්ලා කිව්ව අදහස් වැදගත්. කැළුම් මන්ත්‍රීතුමා කිව්වා වගේ ඒ අදාල ආයතන එක්ක කතා කරලා කඩ වෙන්දේසිය කටයුතු සභාව අතට ගන්න අපි යම් කතා ඇරඹුවා. පුළුවන්. නමුත් යම් කාරණා ටිකක් තියෙනවා. ඒ කඩ වෙන්දේසි කරන්න අපි අයිතිය තහවුරු කරන්න වෙනවා. ඒ ආදායම වගේම සිරිපා සමයේ නගරය සංචාරකයින්ට සුදුසු තත්වයට පත්කරන්න අපි මැදිහත් විය යුතුයි. ඒ කාරණා වලට සහාය වෙන්න. අපිට වර්ණගල දක්වා මාර්ගය සංවර්ධනය කරන්න වෙනවා. මම නිරීක්ෂනය කලා. අපිට ආයතන එක්ක එකතු වෙලා මේ මාර්ගය සංවර්ධනය කරන්න පුළුවන්. වෙනදාට වඩා වැඩි පිරිසක් එයි. වර්ණගල දක්වාම වාහනයේ යන්න පුළුවන්. මාර්ග නවත්තන්න පාකිං සම්බන්ධව මම කතා කලා. නිල වශයෙන් සභාවේ යෝජනාවක් ලෙස සභාව මගින් ආයතන වලට දන්වා මැදිහත්වෙමු. පාර එළිකරනවා වගේම අනෙක් පහසුකම් දෙන්නත් උපරිමයෙන් මැදිහත්වෙමු. අපි කුරුවිටට වැඩි සංචාරක ආකර්ෂණයක් එන විදිහට පහසුකම් වැඩි කරමු. වැසිකිළි රාත්‍රියටත් සේවය දෙමු. මාර්තු පලමුදාට ප්‍රවාහන අධිකාරියේ ගොඩනැගිල්ලේ ඒකත් දෙයි. ඒකත් සභාවට ගමු. පහසුකම් දෙමු. බාහිර පාර්ශවත් එකතුකරගෙන මාර්ගය එළිකරමු. කඩ වෙන්දේසිය ගැන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නිල වශයෙන් දැනුවත් කරලා අදාල අංශ දැනුවත් කරලා කරමු. කඩ සම්බන්ධව ක්‍රියාත්මක විමට මුලික ලෙස ආයතන දැනුවත් කරලා ඉදිරි කටයුතු නීත්‍යානුකූලව කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව 2026 සිරිපා වන්දනා සමය ඇරඹීමට පෙර එරත්න ශ්‍රී පාද මාර්ගය හැරමිටිපාන දක්වා නඩත්තු කටයුතු හා එළිපෙහෙළි කටයුතු සිදුකිරිමටත් එම කටයුත්ත කොන්ත්‍රාත් ක්‍රමවේදය හෝ සුදුසු ක්‍රමවේදයක් අනුව සිදු කිරීමටත්

සිරිපාද සමයේ ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර් කරන කඩ සම්බන්ධව එම ටෙන්ඩර් කිරීමේ අයිතිය ප්‍රාදේශීය සභාව සඳහා ලබාගැනීමට අදාල සියළු අංශ දැනුවත් කර නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කිරිමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06-02.** කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින ආහාර සැකසුම් හා අලෙවිකරණ ස්ථාන වල ආහාර සුරක්ෂිත ක්‍රමවේදයන් ඉහල නැංවීම අරමුණුකොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සමඟ එක්ව සුදුසු ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරිමට යෝජනා කරමි.

ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
මූලික මිනිස් අවශ්‍යතාවක් ලෙස ආහාර වැදගත්. නිවාස වල සකසන ආහාර වගේම අපි පිටින් පරිභෝජනය කරන ආහාර වලත් ප්‍රමිතිය වැදගත්. ආහාරයක සහතික ප්‍රමිතිය, සුරක්ෂිතාවය ගැන වැදගත්. අපේ සෞඛ්‍ය වර්ධනයට වගේම අපේ සෞඛ්‍ය දූර්වල කරන්නත් මේ ආහාරවලට පුළුවන්. රසකාරක, පිලිකා කාරක , ආදී ප්‍රමිතියෙන් තොර දේ ආහාර නිෂ්පාදනයට දායක කරගැනීමෙන් රට පුරා ලොව පුරා ජනතාව විවිධ රෝගවලට ගොදුරු වෙලා. අපි මේ තත්වය මත මිට වඩා සැලසුම් සහගතව ජනතාවගේ සෞඛ්‍ය පිලිබඳව කටයුතු කල යුතුයි. අපි මේ සම්බන්ධයෙන් මැදිහත්විය යුත ආයතන, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල, මහජන සෞඛ්‍ය නිලධාරි මැදිහත් කරගෙන මේ ජනතාවගේ ආහාර සම්බන්ධයෙන් ආයතනයක් ලෙස අපිට කල හැකි උපරිමය සිදුකරමු. ආහාර නිෂ්පාදන අලෙවිසැල්, ආහාර අලෙවිකරන ස්ථාන, හෝටල් ආදී ආහාර කටයුතු සම්බන්ද ස්ථාන සියල්ල යම් ප්‍රමිතියක් ඇති තත්වයට ගමු. අපි මුලින්ම මේ ආහාර සම්බන්ධ කටයුතු කරන ව්‍යාපාර ස්ථාන හිමියන්ව දැනුවත් කරමු. අහාර සෞඛ්‍ය, සේවක පිරිසිදුකම, ස්ථානයේ පවිත්‍රතාවය, ආදිය දැනුවත් කරලා ඒවාට අවශ්‍ය පහසුකම් දීලා, දැනුවත් කරමු. ඒ වෙළඳසැල්වල ප්‍රමිතිය ඉහල නංවලා ඒ අය අතර ඇගයීමක්, කරමු. යම් තරඟකාරි තත්වයක් එයි. පරික්ෂා කරලා යම් ක්‍රමයක් අනුව ලකුණු දීලා , ඒ ආයතනය ශ්‍රේණිගත කරමු. ජනතාවට ඒ ආයතනයේ ලකුණු -ශ්‍රේණිය ප්‍රදර්ශනය කරමු. එතකොට ජනතාව ඒ අලෙවි ස්ථානවලට යන්න පෙළඹෙනවා වගේම එතකොට අනිත් ආයතනත් උත්සහා කරනවා නියමිත ප්‍රමිතියෙන් තමන්ගේ ආහාර වෙළඳ ස්ථානය පවත්වාගෙන යන්න. ඒ ,බී, සී, ආදි ලෙස වර්ග කිරිමට කමිටුවක් පත්කරලා අදාල අංශ සහභාගිකරවලා පරික්ෂා කරවමු. ජනතාවට නිරායාසයෙන් හොඳ පිරිසිදු ආහාර ගන්න අවස්ථාව ලැබෙයි.

මේ වෙළඳසැල්වල අපද්‍රව්‍ය නිසි නිතිරීති අනුව බැහැරකරනවාද යන්නත් වැදගත්. කුරුවිට ගඟට එන අපද්‍රව්‍ය වැඩියි. මේ කටයුත්ත හරහා ඒ තත්වයත් පාලනය කල හැකියි. ගඟත් ආරක්ෂා කරලා අපද්‍රව්‍ය බැහැරකිරිමත් පාලනය කරලා වෙළඳ ස්ථානයට ප්‍රමිතියක් දෙන්නත් පුළුවන්. අපේ බල සීමාවේ සියළු ආහාර සම්බන්ධ වෙළඳසැල් මේ කටයුත්තට එකතු කරගමු. අපි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල හා අනෙකුත් බාහිර ආයතන සම්බන්ධකරගෙන මේ කටයුතු ආරම්භ කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -</u>

අපිට නගරයෙන් ආහාරයක් මිලදී ගත්තත් සැකසහිතයි ඇත්තටම මේ ආහාර පිරිසිදුද යන්න පිලිබඳව. ආහාර වල ගුණය, පිරිසුදුකම, ඇති ස්ථානය මොකක්ද යන්න ජනතාවට වැදගත්. ජනතාවගේ විශ්වාසය ඒ ස්ථානයට ලැබෙනවා. වැඩි අලෙවියත් වෙයි. මේ ක්‍රමවේදය හැම ප්‍රදේශයටම හඳුන්වා දි ක්‍රියාත්මක කිරීම වැදගත්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රභාත් කුමාර ජයනෙත්ති මහතා -</u>

ජනතාවට සෞඛ්‍යමත් ආහාරයක් පිටින් ගැනීම හීනයක් වෙලා. කුරුවිට වලදූර ඇළ අපවිත්‍රයි, කඩ පිටුපස ජරා වලවල් නගරේ. කසළ ගොඩවල් සමහර ස්ථානවල. මහජන සෞඛ්‍ය පරික්ෂකවරයෙන් ඉන්නවද? සූදාගල එරත්න මහජන සෞඛ්‍ය පරීක්ෂක එකතු වෙලා අපි සංචාරක හෝටල් නිසි කමවේදයට ගන්න කටයුතු කරනවා. නමුත් පසුගිය දිනක හෝටලයක නවාතැන්ගත් පුද්ගලයෙක් මැරුණා දියේ ගිලිලා. විවෘත තීන්දුවක් දුන්නා. නමුත් ආහාර විෂවිමක් නිසා වෙන්නත් පුළුවන්ළු. ආහාර පනත් අනුව මේ හෝටලවල වැඩ කරන වෙජ්ලා ,සේවකයින් මාස හයෙන් හයට වෛද්‍ය පරික්ෂණ කරන්න ඕනිළු. නමුත් ඔවුන් කිසිම පරික්ෂණයකට යොමු වෙලා නෑ. මහවත්තකන්ද හෝටලයේ විතරක් සරත් මහත්තයා මේ පරික්ෂන කරනවා. මේ සේවක ලෙඩරෝග, ආහාර ප්‍රමිතිය තොරවිම නිසා එකවර තුන්සීය හාරසීය ලෙඩවෙන්නත් පුළුවන්. ගාමන්ට් වල නිතර ආහාර විෂවීම් වෙලා සේවකයින් ලෙඩ වෙනවා . මහජන සෞඛ්‍ය පරික්ෂකලාවත් එකතුකරගෙන මේ කටයුත් කරමු. ලැගුම්හල් වලටත් මේ ක්‍රමවේදය යොදන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>

ආහාර කිච්චාම කෑම බිම දෙකම අයිතියි. සිරිපා සමයට කුරුවිට වතුර අපවිත්‍ර වෙනවා. පානීය වතුරත්. නගරයේ ආහාර පිසින වතුරත් අපිරිසිදුයි. අද සභාවට වතුර බෝතල් දීලා. මම යෝජනාවක් දාන්න හිටියේ. ගිය සභාවේ වතුර දුන්නේ වීදුරුවලට. වරින්වර වර එක එක වීදුරු වල වතුර දුන්නා. හදිසියට සමහර වීදුරු හෝදන්නෙත් නැතිව දුන්නේ. මාරු කර කර වීදුරු දුන්නේ. කෙනෙකුට තියෙන ලෙඩරෝග වෙන කෙනෙකුට පහසුවෙන්ම බෝ වෙනවා.

ඒ ක්‍රමය මේ වගේ තැනකට ගලපන්න බෑ. අද සභාපතිතුමා වීදුරු වෙනුවට වතුර බෝතල් දුන්නා. මම මේක යෝජනාවක් විධිහට ගේන්න හිටියේ ලේකම්තුමාත් ඒක දාන්න එපා කීව නිසා දැම්මේ නෑ. සෞඛ්‍යමත් රටාව සභාවෙන්ම පටන්ගමු. ආරම්භය හොඳයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ජයලාල් මහතා</u>

අපේ රටේ ආහාර නිෂ්පාදන ශාලා, අවන්හල් ආදියට බලපත්‍ර ගතයුතුයි. පලමුවෙන්ම පළාත් පාලන ආයතනයෙන් බලපත්‍ර ගන්න ඕනි. පනතේ රෙගුලාසි අනුව ජනතාවගේ ආහාර පිලිබඳව සුරක්ෂිතව කටයුතු කරන්න **1987** අංක **15** සහා පනතේත් නීති පනවලා තියෙනවා. රෝග පාලනය කරන්න ක්‍රමවේද මාර්ගෝපදේශ සංග්‍රහයෙත් තියෙනවා. අපිට අත්නොහැරිය හැකි වගකීමක් නිසා මේ යෝජනාව වැදගත්. මේක ආහාර විකුනන ඕනෑම ස්ථානයක සිට සුපිරි වෙළඳසැල් දක්වාම වලංගුයි. ඒ නිසා ආහාර සකසන ස්ථාන පාලනයකට ලක් කිරිම වැදගත්. සේවකයින් දැනුවත් කරලා නිසි ආහාර වේලක් ජනතාවට දෙන්න කටයුතු කරමු. අවශ්‍ය පුහුණු වලට ඒ අය යොමු කරමු. විශාල ලෙස ආහාර සකසන ස්ථානවලට ඇත්තෙන්ම ආහාර අධීක්ෂණය කරන්න නිලධාරී සේවයක් ගන්න ඕනි. ක්‍රමවත්ව ආහාර සකසන ස්ථාන දැනුවත් කරලා අහඹු පරික්ෂන කරලා මහජන සෞඛ්‍ය පරික්ෂකවරු ලවා මේ කටයුතු කරවමු. ලකුණු දීමේ ක්‍රමයක් හදලා කඩේ තත්වය ප්‍රදර්ශනය කරවමු. ව්‍යාපාරිකයින් අතර තරඟය නිසා ඒ අය උත්සාහා කරනවා නිසි තත්වයට එන්න. ගුණාත්මක සේවයන් අපිට ජනතාවට ලබාදෙන්න පියවර ගන්න පුළුවන්. ඒ ස්ථානවල කැලිකසළ ඉවතලන ක්‍රමවේදයත් සලකා බලමු. නිසි අවබෝධයෙන් හිතකර සේවයක් දෙන්න පුළුවන් තත්වයට මේ ස්ථාන පත්කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රොෂාන් මධුශංක මහතා</u>

ආහාර වල සුරක්ෂිතතාවය නැති නිසා විවිධ ලෙඩරෝග සමාජය තුල පැතිරෙනවා. එය වර්තමාන සමාජයේ ඛේදවාචකයක් වෙලා. සියළු අදහස් ගෙන මේ කටයුතු ක්‍රියාත්මක කරමු. ලෝකයේ බෝවන රෝග බෝ නොවන රෝග අතරින් මේවන විට ප්‍රචලිත බෝ වන රෝග. නිසි ලෙස ආහාර සුරක්ෂිතතාවය කලොත් මේ රෝග වලින් වැලකෙන්න පුළුවන්. විවිධ දැනුවත් කිරිම්, ශ්‍රේණිගත කිරිම් , පුහුණුවිම් වැදගත්. යෝජනාව කාලෝචිතයි. සියළු අදහස් රැගෙන බල ප්‍රෙද්ශය තුල ආහාර තුලින් ජනතා සෞඛ්‍ය ආරක්ෂා කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල මුණසිංහ මහතා</u>

ඉතා කාලෝචිත මාතෘකාවක්. කුරුවිට නගරයේ විශාල ප්‍රමාණයක් ආහාර සැකසුම් ස්ථාන තියෙනවා. ප්‍රමිතිය පිලිබඳ ගැටළු තියෙනවා. ආහාර පිසීමේදි කුස්සි ආදියත් අපිරිසිදුයි. මහජන සෞඛ්‍ය පරික්ෂක සහාය අරන් කටයුතු කරමු. ආහාර සැකසුම් ස්ථාන නිසි පිලිවෙලට ගන්න සහාය වෙමු. අලෙවිකරන ස්ථාන වලට ලොරි රථ, ත්‍රී විල්, තට්ටු, ආදියත් ඇතුලත්. මැස්සෝ

වහනවා. ලෙඩ බහුලයි. ඒ නිසා අපි සහාය වෙමු. මේ කටයුත්ත ජනතාවට වැදගත්. කුරුවිට ඇතුළුව ප්‍රදේශයේ අනෙකුත් නගරවල ක්‍රියාත්මක කරමු. ප්‍රශස්ත ජනතා සේවයක් ඉටු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී තනූජා දීපානි චන්ද්‍රිකා මිය-</u>

මේ යෝජනාව වැදගත්. නගරේ ජනතාවට චෝදනා එනවා. කෑම සැකසීමේදි ප්‍රමිතිය ගැන. නමුත් ඒ ජනතාවට දැනුම, පලපුරුද්ද තියෙනවා. ඒ අය දැනුවත්. ඒ අයට වතුර නෑ. ගොඩාක් දේශන දෙනවාට වඩා කුරුවිට නගරේ මූලික පහසුකම් නංවා සිටියොත් ගොඩක් ගැටළු අඩුවෙයි. නගරෙට වැසිකිලි අඩුයි. සනීපාරක්ෂාව අඩුයි. වැසිකිලිය එක්කෝ උතුරනවා. නැත්නම් කාලෙකට වහලා. වැඩිපුරම නගරෙට පිටින් එන අයයි නගරය අපිරිසිදු කරන්නේ. ව්‍යාපාරික ප්‍රජාව නෙමෙයි. ඒ අය කැමති නගරය ප්‍රසන්න වෙනවටයි. කුණුපෙරාගෙන, මූනකට හෝදන්නේ නැතිව ව්‍යාපාරික ප්‍රජාව ඉන්නේ නෑ. නගරයට එන්නේ ජනතාව. ඒ අයට නිසි ප්‍රමිතියට දෙයක් දෙන්න නම් නගරයට අවශ්‍ය පහසුකම් දෙන්න. පානීය පිරිසිදු වතුර, පිරිසිදු වැසිකිළි පහසුකම්, කුණුගොඩවල් ගොඩගැහිලා නැති පිරිසිදු වටපිටාවක් දෙන්න. ගැටළු විසඳෙයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය-</u>

කුරුවිට ප්‍රාදේශීය සභාව නිරෝගී පරපුරක් බිහිකරන්න ගන්න උත්සාහයට ස්තුතියි. ඒ කටයුත්තේදි මේ නගරයට ආහාර සුරක්ෂිතතාවය උදෙසා පිරිසිදු වතුර වැදගත්. මන්ත්‍රීතුමිය කිව්වා වගේ පිරිසිදු ජලය භාවිතා නොකලොත් ආහාර සුරක්ෂා නෑ. කුරුවිට නගරයට පිරිසිදු වතුර අපි දෙනවද? සභාවෙන් දෙන වතුර නිසි ක්‍රමවේදයට පිරිපහදු වෙනවද? කුරුවිට නගරයට දෙන වතුර වලින් හදන තේ තමා අපි ඒ කඩ වලින් බොන්නේ. මඩවතුර. පායන කාලෙට ඒකත් නෑ. ඒක ගැටළුවක්. අපේ යුතුකම ආපණශාලාවලට පිරිසිදු ජලය දීම. අපි නගරේ වතුර වලට ක්ලෝරින් දාලා හරි පිරිසිදු කර දෙන්න කටයුතු කරමු. බෝවන රෝග වැඩි නමුත් ආහාර සුරක්ෂා නොකලොත් බෝ නොවන රෝග වැඩි වෙයි. එකම බඳුනේ දාපු තෙල් ටිකෙන් රෝල්ස්, වඩේ කීපාරක් බදිනවද? ඒක නැති කරන්න. මේ තෙල් දින ගනන් තියාගෙන බදින්නේ. බෝ නොවන රෝග රැසකට මුල. ධම්ම දිසානායක ගරු ආණ්ඩුකාරතුමා ඉන්න කාලේ ආහාර සුරක්ෂිතතාවය වෙනුවෙන් පළාතට නීතියක් නිතිගත කලා. ඒක අපිටත් වලංගුයි. ඒ නීතියත් උපයෝගි කරගෙන අපි වැඩපිලිවෙලකට යමු. නගරයේ බිම දාගෙනත් එළවළු විකුනනවා. ඒවා වහිනකොට මඩ වතුර විසි වෙනවා. අපිරිසිදු වතුර. ඒ ගන්න එළවළුත් අපිරිසිදුයි. මේ බිම විකුනන අයට ක්‍රමවේදයක් හදලා අඩුම තට්ටුවක් වත් දෙමු. එහෙම කරන්න උපදෙස් දෙන්න. අපේ පනත අනුව නීතිය පෙන්නලා ඒ ආකල්ප වෙනසක් ඇති කරමු. අර ගොඩනැගිල්ලේ අපිරිසිදුකම ගැන ඒ මන්ත්‍රී තුමිය දිගින් දිගටම කියනවා. හැමදාම කතා වෙනවා. නතර වෙන්නේ කවදාද? නීතිය ක්‍රියාත්මක කරලා ඒ අපිරිසිදු කරන අයට නීතිය ක්‍රියාත්මක කරන්න. ක්‍රියාත්මක නොවෙන නීතිය පලක් නෑ. මහජන පරික්ෂක දැනුවත් කරන්න. අවශ්‍ය ක්‍රමවේද සකසන්න. අපි යෝජනාවක් අනුමතකලාම ඒක ක්‍රියාත්මක වෙන

ක්‍රමවේදය හදන්න. පොදු සැලැස්මක් හදලා ආයතන දැනුවත් කරලා සෞඛ්‍ය අංශ සහභාගිකරගෙන දැනුවත් කරන්න. නීතිය බලාත්මක කරන්න. එහෙම උනොත් සියයට පනහක් වත් අපිට අවශ්‍ය තත්වයට යන්න පුළුවන් වෙයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්. ජයරත්න මහතා</u>

කිරිඇල්ල නගරයේ වතුර හා වැසිකිලි ගැන නිතර අහනවා. කුරුවිට කඩවලත් නිතර විකුනන ආහාර ඒ අදාල උපකරනය තියෙද්දි අතින් අරන් දෙනවා. මමනම් කියනවා එහෙම කරන්න එපා කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා</u>

පරිසර කමිටුවේ සාමාජිකයෙක් ලෙස මේ දැක්වූ අදහස් අගය කරනවා. හැමදේටම ප්‍රශ්ණය ප්‍රමිතිකරණයක් නැති විමයි. මලඅපද්‍රව්‍ය, ජලගැටළු, කසල සියල්ලටම මේ ගැටළු. කුරුවිට නගරයට විතරක් නෙමෙයි. අනෙකුත් නගර වලටත් පොදුයි. උදාහරනයක් විධිහට හල්දොල ඇළ ව්‍යාපෘතිය පැතිබැම්ම. ජනතාව බනිනවා එතන ගෙවල්වල තියෙන අපද්‍රව්‍ය සේරම ඒ ඇළට හරවලා. එක් අයෙකුට රැෂ් හැදුනා. ඇළට බහින්න බැ. අපද්‍රව්‍ය. මේක ලොකු ව්‍යවසනයක්. ගොවිතැන් කරන්න බහින්නබෑ. වෙලට. අතීතයේ වක්කඩේ වතුර බිව්වා. ඉස්සර මුත්‍රා කරන්නේ නෑ. වතුරට .ඒවා සිරිත්. නමුත් දැන් වගාවක් කරන්න බෑ.ඒ වතුරෙන්. අපි මේවා ප්‍රමිතිකරනය කරමු. මගේ ක්ෂේත්‍රයේත් විවිධ ගැටළු. ප්‍රමිතිකරණය ගැන. වෙලදාමට තරු පන්තියක් දෙමු. තරු පහේ ඒවාට ජනතාව වැඩි වෙයි. අනිත් අයත් උත්සාහා කරයි. ප්‍රමිතියට යන්න. සමහර ආයතන වල ඉන්න සේවකයින්ට ආහාර නිෂ්පාදනය ඒ පිලිවෙල දැනුම නෑ. නමුත් ඒවාට ක්‍රම තියෙනවා. NVQ ලෙවල්. ඒවා වැදගත්. අපි ඒ අයව ඒවාට යොමු කරමු. නිවැරදි වෙයි. හොඳ ආහාර නිෂ්පාදනය කරන පිරිසක් බිහිවෙයි. මමත් පරිසර හිතකාමි පුද්ගලයෙක්. ආරම්භ කරලා ලබන වසර ඉවර වෙන්න පෙර මේ කටයුත්ත සාර්ථකව කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා</u>

කාලෝචිතයි. මට මතක්වෙන්නේ සුදුහකුරු කතාව. ආහාර සුරක්ෂිතතාවය පවත්වාගෙන යන්න අවශ්‍ය බලතල ඔබතුමාට මැයි 25 ජන්ද පෙට්ටියෙන් ලැබුනේ. බල ප්‍රෙද්ශයේ විවිධ ස්ථානවලින්, ව්‍යාපාරවලින් රිසිට් කඩලා මුදල් ගන්නවා. අදාල ගාස්තු වශයෙන් අයකරනවා. නමුත් ඒ ව්‍යාපාර හිමි අය දන්නේ නෑ කොන්දේසි, උපදෙස් මොකවත් නෑ. මුදල් අයකිරිමක් විතරයි වෙන්නේ. නමුත් බලපත්‍ර ක්‍රමවේදය වෙනස්. ඉල්ලුම්පත්‍රය පුරවලා, සභාවට දීලා නැවත සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිකාර්යාලයට ගිහිල්ලා මහජන සෞඛ්‍ය පරික්ෂක බලලා නිර්දේශ දීලා නීතිමය රාමුවක් තුල සිදුවන කටයුත්තක්. ඒ දේ නිසි ලෙස සිදු නොවන නිසයි මේ ගැටළු. 2026 වසරටවත් මේ දේ කරන්න නිවැරදිව. මුල්කාර්තුවේ හැකි වෙයි. යම් සාධාරණ කාල පරාස දීලා ව්‍යාපාරිකයාටත් අඩුපාඩු හදාගන්න පුළුවන් ලෙස ප්‍රකාශ අරන් යම්

සාධාරන විධිහට මේ කටයුත්ත කරන්න. 2027 වසර වෙනකොට ඒ විධිහට යම් ප්‍රමිතියක් අනුව මේ කඩ පිලිබඳව කටයුතු සාර්ථක කරගන්න හැකිවෙයි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මේ ගරු මන්ත්‍රීතුමන්ලා විවිධ අදහස් දැක්වුවා. මේ අදහස් පලදැරිය යුතුයි. ක්‍රයාවලියක් තුලින් මේ කටයුතු සාර්ථක කරගමු. අපේ පණත අනුව යම් නිස්චිත ක්‍රමවේදයක් දක්වලා තියෙනවා. ආහාර පනත තියෙනවා. අපි සුන්දර කුරුවිට හදමු කිව්වාට අනුමත කලාට තාම ඒක සිදු උනේ නෑ. ඒවා ක්‍රියාත්මක විය යුතුයි. අවධාරණය කරනවා. මාස 6 ක් තුල මේ ක්‍රියාවට නංවන්න. මධ්‍යම පරිසර අධිකාරිය, වාරිමාර්ග ආදී අවශ්‍ය අංශ එකතු කරගෙන මේ යෝජනා ක්‍රියාත්මක කරවන්න. මාස තුනක් ගිහිල්ලත් මේ නගරේ වැඩේට මොකද උනේ? ප්‍රනීත ආහාරවේලක් දෙන්න හැකි ව්‍යාපාරික ස්ථාන හැදීම වැදගත්.මහජන සෞඛ්‍ය පරික්ෂක මේ කටයුත්තට දායක විය යුතුයි. කඩ පිටුපස්සෙන් යන සේරම යන්නේ ගඟට නම් ඒක මහජන සෞඛ්‍ය පරික්ෂක බලන්න ඕනි. අනිත් නිලධාරින් සහාය වෙන්න ඕනි. පසු විපරම් ඕනි. හුදෙක් ලියකියවිලි වලට සීමා වෙන්නේ නැතිව මේ කටයුත්ත ලබන සභාවට පෙර කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>

මහජන සෞඛ්‍ය පරික්ෂකට , සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලයට, අදාල බලතල දුන්නේ ඒ පිලිබඳව ක්‍රියාත්මක වීමටයි. ඒ අයට ඒ කටයුතු වලට ගෙවීම් ආදිය සිදු කරනවා. ආහාර සාම්පල් පරික්ෂාවට ගෙවනවා. ඒ අය ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්නේ නැද්ද? කඩ දානකොට අයදුම්පත්‍රය පිලිබඳව ඒ තොරතුරු මහජන සෞඛ්‍ය පරික්ෂක බලනවා. සිවිලිමේ සිට බලනවා. සරල වෙන්නත් ඕනි ක්‍රමවේදය. ඇත්තටම මේ ප්‍රෙන්ච් එකේ තත්වය ගන්න බැරිවෙයි මුණියන්ඩිගේ කඩේට. වඩේ එක රු. 5 ට දෙන්නේ නෑ ප්‍රෙන්ච් එකේ. එන්. වී.කිව් ලෙවල් ඒ කඩේට ගන්න අමාරු වෙයි. නමුත් යම් තත්වයකට ගන්න හැකි වෙයි. මහජන සෞඛ්‍ය පරික්ෂකට , සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය එකතු කරගෙන මේ කටයුත්ත සාර්ථක කරගමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා</u>

මේ කටයුතු වල බලධාරියා සභාව. කුරුවිට ජල ව්‍යාපෘතිය අසමත්. කිරිඇල්ලේ වතුර වල අසූචි. වතුර හරියට පිරිසිදුව දෙන්න බැරිව ආහාර සුරක්ෂිතතාවය කතා කරලා වැඩක් නෑ. මහජන සෞඛ්‍ය පරික්ෂක කිරිඇල්ලේ කඩ බලනවා. උපදෙස් දෙනවා. මේ ගැටළුව ජාතික ප්‍රශ්නයක් වෙලා. විදේශ වල තහනම් කළ දේවල් අපේ රටේ තාමත් භාවිතා වෙනවා. පිලිකා රෝහලේ මේ ගැන දැනුවත් කරනවා. පැකට් ආහාර, නූල්ඩ්ලස්, ආදිය මේ රට තුල ජනතාව පැකට් කල ආහාරවලට හුරු කරලා. මව්වරු ළමයින්ට ක්ෂණික ආහාර දීම සාමාන්‍ය බවට පත් වෙලා. මත්ද්‍රව්‍ය උවදුරත් එහෙමයි. මේවාට ජාතික වැඩපිලිවෙලක් ඕනි. මේ සියල්ල ගැන ප්‍රසිද්ධියේ කතා කල මහජන සෞඛ්‍ය පරික්ෂකවරයෙක්ව අහරහස් ලෙස මැරිලා. පිලිකා රෝහලේ දේවල් දැක්කාම ඇත්තටම සංවේදී වෙනවා. මේවා කුරුවිටටත් වෙයි. මේවා ගැන

කතා කරන වෛද්‍යවරු පවා සාතනය වෙනවා. අපි මේ ප්‍රශනය පිලිබඳව රජය දැනුවත් කරමු. පැකට් කල ආහාර විශේෂයෙන්. වෙළඳ උපක්‍රම බහුලයි. ඇතැම් නිෂ්පාදන මිලදී ගත්තාම පැකට්කල ආහාරයක් නිකම් ලැබෙනවා. ලංකාවේ නිෂ්පාදනත් නෙමෙයි. අයිස් මත්ද්‍රව්‍ය උවදුර පැලියගොඩ නිකම් සොම්බි වගේ. ඇතැම් පාසැල් වල උදේ ආහාරය නොමිලේ දුන්නාට එකම කොප්පේ කීම දෙන්නේ. ඒවා සෞඛයට අහිතකරයි. ලෙඩ රෝග පැතිරී යා හැකියි. පාසැල් ආහාරවලටත් ප්‍රමිතියක් ඕනි. ඒදෙන ක්‍රමය සෞඛ්‍ය හිතකර නෑ. මහජන සෞඛ්‍ය පරික්ෂක, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කැඳවලා කමිටුවක් හදලා මේවාටත් උපදෙස් ගන්න අරන් ක්‍රියාත්මක කරන්න. කිරිඇල්ලේ වතුරවල අසූචි නම් ආහාර සුරක්ෂිත ගැන කතා කරලා වැඩක් නෑ. පානීය ජලය හරියට පිරිසිදුව දෙන්න. මේ ප්‍රශ්නය දිගටම කතා කල එනන්. මිනිස්සු ගහන්න එනවා. අවුරුදු ගානක් ගත උනත් පිරිසිදු වතුර ටිකක් ජනතාවට දෙන්න බැරි උනා. ඒ වගෙමයි ඇතැම් කඩවල දින ගනන් එකම තෙලෙන් කෑම බදිනවා. කැරපොත්තෝ, හූනෝ තෙල් තාච්චියේ. කිසිම වගකිමක් නැතිව ජනතාවට මේවා කවන්නේ. මේ වතුර ප්‍රශ්නය විසඳලා ඉදිරි කටයුතු කරන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

පනතින් අපට තියෙන බලතල අනුව ඒ කටයුතු ක්‍රියාත්මක කරන්නයි යෝජනා කලේ. නීතිය තිබුනත් අපිට ක්‍රියාත්මක කරන්න යම් වැඩපිලිවෙලක් ඕනි. මහජන සෞඛ්‍ය පරික්ෂක එක්ක කතා කලා. ඔබතුමන්ලා එක්කත් කතා කරන්න අවශ්‍යයි. අදහස් ගන්න ඕනි. පහසුකම්, වතුර තිබුනත් ජනතාවට මේගැන අවබෝධ නැත්නම් පලක් නෑ. උදාහරනයක් ලෙස තේ වගාව ආශ්‍රිතව වල්නාශක යෙදීම. වල්නාශක යොදලා දළු කැඩීම තෙක් නිශ්චිත කාලයක් තියෙනවා. නමුත් මේ කාල සීමාව ඉක්මයන්න පෙර මිනිස්සු දළු කඩනවා. වල් නාශක නිසා මිනිසාට සිදුවන හානිය විශාලයි. සමහර දේට මුදල් ඕනි නෑ. දැනුවත් විමයි ඕනි.
වතුර ප්‍රශනය වැදගත්. ඒ ගැටළුව කඩිනමින් විසඳෙයි. විසල් ජල ක්‍රමය තුලින් මේවන විට ඒ කටයුතු කඩිනම් කෙරෙනවා. අපි මහජන සෞඛ්‍ය පරික්ෂක, සෞඛය කාර්යාලය එක්ක එකතු වෙලා මේ කටයුතු මෙහෙයුමක් ලෙස කරමු. කඩ, ජංගම වෙළඳාම, අදාල කරගමු. සමහර කඩවල අර අඩුව තියෙද්දි අතින් දෙනවා ආහාර. පිරිසිදු කම, ඇඳුම, හිස්වැස්ම පැලදිම ට මුදල් යන්නේ නෑ.සමහර බනිස් වල මුදු. අත්වලපිරිසිදු කම වැදගත් ආහාර සම්බන්ධව කටයුතු කිරීමේදී. සරලව මේවා දැනුවත් කල හැකියි. කුරුවිට කිරිඇල්ල නගර දැනුවත් කරලා ඒවෙළඳ ප්‍රධානින් හා සේවකයින් දැනුවත් කරමු. යටිතල පහසුකම් , ඒ කඩවල තත්වය යම් ප්‍රගතියකට ගන්න කාලයක් යයි. ඉදිරි වසරතුල පලමු පියවර තියමු. මේ සතිය තුල අපි මේ ගැන ඉදිරි කටයුතු ආරම්භ කරනවා. බල සීමාව තුල ජනතාවට පිරිසුදු ආහාර මිළදී ගන්න පුළුවන් , නිරෝගීමත් ජනතාවක් සිටින පුරවරක් බවට පත්කරමු.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින ආහාර සැකසුම් හා අලෙවිකරණ ස්ථාන වල ආහාර සුරක්ෂිත ක්‍රමවේදයන් ඉහල නැංවීම අරමුණුකොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සමඟ එක්ව සුදුසු ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06- 03.** **කරපිංච බුබුලදෙණිය කනත්තපාරේ කොටසක් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්. ධර්මසිරි මහතා</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>**
**මේ අවස්ථාවේ යම් අදහස් දැක්විමක් සිදු කල යුතුයි. මම මේ සභාවේ අඛන්ඩව වසර 34 පමන හිටියා. 1991 සිටම. සංවර්ධන යෝජනා පිලිබඳව මෙම සභාවේ යෝජනා කිරීමේදි ඒම යෝජනා ක්‍රියාත්මක විය යුතුයි. ඒවාට මුදල් කොහෙන්ද? මුදල් ලැබෙන ආකාරයට කරමු, ප්‍රතිපාදන ලැබෙන අයුරින් ,වගේ උත්තර තියෙනවා සභාපතිතුමා කියපුවා සභා වාර්තාවේ. ගමට යමක් කිරිම සියළු මන්ත්‍රි වරුන්ගේ අභිමතය. සභාවේ සංවර්ධන යෝජනා වලට වැයශිර්ෂ මාරු කරලා ඔබතුමා. සභා පනතේ 170 වගන්තිය අනුව කල හැකියි. නමුත් එය මහා සභාවේ සම්මත විය යුතුයි. වැය ශීර්ෂ මාරු කිරිම නීත්‍යානුකූල වීමට නම් මහා සභාවේ අනුමැතියක් ගත යුතුයි. මල්කැකුළ සභාපතිතුමත් ගිය වරත් සභාව දැනුවත් කරලා තමයි වැයශීර්ෂ මාරු කලේ. මීට පෙර හිටිය සියළු සභාපතිවරුත් එහෙම තමා කලේ. ව්‍යාපෘති 60 ක් විතර ගිවිසුම්ගත වෙලා. ආණ්ඩුකාර අනුමැතිය අරන්ලු. නමුත්. දැන් සභාව පවතින්නේ. එක්කෝටි හතලිස් නම ලක්ෂෙක පමන ගිවිසුම්ගත වෙලා. පසුගිය 2025.09.16 මහා සභාවේ යෝජනා අංක 06-19 යටතේ සභාවේ සියළු මන්ත්‍රි වරුන්ට සමානව ප්‍රතිපාදන දෙනවා කියලා සභා සම්මත උනා. තීරණය ඒක උනත් මේ විධිහට ක්‍රියාත්මක වීම සුදුසු නෑ. මේවාට විරුද්ධව හඬ නගපු අය නිශ්ශබ්ද වෙලා. නයනා මන්ත්‍රි තුමිය, උපසභාපතිතුමා, ප්‍රගතිශීලි ජන්දදායකයෙක් කියලා විරුද්ධ කඳවුරක ඉඳගෙන කියන කියන දේ කරනවද? අනුමත කරනවද? දැන් නිශ්ශබ්දව. ඔබතුමාත් ඒ කාණ්ඩේ ම ඉන්න. කණගාටුව පළකරනවා. මම කියන්නේ ඒ වැයශීර්ෂ නිසිපරිදි මාරුකරලා මන්ත්‍රිවරයාගේ නමත් දාන්න. සම්ප්‍රදාය අනුව.**

ගොඩක් ඒවා අනුමත වෙන්නේ මන්ත්‍රී වරයාගේ නම නැතිව. ඊට පස්සේ අවසන් බිල එනවා. මේ වැය මාරුව සභා අනුමැතිය නැතිව බෑ. ඒ වැය ශීර්ෂ මාරුව පිලිබඳව බෙදීමක් ඉල්ලනවා.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

මහා සභා අනුමැතිය නැතිව වැයශීර්ෂ මාරු කරන්න බෑ.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා
ඒකට අපි යෝජනාවක් දානවා.
ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

170 වගන්තිය අනුව එය කල හැකියි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා
ඒක බලාත්මක වෙන්නේ රීති මගින්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -
_මේක නොමනා ක්‍රමයක්. අධිභාර වෙන්නත් පුළුවන්. ඔබතුමාලට බලය තියෙනවා. නමුත් අපිට අධිභාර වලින් නිදහස් වෙන්න ඕනි. රීතිය අනුව සභාවේ සම්මිත වෙන්න ඕනි. මන්ත්‍රිගේ ගමන් වියදම රීති අනුව. නමුත් මේකට ඒවා අදාළ නෑ? ඒ නිසා සභාවේ බලතල හරි විධිහට භාවිතා නොකිරිමත් වරදක්. යම් පරික්ෂා කිරිමකදි නොමනා පාලනයක් තිබුනොත්, මේක බහුතර බලයක් තියෙන සභාවක් නෙමෙයි. ගියවර මල්කැකුළ සභාපතිතුමා සභා අනුමැතිය ඇතිවයි වැයශීර්ෂ මාරු කලේ. අපි කොන්ත්‍රාත් කාරයෝ නෙමේ. නීතිය අනුව කටයුතු කරන්න. මම මේ සම්බන්ධව විරෝධය පල කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

කරපිංච බුබුළදෙනිය මාර්ගය අනුමත කරන්න බෑ. මංගල මන්ත්‍රිතුමා වැයශීර්ෂ මාරුව ගැන කතා කලා. සභාපතිතුමා කියනවා 170 අනුව සභාපති බලතල අනුව මාරු කලා කියලා. නමුත් ඉදිරියට වගන්ති 184 තියෙනවා රීති අනුව මේ කටයුත්තට සභා අනුමැතිය අවශ්‍ය බව. සියළු මන්ත්‍රී වරු හැමදාම යෝජනා දානවා. නමුත් කරන්න බෑ. නිතර කරන ඒවායේ මන්ත්‍රී නමක් වත් නෑ. ගලුකාගම එකක් කරනවා. ඒක යෝජනාව කාගෙද? මැණික් බහුල පැත්තක්. ඊයේ රෑත් ඉල්ලං ගැරුවා. 45 ක් ඉන්නවා. කව්ද මේක කරන්නේ. ඒ නිසා යෝජනාව දානකොට අදාල මන්ත්‍රීගේ නම දාන්න. ගලුකාගම කිව්වම මගේ නමත් යයි. මම කරන්නේ කියයි. පුද්ගලිකව මගේ තරහක් නෑ. වැඩ කරන අයයි ගරන්නේ. වෙනම දාගෙන ගරනවා. ඒ නිසා අදාල මන්ත්‍රී වරයාගේ නම් යෙදිම වැදගත්. හැමෝටම ප්‍රතිපාදන දෙනවා කියලා තීන්දු කලාට එහෙම දුන්නේ නෑ. එක වීදි පහනක් දැම්මේ නෑ. ඉතා අත්‍යවශ්‍ය කරුණක් නිසා ප්‍රභූවරයෙක්

වීදිපහනක් දාලා දෙන්න කිව්වා. කීප වතාවක් උත්සාහා කලත් විවිධ හේතු නිසා ඒ කටයුත්ත උනේ නෑ. විදිපහන දීලත් හයි කරවාගන්න බැරි උනා. රියදුරුට එක එක වැඩ කිව්වා. ක්‍රි රෝද රථය ස්ටාට් වෙන්නේ නෑ. කිව්වා විවිධ හේතු. අද වනතුරුත් සවි කලේ නෑ. විශාල මුදල් ප්‍රමාණ වාහන වෙනුවෙන්, රෙපෙයාර් වෙනුවෙන් සභාව වැය කරන්නේ. නමුත් හදිසියකට වාහනයක් නෑ. ඒවා කැඩිලා. වැය මාරු කරලා මොකද කලේ. විහිළුවක් වෙලා. හිතවත් මන්ත්‍රිලට විතරක් සංතෝෂම් දීලා බෑ. මේකේ විවිධ වැදගත් පිරිසක් ඉන්නවා. රණවිරුවෝත ඉන්නවා. ඒ අයට ස්වාධීනව ඉන්න වෙලා. මේ ප්‍රතිපාදන ඒ අයට ලැබෙන්නේ නෑ. කීප දෙනෙකුට නැතිව ඒ 26 ටවත් සාධාරණව ප්‍රතිපාදන දෙන්න. ගිවිසුම් අත්සන් කරලා වැඩෙත් කලාට පස්සේ වාර්තාවට දානවා. ගියවර සභාවෙන් වීදිලාම්පුවක් හරි දැම්මා. සභාපති නමින් යෝජනා කරලා මගේ නමින් සවි කලා. දමිළ මන්ත්‍රි වරයෙක් ඉන්නවා. ජනතාවක් වෙනුවෙන් ඉල්ලීම් කරනවා. ආණ්ඩු පක්ෂේ අයටත් වඩා පිටින් ආපු මන්ත්‍රිලට සලකනවා. උපසභාපති නිශ්ශබ්දයි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා -</u>

යෝජනාව වෙනත් එකක්. කතාකරන්නේ වෙනත් දෙයක්.

<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී   දේවින්ද කුමාර මහතා -</u>

මේ සියල්ල අදාලයි. වාර්තා කරන්න. මංගල මන්ත්‍රිවරයාවට ඒ බව නොකියා මට පමනක් කියනවා. උප සභාපතිතුමා එදා ගත්තේ දේශපාලන තීන්දුවක් කිව්වා. අද නිශ්ශබ්දව ඉන්නේ පක්ෂය වෙනුවෙන් කතා කරන්නද? පනත අනුවයි අපි කතාකලේ. අපි ආවෙත් මහජන ජන්දයෙන්. කරුණාකර අපිව මේ වැයශීර්ෂ මාරුවෙන් නිදහස් කරන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා -</u>

මාතෘකාවට අදාලව කතා කරන්න. නැතිනම් ඉඳගන්න. යෝජනාවට කිසිදු සම්බන්ධයක් නෑ.

මේ අවස්ථාවේ මහා සභාවේ ගෝෂාව  පැවතිණි.

<u>ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී   මහින්ද ජයලාල් මහතා -</u>

අපි 20 නම් කලකිරිලා නෑ. කිසිදු හේතුවකට. දේවින්ද මන්ත්‍රි වරයා වෙන අදහසක් ගෙනාවේ. අපිට ගැටළුවක් නෑ. සභාවේ කටයුතු කරගෙන යන්න වැය මාරු කිරිමත් අවශ්‍යයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -
නිලධාරීන් සභාපතිතුමාව නොමග අරිනවාද? නමුත් අපි ඔබතුමා සමග සිටිනවා. යම් වැරැද්දක් වෙන්න යනවා නම් අදාල නිලධාරීන් එය පෙන්වා දිය යුතුයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -

අපි පසුගිය සභාවකදි වැයශීර්ෂ මාරුවකට එරෙහිව ඡන්දය දීලා පරාජය කලා. එදා විපක්ෂෙ හිටියේ. අද මම පක්ෂයට සහාය වෙන මන්ත්‍රිවරියක ලෙස වැය මාරුකරලා මටත් ප්‍රතිපාදන දෙයි. ඒ මුදල අරගෙන මට අධිභාර වලට එන්න බෑ. ගිය වරත් අධිභාර ගෙව්වා. මම කැමතියි 46 වම ප්‍රතිපාදන දෙනවාට. විපක්ෂේ ඉන්න මන්ත්‍රි වරුන්ගේ අපහසුතාවය මමත් විඳලා තියෙනවා. මංගල මන්ත්‍රිවරයා මගේ විරුද්ධවාදියා වගේම අසල්වැසියා. පනත පිලිබඳව උනන්දුවෙන් වගේම දැනුමක් තියෙනවා. ඔහු පෙන්වාදුන්නා වැයශීර්ෂ මාරුව පිලිබඳව. වැයමාරුව නීත්‍යානුකූලව කරන්න. අධිභාරවෙන්න නම් කටයුතු කලයුතු නෑ. මුදල් ගත්තා නොගත්තා ගෙවන්න වෙයි. ඒ නිසා වැයමාරුව නීතිය අනුව කරන්න. ගරු සභාපතිතුමාට අපි ඡන්දය දුන්නා. ඒ සභාපතිවෙන්න. නමුත් වැරදි දෙයක් වෙන්න යනවානම් එය වලක්වාගන්න ඕනි. මම කියා සිටිනවා වැය මාරුව නීතිය අනුව නිවැරදිව කරන්න.
ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

සභාපතිවරයාට පුළුවන් අභිමතය පරිදි සංවර්ධන යෝජනා ගේන්න. මුදල්වෙන්කරන්න වගේම දෙන්නත් පුළුවන්. සමහර කාරණා වලදි ක්‍රමවේද තියෙනවා. පරිපූරකෙයි වැයමාරුවයි පටලවාගෙන. මේක දෙකක්. සභාවට දාන්න ඕනි පිලිගන්න. එල්ලාවල මමයි වූලා මන්ත්‍රිතුමියය වැඩක් කලොත් හංගන්න දෙයක් නෑ. කාටවත් තහංචි දාන්නත් බෑ. නමුත් තවම එහෙම දෙයක් කරලා නෑ. න්‍යායපත්‍රයේත් නැතිදෙයක් ගැන කතාකරන්න බෑ. යම් කටයුත්තක අවසාන තීරකයා මහා සභාව. මහා සභාව දැනුවත් නොවී බෑ. විකසිත සභාපතිතුමාට එහෙම ඕනි නෑ. වැයමාරු ක්‍රමවේදය නීත්‍යානුකූලව කරන්න පුළුවන්. ඒකට මහා සභා අනුමැතිය ඕනි නෑ. නමුත් වැයමාරු කරලා ඒ ක්‍රියාදාමය සභාවට දාන්න ඕනි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -
එහෙම කළාද?

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
ක්‍රමවේදය කිව්වේ.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

පිරිසකට විතරක් නෙවෙයි. අපි හැමෝටම සාධාරණ මුදලක් දෙනවා. නමුත් ඒක විශාල මුදලක් දෙන්න හැකියාවක් නෑ. අපිට ප්‍රතිපාදන ලැබෙන විධිටයි දෙන්න වෙන්නේ. වැයශීර්ෂ මාරු කිරීමේ ක්‍රියාවලියටත් යනවා. සාධාරන ලෙස දෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

නිලධාරී කිව්වා වැයශීර්ෂ මාරු කලා කියලා. ගිවිසුම අත්සන් කලා කියලා. මේ කටයුත්ත ගැන බෙදීමක් ඉල්ලනවා. උත්තර දෙන්න වැටශීර්ෂ මාරු කලාද?

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

අපි ඒ සම්බන්ධව සාකච්චා කලා. ඉදිරියේ කටයුතු කරනවා. යෝජනාවලට ඇස්තමේන්තු සකස් කරනවා. ගිවිසුම් අත්සන් කරලා තියෙන්නේ වෙනත් ඇස්තමේන්තු සඳහායි.

මෙම අදහස් දැක්වීම තවදුරටත් දීර්ඝ ලෙස පැවතිණි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව කරපිංච බුබුලදෙණිය කනත්තපාරේ කොටසක් සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා විසින් කරනු ලබන යෝජනා -
ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

**06-04** . ඉඩංගොඩ නාරංගස්හේන මාර්ගයේ දුෂ්කර ස්ථාන ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි ඉනෝකා මල්ලවආරච්චි මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

මේ මාර්ගය ඉතාමත් දුෂ්කරයි. කඩතොළු තියෙනවා. බඳුවලකන්ද මායිම හා ජනාවාස මායිම ප්‍රතිසංස්කරනය කිරිමට ඉතාමත් අවශ්‍ය ස්ථාන. ජයරත්න මන්ත්‍රි තුමාත් ඉනෝකා මන්ත්‍රි තුමියත් මේතැන් දන්වා. ඒ මාර්ග බාවිතා කරනවා. මේ කටයුත්ත කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ඩබ්.ජයරත්න මහතා -

2026 සංවර්ධන යෝජනා වලට ඉදිරිපත්කලා. මේ කටයුත්ත.කාණු අවහිර වෙලා දැනටත් ඒ මාර්ගයේ නවතුර ගලනවා. වාහනයක් යන්න අමාරුයි. පයින් යන්න බෑ. ප්‍රජා ජල වතුර පයිප්ප කැඩිලා. ඒවාත් හදන්න ඕනි. සහාය දෙන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
ප්‍රතිපාදන ලැබෙන ආකාරයෙන් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ යෝජනාව අනුව ඉඩංගොඩ නාරංගස්හේන මාර්ගයේ දුෂ්කර ස්ථාන ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

06-05. කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් නගර සංවර්ධනය සඳහා ඉවත්කරනු ලැබූ වෙළඳ ස්ථාන වෙනුවට මෙතෙක් සාධාරනය ඉටු නොවූ අයට කුරුවිට නගරයේ වෙළඳ කටයුතු සඳහා සුදුසු ස්ථාන ලබාදීම සඳහා එම කටයුතු වලට අදාලව පියවර ගන්නා ලෙසට යෝජනා කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.වී එස්. සම්පත් බොතේජු මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -
2008, 2009 වර්ෂ වල මේ කුරුවිට නගර සංවර්ධන කටයුතු ආරම්භ කල කාලයේ මම මේ සභාවේ ධූරදාරියෙක්. අද මෙතන ඉන්න හිටපු සභාපතිතුමා, මංගල ඩයස් මන්ත්‍රීතුමා, විජේසිරි මන්ත්‍රීතුමා, කැළුම් මන්ත්‍රී තුමා, සම්පත් බොතේජු මන්ත්‍රී තුමා, ඒ කාලෙත් සභාවේ හිටියා. සලිත සභාපතිතුමා හිටියා. අපි මේ නගරේ තත්වය උසස් තත්වයට ගන්න , යම්තාක් දැන් පවතින තත්වයට ගන්න හැකි විදිහට දායක උනා. සාමුහිකව වැඩ කලා. ඒවාට සමහර රජයේ ආයතන බලපෑම් කලා. ඒකාලේ හිටිය නිලධාරින් දිවා රෑ නොබලා කැප උනා. නගරය අදද තත්වයෙන් තැබීමට වැඩ කලා. 2019 දි මල්කැකුළ සභාපතිතුමා අවස්ථා දෙකකදි මේ කටයුතු වලට ඉදිරි පියවර තිබ්බා. ඒ අතරේ මේ නගරේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යම් ඉදිකිරිම්, කඩ, ඉවත් කරනකොට යම් අයට තමන්ගේ වෙළඳ ස්ථාන අහිමි උනා. සමහරු ඒ කඩවලින් ඉවත් උනේ කැමැත්තෙන්. නගර සංවර්ධනය වෙනුවෙන්. බොහෝ අයට යම් සහන දුන්නා. නමුත් සමහර අයට ඒ සහන ලැබිලා නෑ. ඒ නිසා සමහරු අධිකරණ ක්‍රියාදාමයට ගියා. ඒවායින් අපි ජයත් ගත්තා. ඒත් පසුව ඒ නෙරපීම් නියෝග ක්‍රියාවට නගලා නෑ. මහජන නියෝජිතයින් නැති කාලේ යම් යම් කටයුතු වෙලා. තමන්ගේ කඩ නගර සංවර්ධනයට පරිත්‍යාග කරපු අයගේ

මහජන ඉල්ලීම් ගැන සලකලා බලලත් නෑ. අපේ යුතුකම නගරය වෙනුවෙන් පරිත්‍යාගයන් කල ජනතාවගේ පක්ෂය, පාට, නොබලා වගකීම්, යුතුකම් ඉටු කිරීම. මේ සියල්ලෝම කුරුවිට නගරේ මිනිස්සු. වටප්පිටිය, එල්ලාවල අය නෙමේ. අද දින න්‍යාය පත්‍රයේත් තියෙනවා මේ නගරේ කඩ සම්බන්ධ කමිටුවක් පිහිටුවීම ගැන. ඒ පත්කරනවා වගේම ඉදිරි කටයුතු කරන්න. ලීලාරත්න කුරුප්පු ආරච්චි මහත්තයා නගරේ හිටිය වෙළෙන්දෙක්. එතුමා ගේ කඩ පහක් ඉවත් කලා නගර සංවර්ධනය වෙනුවෙන්. තාවකාලික එක් කඩයක් පමනක් දීලා. එතුමා මේ කටයුත්තට සහාය දුන්නා. පළාත් පාලන කොමසාරිස්ගේ අවසරඅරන් කටයුතු කලත් ලිඛිතව තිබුනත් කඩය දුන්නේ නෑ. යම් පරිත්‍යාගයක් කලාම අහලා දෙන්න ඕනි. නමුත් යුතුකම සිදුඋනේ නෑ. දැන් එතුමා ජීවතුන් අතර නෑ. එතුමා වෙනුවෙන් මම කරුණු කිව්වේ. එතුමාත් සමග මගේ දේශපාලන සබඳතා නෑ. ඒ වගේම මහින්ද උඩුගොඩ මහත්තය, කුරුං මුදලාලි ඒ දෙන්නටත් අසාධාරණ උනේ. උඩුගොඩ මහත්තයා ජීවතුන් අතර නෑ. සභා තීරණ අනුව මේ අයට නගරේ සුදුසු ව්‍යාපාරික ස්ථාන දෙන්න. මාව පුද්ගලිකව දන්න මන්ත්‍රීවරු මේ සභාවේ ඉන්නවා. මට මේ නගරේ කිසිදු කඩයක් අනවශ්‍යයි. මගේ පරම්පරාව සතුව කඩ කාමර අවිස්සාවේල්ල සිට රත්නපුර දක්වාම කඩ තියෙනවා. මම ඉඩංගොඩ මගේ කඩ බෙදලා දුන්න කෙනෙක් . එවැනි කටයුතු කල මට පුද්ගලිකව මේ අඩි 10,12 කඩයක් ගන්න තරමට පහත් තත්වෙක මම නෑ. ලීලාරත්න කුරුප්පු මහතාගේ බිරිඳ කුමුදුනී හේරත් මිය විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම් ලිපිය මම සභාගත කරනවා. ලීලාරත්න කුරුප්පු ආරච්චි මහත්තයාගේ ඉල්ලීම මේ යෝජනාව යටතේ විශේෂයෙන් සලකා කටයුතු කරන්න. ඔහුට අහිමි වූ වෙළඳ ස්ථානය වෙනුවට අප සභාව සතු දෙල්ගහඕවිට ඉඩමේ දැනට කඩකාමර ඉදිකර ඇති ස්ථානයේ අඩි 20 ක ප්‍රමාණයක් ඔහුගේ බිරිඳ වන කුමුදුනී හේරත් මියට ලබාදෙමු. මට අවශ්‍ය මේ නගරයේ ව්‍යාපාරික ස්ථාන අහිමිවීම් සිදු උන අයට සාධාරනය ඉටු කරන්න පමනයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

කුරුප්පු මහතා නගරේ හිටිය ධනවතෙක්. කඩවල් ගානක හිමිකාරයෙක්. නගර සංවර්ධනයේදී කඩ කඩා ඉවත් කලා. එතුමා ඉතාමත් වෙහෙසක් අරන් උත්සහා කලා ඒ කඩපුවා වෙනුවට සාධාරනයක් කරගන්න. මටත් කුලරත්න මන්ත්‍රීතුමාටත් බැන්නා නගරයේදී. අවසාන කාලේ ළමයි රටවල් වල. එතුමාගේ ආර්ථිකයත් දුෂ්කර උනා. තමන්ගේ ම ශක්තිමත්ව තිබුණ ආර්ථිකයත් අහිමිව තමා එතුමා අවසාන කාලේ හිටියේ. තාවකාලික එක කඩයක් එතුමට දීලා තිබුනා. කුරුං මුදලාලිටත් එහෙමයි. එක කඩයක් දුන්නට එතුමාගේ තිබුන කඩය ඉතාමත් හොඳ ස්ථානයේ තිබුන දියුණු වෙළඳාමක් තිබුන කෙනෙක්. නමුත් එතුමාගේ ව්‍යාපාරය හාඩ් වෙයා එකට සභාවෙන් දුන්න ස්ථානයේ නොගැලපීම්, බාධා තිබුණා. වෙන අයගේ නම් දාලා නගරයේ වෙළඳාමට හිතකර තැන් දීලත් තිබුණා. කඩ අපෙන් අරන් විකුණපු අයත් ඉන්නවා. මමත් මැදිහත් වෙලා එහෙම කඩයක් අරන් දීපු අසරණ කෙනෙක් පසුව ඒකත් විකුණලා. සමහරු දෙන තැන හොඳ නෑ කිව්වා. වෙන තැන් ඕනි කියලත් ගැටළු තිබුණා. කොහොම නමුත් දැන් මේ අය, ඒ පවුල්වල අය අසරණ වෙලා. ව්‍යාපාරයට සුදුසු තැන් දීලා වගකීම යුතුකම ඉටු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

නගර සංවර්ධනයේදී කඩ ඉවත් කරන්න සිදු උනා. කඩ දීපු අය ඒ තැන්වලට නොගිහින් ගැටළුත් තිබුණා. උප සභාපතිතුමත් මේ ගැටළු විසඳන්න දිගින් දිගටම වෙහෙසුනා. නගරේ හිටි අයට අසාධාරණයක් නොවන විදිහට කටයුතු කරන්න. පළාත් සභාවේ ලිපි, නිර්දේශ , සභාවේ කඩ ලේඛණ පරික්ෂා කරලා සොයා බලා කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මේ ලීලාරත්න මහත්තයා පයිල් එකකුත් අරන් නිතර සභාවට ආවා. ගොඩක් උත්සාහා කලා .කඩ කාමර ලබා ගන්න. ඒත් බැරි උනා. නගරේ එහා පැත්තේ ලැයිම් තිබුණා. දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩමේ. නීලමණියි තාත්තයි හිටියේ. දුප්පත් පවුලක්. ඒ වත් සභාවෙන් ඉවත් කලා නගර සංවර්ධනයට. ඒ බිම කඩ වලට යොදාගත්තා. ඒ කඩ අහිමි අයට රේල්පාරෙන් ඉඩම් දුන්නත් නීලමණිට ලැබුනේ නෑ. දැන් නීලමණිට ඉන්න තැනක් නෑ. අසරණ උන පවුලක්. අද 06-80 යටතේ කමිටුවක් පත් කරලා මේ ගැටළු විසඳන්න. නගරේ ප්‍රශ්න ගනනක් තියෙනවා. සභාවට අවශ්‍ය පරිදි කටයුතු කරන්න තිබුනා නම් මේ ගැටළු අඩු වෙනවා. නමුත් පිටින් ආපු නිලධාරි විසිනුයි මේ කටයුතු මෙහෙයවූයේ. නගර නිර්මාණයේ සංකල්පත් ඒ අයගේ.ගොඩනැගිලිවලට වැසිකිලි ,වතුර නැතුව හැදුවා වගේ. පක්ෂ විපක්ෂ භේදයක් නැතුව කමිටුවක් හදලා මිනිස්සු කැඳවලා ගැටළු කතා කරලා විසඳමු. ඒ ගැටළු නිම කරමු. නැත්නම් වසර සිය ගානක් යයි මේ ගැටළු විසඳන්න. කෙටි කාලයක් තුල කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණි තනූජා දීපානි චන්දිකා මිය -

මමත් දන්වා මේ සම්බන්ධව. නගර සංවර්ධනය කිව්වාට ඇත්තටම සංවර්ධනය උනේ නෑ. ලීලාරත්න මහත්තයට කඩයක් දුන්නට ඒක ට වතුරත් නෑ. මොකවත් නෑ. අවසන් කාලේ අනිත් අයගෙන් යැපුනේ. ඒක විකුනන්නත් බෑනේ. නගර සංවර්ධනය කියලා ඉන්න ප්‍රජාව පන්නලා වැඩක් නෑ. නගරේ දැන් ඉන්නේ පිට අය. අර පරන තිබුන ව්‍යාපාර නැවතිලා. 2018 විතර ඉඳන් ඇදිලා එන ගැටළු. තව දුරටත් තියන්න එපා. ව්‍යාපාරිකයාට සහාය වෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා -

ජනතාවට දැනෙන යෝජනාවක්. මේ කරුන නිසා පීඩාවට පත් උන විශාල පිරිසක් ඉන්නවා. 2013- 2023 මම මේ කුරුවිට සේවය කරන කාලේ මටත් කියලා තියෙනවා. කුඩා ව්‍යාපාර කරපු මුස්ලිම්, සිංහල ජනතාවට කඩ දීමේදී කඩ ලැබුනේ නෑ කියලා. දැන් ඒ අය සමහරු පේමන්ට් එකේ එක එක ඒවා විකුනනවා. තවත් අය නිකම් ඉන්නවා. අසාධාරන උනා කියපු මුස්ලිම් මහත්තයෙක් ලිපියක් ඉදිරිපත් කලා. එරත්න පාරේ මස් කඩයක් කරලා සිල්ලර කඩ කරලා නගර සංවර්ධනයට අයින් උනාම නැවත කඩයක් දීලා නෑ. උප සභාපතිතුමා කිව්වා වගේ මේ පිඩාවට පත් උන ජනතාව වෙනුවෙන් සේවයක් කරමු. සහාය දීලා අගතියට පත් උන අයට සහනයක් දෙමු.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

අදහස් රැසක් දැක්වූවා. ආදායම් පරිපාලකගේ නිර්දේශ , කාර්මික නිලධාරි නිර්දේශ අරන් සියළු දත්ත අරන් මේ යුතු කම කරන්න ඕනි. මේ කාර්තුවේම සියළු තොරතුරු අරන් අර

කම්ටුවත් පත් කරගෙන කටයුතු කරමු. නගර සංවර්ධන කටයුතු වලටම කියලා කැබිනට් පත්‍රිකාවකින් අක්කර නමය හමාරක් සභාවට ලැබුණා. අපේ අය ලේසියට අර දුම්රිය දෙපාර්තමේන්තු බලපත්‍ර වලට කටයුතු කරන්නේ. අපිට දුන්න ලියවිල්ල අනුව නෙමේ. නාගරික සංවර්ධන අධිකාරිය එක්ක එකතු වෙලා කටයුතු කරමු. විවේකයේ නගරය ජීවමාන කරමු. යටිතල පහසුකම් වැඩි කරමු. අර අගතියට පත්උන පිරිසට පළාත් පාලන කොමසාරිස්ගේ නිර්දේශ , අවශ්‍ය තොරතුරු අරගෙන අනුව ඉදිරි කටයුතු කරමු.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

තවත් කඩ සම්බන්ධ ගැටළු රැසක් නිතර දැනුම් දෙනවා. ඒ අය පීඩාවට පත් උන පිරිස. ඒ නිසා විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරනවා. අපි බලාපොරොත්තු වෙනවා අද පත් කරන්න නියමිත කම්ටුව යටතේ තොරතුරු අරන් පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් අරන් අවශ්‍ය නිර්දේශ අනුව ඉදිරි කටයුතු කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතාගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව විසින් නගර සංවර්ධනය සඳහා ඉවත්කරනු ලැබූ වෙළඳ ස්ථාන වෙනුවට මෙතෙක්
සාධාරනය ඉටු නොවූ අයට කුරුවිට නගරයේ වෙළඳ කටයුතු සඳහා සුදුසු ස්ථාන ලබාදීමට හා ලීලාරත්න කුරුප්පු ආරච්චි මහතාට අයත්, නගර සංවර්ධනය සඳහා ඉවත්කරනු ලැබූ වෙළඳ ස්ථාන සම්බන්ධයෙන් සුදුසු ස්ථාන ලබාදී සාධාරණයක් ඉටුකිරිම සඳහා නීත්‍යානුකූලව ඉදිරි කටයුතු සිදු කිරීමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

**06-06.** කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රෙද්ශයේ මාතෘ සායන විධිමත් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් ලබාදෙන ලෙස යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

පුද්ගලයෙකුගේ උප්පත්තියේ සිට මරණය දක්වා සභාවට පැවරි කාර්යන් සහා පණතේ දක්වා තියෙනවා. ඒවා සභාවේ වගකීම්. මාතෘ සායන ඒවා අතර ප්‍රමුඛ තැනක් ගන්නවා. අපේ මාතාසායන සමහර ඒවාට පහසුකම් දිලා. සමහර ඒවාට පහසුකම් අඩුයි. වතු ආශ්‍රිත මාතා සායන වලට ඉතාමත් අඩු පහසුකම්. ඇත්තේම නෑ. වතුපාලන අභිමතය පරිදි සිදු වෙනවා. රජය මැදිහත් වෙන්නේ නෑ. නමුත් ඒවායේ උපදින්නේත් මිනිස්සු. මේ 2026 අයවැයෙන් හෝ මේ කාරණා වලට මුල් තැනක් දෙන්න. කිරිඇල්ල, කුරුවිට, ඔනැම් දිහාකින් තෝරාගෙන මේ කටයුතු කරමු. තලාවිටිය තියෙනවා පැරණි අම්බලමේ එකක්. අවුරුදු 130 ක් විතර පැරණි.

පහසුකම් ටිකක් තියෙනවා. සභාවට අයිත්. මාතා සායන ගැන වැඩලිපිවෙලක් යොදමු. යටිතල පහසුකම් දිමටත් පුළුවන්. ජලය, උපකරණ. ආදිය. 2026 අයවැයෙන් ප්‍රමුඛ තැනක් දෙමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -</u>

උප සභාපතිතුමාගේ යෝජනාව කාලෝචිතයි. මාතෘ සායන වල අපහසුතා අඩුපාඩු බහුලයි. අවධානය දෙන්න. පනතෙන් පැවරූ වගකීමක්. ඇල්ලගාව මාතෘ සායනය පලමු හා තෙවන සිකුරාදා දෙදින තියෙනවා. යටිපව්ව, ඇල්ලගාව, එපිටවෙල, මුණසිංහපුර මව්වරු 26 ක් පමන ඒ සායනයට එනවා. දරුවන්ට එන්නත් කටයුතු එතන සිදු වෙනවා. වෛද්‍ය පරික්ෂනයක් කරන්නවත් ඉඩ මදි. අනෙක් අය රජයේ සායන වලට යනවා. මිඩ්වයිජ්ලා කියනවා ඒ ස්ථානයට ප්‍රොජෙක්ටර් , ආදි අඩුපාඩු රැසක් තියෙනවා කියලා. තවත් සායන වල විවිධ අඩුපාඩු තියෙනවා. 2026 අයවැයෙන් හෝ මේ අඩුපාඩු හෝ ලබා දීමට කටයුතු කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. සිරිල් කරුණාරත්න මහතා -</u>

මාතෘ සායන ප්‍රශ්ණය මාටුවාගලටත් තියෙනවා. කලින් සායනය තිබුන තැනින් ඒ අයිතිකරුවන්ගේ ඉල්ලිම අනුව සායනය ඉවත් වුනා. දැන් අකුරන ජනපහසුකම් පදනමේ සමිති ශාලාවේ අඩු පහසුකම් මැද කරගෙන යන්නේ. තිරදාගෙන ඒ කටයුතු කරන්නේ. උපකරණ මීයෝ කාලා. පහලගම, මාටුවාගල වතුයාය ජනතාවත් එනවා. මම බිම් කඩක් දෙන්නම් ශාලාව හදන්න. මාටුවාගල වතුයායේ සායනය ට අයත් ඩිස්පෙන්සරියේ වහලෙත් කැඩිලා. අළුත්වැඩියා කර දෙන්න. පහසුකම් දෙන්න. ජනතාවට

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -</u>

කාන්තාවන් අපහසුතාවය පත්කරන්න යෝජනාවක් උප සභාපතිතුමා ගෙනල්ලා. මේ බලප්‍රෙද්ශයේ වැඩිම ඡන්දදායකයින් කතුන්. නමුත් ඡන්දය වැඩිපුර දෙන්නේ පිරිමින්ට. මන්ත්‍රිවරියෝ 11 ඉන්න තැන කාන්තාවෝ විධිහට අපි දාන්න ඕනි යෝජනාව පිරිමියෙක් දැම්මා. අපි මීට මාස තුනකට පෙර කමිටුවක් පිහිටෙව්වා කාන්තා කමිටුවක්. ඒක එක දවසක් වත් කැඳෙව්වේ නෑ. කාන්තා කමිටුවට කුඩම්මාගේ සැලකිලි. ළදරු පාසැල් ,ස්වයං රැකියා, සායන මේ හැම දෙයක්ගැනම වැඩ කරන්න හිටියත් මේ වන තුරු කමිටුව කැඳවලා නෑ. කාන්තා කමිටුවේ සභාපතිත් පිරිමියෙක්. 25% කාන්තා නියෝජනයක් අවශ්‍යයි. කාන්තාවන්ට අසමාන සැලකීමක් සිද්ධ වෙන්නේ. මේක දිගින් දිගට වෙන්න දෙන්න එපා. අපි 11 ක් ඉඳිද්දි පිරිමියෙක් මේ යෝජනාව ගෙනාව. ඇයි මේවා කතා කරන්න කාන්තා කමිටුව කැඳවන්නේ නැත්තේ? අඩුම ලබන වසරේවත් මේ කමිටුවේ සභාපතිකම කාන්තාවකට දීලා මේ කමිටුව කැඳවලා කටයුතු කරන්න. මම පුද්ගලිකව කුරුවිට සායනයට යනවා පෝෂණ වැඩසටහනට. උදේ 5 ට ගෙදරින් එන අම්මලාට හවස එක දෙක වනතුරු ආහාරයක් නෑ. මම මගේ සභා දිමනා එකතු කරලා ඒ මාතෘවරුන්ට කැඳ, සුප්, තේ දුන්නා. කුරුවිට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

කාර්යාලයේ තියෙන සායනයට. ඒකෙත් අඩුපාඩු තියෙනවා. වැසිකිලි ප්‍රමාණවත් නෑ. නඩුකාරදෙනි වගේම දේවින්ද මන්ත්‍රීතුමාගේ කොට්ඨාසේ මාතෘසායනයටත් මම ටයිල් ඇල්ලුවා. අපි කැමතියි මේ අඩුපාඩු සොයලා කලහැකි දෙයක් කරන්න. කමිටුව තිබ්බා නම් පිරිමි මේ යෝජනා දාන්න අවශ්‍ය වෙන්නෑ. උපසභාපතිතුමා මට කිව්වා මාව කාන්තා කමිටුවේ සභාපති කමට යෝජනා කරන්නම් කියලා. ඒකත් කලේ නෑ. මට අනවශ්‍යයි ඒවා .නමුත් මේ විධිහට ගියොත් ඔය කමිටුව ඔතනමයි. ඒ නිසා අනාගතයේ හරි මේ කමිටුවට කාන්තාවක් දාන්න. එතකොට කමිටුව යයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

පනතේ සඳහන් කමිටුවල සභාපති සභාවේ සභාපති විය යුතුයි. අනෙක් ඒවාට වෙන විදිහට පුළුවන්. කාන්තා කමිටුවේ සභාපති කාන්තාවක් වීම හොඳයි. මාතෘසායන විධිමත් කිරිම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීගෙත් වගකිමක්. නමුත් අඩුපාඩුත් තියෙනවා. අපේ දුප්පත් ජනතාව උදේ පාන්දර ගිහින් ඒවායේ නම් අඩගහනකොට දවල් එක දෙක වෙලා. මිනිස්සු පීඩාවට පත් වෙලා. හිටගෙන ඉදලා. ඒ නිසා උප සභාපතිතුමාගේ යෝජනාව වැදගත්. කලින් ගත්ත තීරන එක්ක කලවං කරගන්නේ නැතිව වැඩ කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

නාපාවල, වටප්පිටිය සහා සතු භූමියක පිහිටි සායනයේ පසුගිය දා සිට වතුර නෑ. ඒ නිසා සායනය පැවැත්වුයේ නෑ. වතුර ගන්න තාක්ෂණයේ දෝෂ. අකුණක් ගැසීම නිසා ක්‍රියා විරහිත වෙලා. මේ ගැන සොයාබලා අඩුපාඩු හදා දෙන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

අපේ ප්‍රෙද්ශයේ මාතෘ සායන තුනයි. මෝලකැලේ,අක්කර 16, ගලුකාගම. වැසිකිලි පහසුකම් තිබුනේ නෑ. අඩුපාඩු තියෙනවා. දුප්පත් ජනතාව එන්නේ. මම මෝලකැලේ ප්‍රජාශාලාවේ තියෙන එකට වැසිකිලිය හැදුවා. කරපිංච ග්‍රාමීය රෝහලක් තියෙනවා. රෝගින්ට ක්ලිනික් තියෙනවා. නයනා මන්ත්‍රීතුමිය කිව්වා ගලුකාගම එක ටයිල් කලා කියලා. ඒ සායනයේ ප්‍රශ්නයක් උනා. යෞවන සමාජ හදලා ගංවල .මාතාසායනයට යන්නතියෙන්නේ ක්‍රිඩා පිටිය මැදින්. පාර තියෙන්නේ මැද්දෙන්. දහම්පාසැලට යන්නෙත් ඒ පාරෙන්. නමුත් යෞවන සමාජෙන් මේ පිට්ටනිට වට කරලා කම්බි ගහලා. ලොක් පඩිපෙලක් කපලා අඩි 8 ට වැඩි ඉවුරකින්. මාතෘසායනයටත් යන අයට ඉතාමත් අපහසුවෙන් පල්ලම් බැහැලා යන්නවෙන්නේ. මම මේකට මැදිහත් වෙලා ප්‍රාෙද්ශීය ලේකම්ට, පොලිසියේ ස්ථානාධිපතිතුමාට, කතාකලා. හිටියේ නෑ. වැඩබලන කෙනාටත් කතා කලා. කාර්මික නිලධාරි ත් නයනා මන්ත්‍රීතුමියත් ගිහින් මගේ කොට්ඨාසේ අර පාර වහලා නිසා පුද්ගලික

ගෙදරකට යන්න පාර හදන්න බලනවා. ඒ පිට්ටනිය අයිත් ප්‍රාදේශීය ලේකම්ට. කොහොමහරිපස්සේ කම්බි වැට කඩලා කව්රු හරි. අන්තිමට මම වටෙ කඩලා කියලා පැමිණිල්ලක් දාලා. මම නෙමේ. ඇත්තටම මම කැඩුවානම් මම කැඩුවා කියනවා. මම මේ මාතා නිවාසය, ගුරුවරු ආදින්ට යන පාර ගැන මැදිහත් උනා විතරයි. පොලිසියේදී මේගැන කතා කලා. පිට්ටනිය වටේ අන්තිමට වැට ගහපු කෙනෙකුත් නෑ. යෞවන සමාජ කියලා හැදුවට ඒවාට බලපෑම් දේශපාලන. මේවාට එහෙන් ජන්දය ඉල්ලපු අයත් හවුල්. අපිව පොලිසියට ගෙන්නුවේ මේ මාතෘවරුන් වෙනුවෙන් මාර්ගය ගැන වැඩ කරන්න ගිහින්. ඒ වගේ පහත් වැඩ කරන්න එපා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -

නයනා මන්ත්‍රී තුමිය කිව්වා කාන්තා කමිටුව ගැන. මටත් හිතුණා මුලින් මමත් කමිටුවට හිටියා නම් කියලා. ළමා කටයුතු වලට මාත් මැදිහත් වෙලා තියෙනවා. කනුග්ගල්ල කැකුළු ළමා සමාජය පළාතේ හොඳම ළමා සමාජය ලෙස සම්මාන ගත්තා. ඒ ළමා සමාජය මෙහෙයවූයේ මම. ඒ අත්දැකීම් මා සතුව තියෙනවා. කාන්තා කමිටුවට කාත්නාවන් විතරක් නෙමෙයි. මන්ත්‍රිවරුත් දමන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -

අපේ ප්‍රෙද්ශයේ මාතාවරු එන්නේ පැරණි අම්බලමේ තියෙන සායනයට. තලාවිටිය, බෝධිමළුව මාතෘවරු එන්නේ. ඒ මාතෘසායනයෙත් පහසුකම් වැඩි කරන්න. අඩුපාඩු තියෙනවා. නයනා මන්ත්‍රී තුමිය කිව්වා වගේ පුරුෂ පක්ෂය මේ කටයුතු වලදි සංවේදි නිසයි මේ වගේ යෝජනාවක් දමලා තියෙන්නේ. ඒ නිසා ගැටළු නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන මහතා -

දෙල්ගොල්ල මන්ත්‍රීතුමා කිව්ව කැකුළු ළමා සමාජය ඒතුමා උනන්දු වෙලා පවත්වාගෙන ගියේ. එතුමාට ළමා කටයුතු පිලිබඳ අවබෝධයක් තියෙනවා. දක්ෂතා තියෙනවා. ඒ නිසා මන්ත්‍රී වරුත් ඒ කමිටුවට ගන්න.

අපේ සිමාව තුළ තියෙන මාතා සායන වල අඩුපාඩු තියෙනවා. පිරිමින්ට මේ ගැටළු පේන්නේ ඇත්තටම අපේ මව් වරු, නැගනිවරු, සහෝදරියෝ සියල්ලෝම කතුන්. ඉතින් ඒ අයට තියෙන අපහසුතා අපිට දැනෙනවා. අපි මැදිහත් වෙන්න ඕනි. ඒ කමිටුවට කතුන් විතරක් දාන්න කියන එක වරදක්. ඉදිරියේ මේ කමිටුව සක්‍රියව ක්‍රියාත්මකකරමු.

ගරු ප්‍රාදේශීය  සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

නයනා මන්ත්‍රී තුමිය කිව්වා වගේ ඔබතුමියන්ලාට අයිතියක් තියෙනවා ඒ කමිටුව හරහාත් මේ කටයුතු සිදු කරන්න. 2026 අයවැයෙන් හෝ මේ කටයුතු කරමු. ප්‍රමුඛතාවක් දෙන්න.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

මේ කටයුත්තට සභාවක් ලෙස සිදු කලහැකි උපරිමය කරන්න මැදිහත්වෙමු. අදහස් සැලකිල්ලට ගෙන අමාත්‍යාංශ මට්ටමෙනුත් කල හැකි උපරිමය කරමු.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  රන්ජන් ප්‍රදීප්  මහතා -

සභාවේ කතා කරද්දි යෝජනා ඉදිරිපත්කරන කෙනාට අදහස්දක්වන්න ඉඩදීලා මේ කටයුත්ත ඉක්මන් කලොත් හරි. දිර්ඝ අදහස් එකිනෙකා දැක්වීමෙන් කාලයත් දීර්ග වෙනවා.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

මේ කටයුත්ත අවබෝධයෙන් කලොත් සභා කටයුතු කඩිනම්ව  කල හැකියි. දීර්ග අදහස් දැක්වීම් නිසා  මහා සභාව සඳහා ගතවෙන කාලයත් දීර්ග වෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය  සභා උප සභාපති අනිල් ලියනගේ මහතා ගේ යෝජනාව අනුව  කුරුවිට ප්‍රාදේශීය  සභා බල ප්‍රෙද්ශයේ මාතෘ සායන  විධිමත් ලෙස පවත්වාගෙන යාමට අවශ්‍ය පහසුකම් ලබාදීමට ඒකමතිකව  මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රීණි  ආර්. එල් නිරෝෂා ලියනගේ මිය  විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රීණි  ආර්. එල් නිරෝෂා ලියනගේ මිය  -

**06- 07.** වලදුර කොට්ඨාශයේ නඩුකාරදෙනිය වසමේ නඩුකාරදෙනිය ප්‍රජාශාලා භූමියේ ළමා උද්‍යාණය ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වි.ආර්. ධර්මසිරි මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආර්. එල් නිරෝෂා ලියනගේ මිය

ළමා උද්‍යානය අබලන් තත්වයට පත් වෙලා. තියෙන උපකරණත් අබලන් වෙලා දැන් අවලස්සනක් තමා තියෙන්නේ. ළමයින් වෙනුවෙන් මේ කටයුත්ත කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආර්. එල් නිරෝෂා ලියනගේ මිය ගේ යෝජනාව අනුව වලදූර කොට්ඨාශයේ නඩුකාරදෙනිය වසමේ නඩුකාරදෙනිය ප්‍රජාශාලා භූමියේ ළමා උද්‍යාණය ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආර්. එල් නිරෝෂා ලියනගේ මිය -

**06- 08.** නඩුකාරදෙනිය වසමේ පැරඩයිස් හන්දිය තොග කඩය අසලින් තිලකවංශ මහතාගේ නිවස දෙසට මාර්ගයේ මීටර් 50 ක පමණ කොටස පිලිසකර කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී.ජස්ටින් රණවීර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආර්. එල් නිරෝෂා ලියනගේ මිය -

මාර්ගයේ මීටර් 50 ක පමණ කොටස පිලිසකර කල යුතු තත්වයට පත්වෙලා. ගමන් කිරීම අපහසුයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආර්. එල් නිරෝෂා ලියනගේ මිය ගේ යෝජනාව අනුව නඩුකාරදෙනිය වසමේ පැරඩයිස් හන්දිය තොග කඩය අසලින් තිලකවංශ මහතාගේ නිවස දෙසට මාර්ගයේ මීටර් 50 ක පමණ කොටස පිලිසකර කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා -

**06-09.** කුරුවිට කිතුල්පෙ වසමේ ඇති මාර්ගවල අඩි 08 ට වඩා අඩු මාර්ග පුළුල් කර සකස්කිරිමට අවශය පියවර ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා -

කිතුල්පේ වැලිකැටිය පිල්ලදෙනිය මාර්ගය තවමත් යතුරු පැදි හා පයින් විතරයි යන්න පුළුවන්. 1972 ඉඳන් අඩි පාරක්. පවුල් 30 ක් විතර භාවිතා කරනවා. ඒ මාර්ගය සභාවට පවරාගෙන පුළුල් කිරිමට කටයුතු කරන්න. අනික කොස්ගල කනත්ත හා නිවාසවලට යන මාර්ගය .ඒ මාර්ගයත් පවරාගෙන පුළුල්කර ගත යුතුයි. අනෙකුත් අඩි 08 ට අඩුමාර්ගත් පවරාගෙන පුළුල් කරන්න.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා-

මේ සම්බන්ධව නීත්‍යානුකූලව පවරාගැනීමට හා ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතාගේ ගේ යෝජනාව අනුව කිතුල්පේ වැලිකැටිය පිල්ලදෙනිය මාර්ගය ය හා කොස්ගල කනත්ත පාර ද ඇතුලත්ව කුරුවිට කිතුල්පෙ වසමේ ඇති මාර්ගවල අඩි 08 ට වඩා අඩු මාර්ග පුළුල් කර සකස්කිරිමට අවශ්‍ය නීත්‍යානුකූල ඉදිරි පියවර ගැනීමටඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ඩග්ලස් ප්‍රේමදාස මහතා -

06-10. කිතුල්පෙ වැලිකැටිය කුඹුර අසල අවිධිමත් ඉදිකර ඇති බෝක්කුව විධිමත් ලෙස සැකසීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා -

මේ බෝක්කුව සම්බන්ධව 2024.07.03 දින මම මේ සම්බන්ධව ප්‍රාෙද්ශීය ලේකම්වරයාට ලිපියක් යොමුකලා. ගොවිජන සේවා එකටත් ගරු ආණ්ඩුකාරතුමාවත් ලිපි මගින් දැනුවත් කලා. තවම පරික්ෂනයක් කෙරුනේ නෑ.

ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා-

පරීක්ෂා කර මේ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා ගරු මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතාගේ ගේ යෝජනාව අනුව කිතුල්පෙ වැලිකැටිය කුඹුර අසල අව්ඩිමත් ඉදිකර ඇති බෝක්කුව විධිමත් ලෙස සැකසීමට පරීක්ෂා කර බලා අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

**06-11.** කුරුවිට සභා බල ප්‍රදේශය තුළ ඇති රක්ෂිත සීමා ලෙස වෙන්කර ඇති ප්‍රදේශ වල දැන්වීම් පුවරු සවිකර, ආරක්ෂා කිරිමට කටයුතු කරන ලෙස අදාළ අංශ වෙත දැනුම්දීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා -

කිතුල්පෙ, හල්පෙ වගේ ප්‍රෙද්ශවල ඇති කුඩා රක්ෂිත වල මිනිස්සු ගස් කපනවා. රක්ෂිත අල්ලලා. මායිම් ගල් දාලා . මේවායේ දැන්වීම් පුවරු සවි කරලා ආරක්ෂා කරන්න. අදාල අංශ දැනුවත් කරන්න. කිතුල්පෙ පීල්ලදෙනිය රක්ෂිතය පිලිබඳවද අවධානය යොමු කර මේ කටයුතු සිදු කරන ලෙස දැනුම් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

කුරුවිට මහපාලම යටත් බැකෝ දාලා සුද්ද කරනවා. පාතගමට එහා වැලිඹිවිට පාලම ලගත් බැකෝ දාලා සුද්ද කරනවා. පාර පළල් කරනවා කියනවා. උණපදුරුත් ඉවත්කරනවා. සෝදාපාළුවට ලක්වෙමු.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

ගොවිසතිය නිමිත්තෙන් වේලි සුද්දකිරීමේ කටයුතුත් සිදුවෙනවා. ඒවාද සොයාබලමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආර්. එල් නිරෝෂා ලියනගේ මිය -

ගොවි සමිතිවල යෝජනා ක්‍රියාත්මක කරනවා වෙන්න පුළුවන්.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

රක්ෂිත සීමා සම්බන්ධව අදාල අංශ දැනුවත් කරලා ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩග්ලස් ප්‍රේමදාස මහතා ගේ යෝජනාව අනුව කුරුවිට සභා බල ප්‍රදේශය තුළ ඇති රක්ෂිත සීමා ලෙස වෙන්කර ඇති ප්‍රදේශ වල දැන්වීම් පුවරු සවිකර, ආරක්ෂා කිරිමට කටයුතු කරන ලෙස අදාළ අංශ වෙත දැනුම්දීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය විසින් කරනු ලබන යෝජනා</u> -
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය -</u>

**06 - 12.** දොඩම්පෙ කිරිවැල්දෙනිය නන්දිත විජේමුණි මහතාගේ නිවස අසල සිට සුමිත් ප්‍රේමදාස මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච් . වී. මහින්ද මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>
ප්‍රතිපාදන ඇති අයුරින් ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව දොඩම්පෙ කිරිවැල්දෙනිය නන්දිත විජේමුණි මහතාගේ නිවස අසල සිට සුමිත් ප්‍රේමදාස මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය -</u>

**06 - 13.** කුරුවිට තැඹිලියන පළමු පටුමග ඉතිරි කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>
ප්‍රතිපාදන ඇති අයුරින් ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව කුරුවිට තැඹිලියන පළමු පටුමග ඉතිරි කොටස සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය -</u>

**06- 14.** මලව සමනල පෙදෙස අතුරු මාර්ගය හා පැති කාණුව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනී අතුකෝරළ මිය ගේ යෝජනාව අනුව මලව සමනල පෙදෙස අතුරු මාර්ගය හා පැති කාණුව සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා විසින් කරනු ලබන යෝජනා -</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා -</u>
**06- 15.** සංචාරක ආකර්ශනයක් ඇති සූදාගල ඇල්ල මාර්ගය සහ දියඇල්ල ආශ්‍රිත ප්‍රදේශය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා -</u>
සූදාගල ඇල්ල ප්‍රෙද්ශයට ආභරණයක්. දෙස් විදෙස් සංචාරකයින් එනවා. ඒ ඇල්ල ආශ්‍රිතව හෝටලයක් හදන්න යනවා. කරුණාදාස මහත්තයාගේ ඉඩමේ කෙලෙවරේ තියෙන්නේ ඇල්ල. දැන් ඒ මහත්තයා ගමේ අයටවත් ඒ පාරේ යන්න දෙන්නෑ. ඒ හෝටලය හැදුවොත් ඇල්ලට පිවිසුම් මගක් නෑ. ඇල්ල පුද්ගලික වෙනවා. සංචාරක කර්මාන්ත දියුණු විය යුතුයි. නමුත් මෙවැනි දිය ඇළි ගමටම අයිතියි. මේ ඇල්ල සභාව මගින් සංවර්ධනය කලොත් සභාවට අදායම්ලැබිය හැකියි. ගමේ ඉල්ලීම මේ ප්‍රෙවිශ මාර්ගය හා ඒ ප්‍රෙද්ශය සභාවට පවරාගෙන සංවර්ධන කිරීම. ඒ නිසා අවශ්‍ය අංශ දැනුවත් කරලා මේ කටයුතු කරන්න. එසේම සභාවේ අනුමැතීන් නැතිව මේ ඉදිකිරීම් කරන්නත් බෑ. ඒ නිසා කඩිනමින් මේ කටයුත්ත ආරම්භ කරන්න. පණතේ බලතල ප්‍රකාරව කටයුතු කරන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**අපි මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් දැනුවත් කරලා අපිට ඇති බලතල අනුව පවරාගැනීමකට යමු. ඉදිරි කටයුතු කරමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා ගේ_ යෝජනාව අනුව සංචාරක ආකර්ශනයක් ඇති සූදාගල ඇල්ල මාර්ගය සහ දියඇල්ල ආශ්‍රිත ප්‍රදේශය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා -</u>

**06 -16. දෙව්පහල වැළිහිඳ මාර්ගයේ ඇති ගල කඩා ඉවත්කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා -</u>

**ලක්ෂ එකහමාරක් පමන යයි. ජනතාවට පහසුවෙන් නගරයට එන්නහැකි විධිහට වාහන වලට යන්න පුළුවන්.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා ගේ_ යෝජනාව අනුව දෙව්පහල වැළිහිඳ මාර්ගයේ ඇති ගල කඩා ඉවත්කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා -</u>

**06- 17. සූදාගල කොට්ඨාශයේ ඇදිරියන්වල වසමේ ඉඹුලවිටිය පන්සල මාර්ගයේ අබලන්වී ඇති බෝක්කුව අළුත්වැඩියා කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මිය -</u>
එම යෝජනාව ස්ථිර කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා -</u>
දැනට කඩා වැටිලා තියෙන්නේ. වාහන යන්න බෑ. පයින් විතරයි යන්න පුළුවන්.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
වෙනත් අංශයකින්හෝ ප්‍රතිපාදන අරන් මේ කටයුත්ත කරමු.
ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා ගේ_ යෝජනාව අනුව සූදාගල කොට්ඨාශයේ ඇදිරියන්වල වසමේ ඉඹුලවිටිය පන්සල මාර්ගයේ අබලන්වී ඇති බෝක්කුව අළුත්වැඩියා කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා විසින් කරනු ලබන යෝජනා -
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

**06- 18.** පුස්සැල්ල පාසල පාර කුඩා බෝක්කුව විශාල කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ_ යෝජනාව අනුව පුස්සැල්ල පාසල පාර කුඩා බෝක්කුව විශාල කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

**06- 19.** නඩුකාරදෙනිය සමාධිමාවත හරස් පාර පෙට්ටිබෝක්කුව සෑදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ_ යෝජනාව අනුව නඩුකාරදෙනිය සමාධිමාවත හරස් පාර පෙට්ටිබෝක්කුව සෑදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

**06- 20.** පුස්සැල්ල ආදාහනාගාරය සඳහා පාණිය ජලය ලබාගැනිමට ජල යෝජනා ක්‍රමයක් සකස් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

අදාහනාගාරයට ජල ප්‍රශ්නයක් තියෙනවා. මේ දිනවල වැස්ස තියෙන නිසා දැනට වතුර ගන්න තැනින් වතුර ගන්න පුළුවන්. නමුත පායන කාලෙට නෑ. දැනට උඩ ගෙදරින් දෙන්නේ. ඒ නිසා ළිඳක් හාරලා හරි වතුර දෙමු. මෙය අත්‍යවශ්‍ය තාවක්.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -
මාස කීපයක් ඇතුලත විසල් වතුර එයි. එතෙක් අපු වතුර බවුසරයක් මගින් මේ කටයුතු සිදුකරනවා. තාවකාලිකව. අපි දැනට විසඳාගමු. කඩිනමින් විසල් වතුර ගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා ගේ_ යෝජනාව අනුව පුස්සැල්ල ආදාහනාගාරය සඳහා පාණිය ජලය ලබාගැනිමට ජල යෝජනා ක්‍රමයක් සකස් කිරිම සම්බන්ධයෙන් විසල් ජලක්‍රමය යටතේ ආදාහනාගාරයට ජලය ලබාදීමට නියමිත බැවින් එතෙක් ජල බවුසර් මගින් තාවකාලිකව ගැටළුව විසඳාගැනිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා විසින් කරනු ලබන යෝජනා -
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -

**06– 21.** කුරුවිට ලෙල්ලගොඩ ලංගම බස්රථය සෙනසුරාදා, ඉරිදා, හා රජයේ නිවාඩු දිනවල ලෙස ධාවනය කිරිම සඳහා රත්නපුර ඩිපෝවේ බලධාරින් දැනුවත් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම්.මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා -
වර්ෂ 2000 සිට බස්රථය ලබාදුන්නේ. නමුත් සෙනසුරාදා, ඉරිදා, හා රජයේ නිවාඩු දිනවල ලෙස ධාවනය කිරිම සිදුවෙන්නේ නෑ. ඒ නිසා මේ රථය ජනතාවගේ පහසුව සලකා ලබා දෙන්න.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සිරිල් කරුණාරත්න මහතා -
ඇහැලියගොඩ, ඉඩංගොඩ, බස්රථය ත් සවස 5.30 න් පස්සේ ධාවනය වෙන් නෑ. ඒ සම්බන්ධවත් පියවර ගන්න.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

මේ පිලිබඳව අදාල අංශ දැනුවත් කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.කේ. විජේසිරි මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ලෙල්ලගොඩ ලංගම බස්රථය සෙනසුරාදා, ඉරිදා, හා රජයේ නිවාඩු දිනවල ලෙස ධාවනය කිරිම සඳහා රත්නපුර ඩිපෝවේ බලධාරින් දැනුවත් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා -

**06- 22.** මාටුවාගල මැදේවත්ත මාර්ගය සරත්ලාල් මහතාගේ නිවස අසල සිට කුඹුරතෙක් මීටර් **100** ක් සංවර්ධනය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා ගේ යෝජනාව අනුව මාටුවාගල මැදේවත්ත මාර්ගය සරත්ලාල් මහතාගේ නිවස අසල සිට කුඹුරතෙක් මීටර් **100** ක් සංවර්ධනය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා

**06- 23.** මාටුවාගල කඩේවත්ත මාර්ගය කුඹුරතෙක් අඩක් සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.මහින්ද මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා ගේ යෝජනාව අනුව මාටුවාගල කඩේවත්ත මාර්ගය කුඹුරතෙක් අඩක් සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා

**06-24.** මාටුවාගල වත්තේ උඩ කොටසේ පාසැල ඉදිරියෙන් ඇති 29 ඇතුළු පාර ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ඉනෝකා මල්කාන්ති මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රංගනාත් ගහබඩගේ මහතා ගේ යෝජනාව අනුව මාටුවාගල වත්තේ උඩ කොටසේ පාසැල ඉදිරියෙන් ඇති 29 ඇතුළු පාර ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -

**06-25.** මිල්ලවිටිය, ලෙල්ලගොඩ ,සුමනගම දඬුවල මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතාගේ යෝජනාව අනුව මිල්ලවිටිය, ලෙල්ලගොඩ ,සුමනගම දඬුවල මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -

**06-26.** කොක්ඕවිට බටහිර මාර්ගයේ බිලිංගස්වත්ත සම්බන්ධ වන මාර්ග කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>දමින්ද නලින් අධිකාරම් මහතාගේ</u> යෝජනාව අනුව කොක්ඕවිට බටහිර මාර්ගයේ බිලිංගස්වත්ත සම්බන්ධ වන මාර්ග කොටස සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -</u>**

**06-27.** මිල්ලවිටිය සමාධි මාවතේ සුමනසිංහ මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහාන් චන්දික අමරසේන මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>දමින්ද නලින් අධිකාරම් මහතාගේ</u> යෝජනාව අනුව මිල්ලවිටිය සමාධි මාවතේ සුමනසිංහ මහතාගේ නිවස දෙසට ඇති මාර්ගය සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්.ධර්මසිරි මහතා විසින් කරනු ලබන යෝජනා</u> -**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්.ධර්මසිරි මහතා</u>**
**06- 28.** පැරඩයිස් පාසැල ඉදිරිපිට කාණුව ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී සශීකලා මදුභාෂිණී මිය -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>කේ.වී.ආර්.ධර්මසිරි මහතා ගේ</u> යෝජනාව අනුව පැරඩයිස් පාසැල ඉදිරිපිට කාණුව ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.වී.ආර්.ධර්මසිරි මහතා -</u>**

**06- 29.** කාහේන්ගම, දඩුපාලම අසල මාර්ගය මීටර් **30** පමනප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රිණී සශිකලා මදුභාෂිණී මිය -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රි  කේ.වී.ආර්.ධර්මසිරි මහතා ගේ යෝජනාව  අනුව කාහේන්ගම, දඹුපාලම  අසල මාර්ගය මීටර් 30 පමනප්‍රතිසංස්කරණය කිරිමට  කිරිමට ඒකමතිකව  මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රි  කේ.වී.ආර්.ධර්මසිරි මහතා -

**06- 30.** කොස්ගොඩ ප්‍රධාන මාර්ගයේ විජේතුංග සහෝදරයාගේ නිවස ඉදිරිපිට  මාර්ගයේ කාණුපද්ධතිය මිටර් 60 ක් පමණ ප්‍රතිසංස්කරණය කිරිමට  යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රිණී සශිකලා මදුභාෂිණී මිය -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රි  කේ.වී.ආර්.ධර්මසිරි මහතා ගේ යෝජනාව  අනුව කොස්ගොඩ ප්‍රධාන මාර්ගයේ විජේතුංග සහෝදරයාගේ නිවස ඉදිරිපිට  මාර්ගයේ කාණුපද්ධතිය මිටර් 60 ක් පමණ ප්‍රතිසංස්කරණය කිරිමට  කිරිමට ඒකමතිකව  මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රි  එස්.චන්ද්‍රකුමාර්  මහතා විසින් කරනු ලබන යෝජනා -
ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රි  එස්.චන්ද්‍රකුමාර්  මහතා -
**06- 31.** ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් සීමාවේ පිහිටි වතු සමාගම් වලට අයත් පොදු පාරවල්, පොදු ළිං, පොදු කාණු ආදි සියල්ල සභාවට පවරාගෙන සංවර්ධනය කිරීම සම්බන්ධ යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රි  දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රි  එස්.චන්ද්‍රකුමාර්  මහතා -

වතු නිවාස වල අයට ඉඩම් ගෙවල් නෑ. ගෙවල්  නෑ.සමාජ පිලිගැනීමක් නෑ. ඒ අයට ගමන් කරන පාර වහලා. මුදල් බලය මත සිදුවන දේවල්. මත්ද්‍රව්‍ය අලෙවිකරන අයට ඒ අයට බලය වැඩියි. මේවා සභාවට පවරා ගන්න. වතු අධිකාරිව  දැනුවත් කරලා අවශ්‍ය පියවර ගන්න.

අදටත් මේ ගැටළු වතු අධිකාරිට කිච්චට ගනන් ගන්නේ නෑ. මරණයක් උනත් ගනං ගන්නෑ. ඉතාමත් කනගාටුදායකයි. ඒ නිසා මේ කටයුත්ත කරන්න. ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් සීමාවේ පිහිටි වතු සමාගම් වලට අයත් පොදු පාරවල්, පොදු ළිං, පොදු කාණු ආදී සියල්ල සභාවට පවරාගෙන සංවර්ධනය කිරීමට කටයුතු කරන්න. ජනතාව වෙනුවෙන්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

සභාවට පවරා ගන්න නිතිමය හැකියාවක් පවතීනම් ඉතාමත් වැදගත් කටයුත්තක්. අපිට ඒ පාරවල් කොන්ක්‍රිට් කර දෙන්න පුළුවන්. ළිං, පොදු කානු සියල්ල බවරා ගන්න හැකි ක්‍රමයක් වේනම් වැදගත්. දමිළ ජනතාව වෙනුවෙන් වැඩකරන්න ගිහින් බොහෝ අවස්ථාවල මම අපහසුතාවට පත් උනා. ඒ අය ගමන් කරන මාර්ග බලෙන් අල්ලගෙන, කසිප්පු මත්ද්‍රව්‍ය වෙළදාම් කරන අය. නමුත් කිසිදු අවස්ථාවක වත්තේ මහත්තුරු මේ ගැටළු ගනන් ගනනේ නෑ. කරපිංච වත්ත ඇතුළු කොයි වත්තේත් එකම තත්වය තියෙන්නේ. ජනාධිපතිතුමා අර පර්චස් 10 බිම් අයිතිය වෙනුවෙන් ලබාදුන්න සහතික පත්‍ර මේ ජනතාවටත් ගන්න පුළුවන් නම් වැදගත්. මේ ජනතාවට තමන්ගේ කියන්න බිම්අඟලක් නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

දමිළ ජනතාවගේ ජන්දය ඉල්ලුවාට ඒ අයට කරන සේවයක් නෑ. නීතිමය තත්වය අනුව පාරක් ජනතාව භාවිතා කරනවා නම් ඒ පාර පළාත් පාලන ආයතනයට අයත්. වතු අධිකාරි අනුමැතිය අනවශ්‍යයි. නමුත් කටයුතු කරද්දි සේරටම වතු අධිකාරිගේ අනුමැතිය ඉල්ලනවා. මේ දේවල් වතුයටිතල පහසුකම් අමාත්‍යාංශයට කියලා හෝ කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -</u>

අපි රජයක් ලෙස වතු ජනතාවට සහන ලබා දෙනවා. වතු ජනතාවගේ ජීවන තත්වය උසස් කිරිමට කටයුතු කරනවා. මූනංගල වත්තේ ජනතාවට තිබුන මාර්ග ගැටළුව නිරාකරනය කලා. ඒ ජනතාවට නිවාස අයිතියක් නෑ. නමුත් මේවන විට ඒ සම්බන්ධව කටයුතු කරමින් සිටිනවා. අයිතිය තහවුරු කිරිමට හැකිලෙස. ජාතික ජනබලවේගය රජය සියළු ජනතාවට දුන් පොරොන්දු රකිනවා.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අදාළ අංශ දැනුවත් කර ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>එස්.චන්ද්‍රකුමාර් මහතාගේ ගේ</u> යෝජනාව අනුව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයට අයත් සීමාවේ පිහිටි වතු සමාගම් වලට අයත් පොදු පාරවල්, පොදු ළිං, පොදු කාණු ආදි සියල්ල සභාවට පවරාගෙන සංවර්ධනය කිරිම සම්බන්ධව අදාල අංශ දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

**06- 32.** වතු තරුණයින් හට දිවා රාත්‍රී ක්‍රීඩා කිරිමට සුදුසු වොලිබෝල් පිටියක් සැකසිමට අවශ්‍ය කටයුතු සිදු කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

හැම වත්තකම ඉන්න තරුන පිරිසට ක්‍රිඩාවක් කරන්න තැනක් නෑ. ගම් වල තිබුනට වතු තරුණයන්ට නෑ. බහුතරයක් මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා. හවසට ක්‍රිඩා කරන්න ක්‍රිඩා පිටියක් තිබුනා නම් ඒ තත්වය බොහෝ අඩු වෙන්න පුළුවන්. ක්‍රිඩා අමාතශ්‍යංශය දැනුවත් කරලා හෝ වොලිබෝල් ක්‍රිඩා පිටියක් කරපිංච වත්තට ලබාදෙන්න

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතාගේ ගේ යෝජනාව අනුව වතු තරුණයින් හට දිවා රාත්‍රී ක්‍රීඩා කිරිමට කරපිංච වත්තට සුදුසු වොලිබෝල් පිටියක් සැකසිමට අවශ්‍ය කටයුතු සිදු කිරිමට සම්බන්ධව අදාල අංශ දැනුවත් කර ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

**06- 33.** කරපිංච සමූපාකාරය අසල සිට ඉහල වතු නිවාස මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

එම යෝජනාව ස්ථිර කරමි. වැහිකාලේට මුළු පාරම යට වෙනවා. ක්‍රමවේද වැරදියි. යෝජනාව වෙන තැනක . කරලා තියෙන්නේ තවත් තැනක. ඔපිස් හන්දිය වතුර බහින කානුව මහගසුත් වැටිලා. කානුව ගොඩ දැම්මේ නෑ. ප්‍රධාන මාර්ගයේ කානුව වැහිලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

මේ ස්ථානයේ වතුර බැහැලා යන්නේ නෑ. ගිහින් පෙන්නුවා. මේ වැරැද්ද කාණුව හදද්දි. නමුත් හරියට කටයුතු කලේ නෑ. කරපිංච කොස්ගල හංදියේ . බැකෝ දාලා කානුව කැපුවේ. දැන් බෝක්කුවට හානි වෙලා. ආර්ඩී එකෙන් කානුව ගොඩ දාන්න ඕනි. කානුව කපලා විශාල කාලයක්. මෝටර් සයිකලයක් වැටුනා ඒ කානුවටවතු සමාගමෙන්, මාර්ග සංවර්ධන අධිකාරියෙන් ආදියෙන් මේ කටයුත්ත කරන්න ඉල්ලුවාට කෙරිලා නෑ. අවධානය දෙන්න. අපිත් අසරණය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

මේ කටයුත්ත එළඹෙන සතිය තුල සිදුකරලා දෙනවා කියලා දැනුම් දුන්නා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.චන්ද්‍රකුමාර් මහතාගේ ගේ යෝජනාව අනුව කරපිංච සමූපාකාරය අසල සිට ඉහල වතු නිවාස මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරිමට ඉදිරි පියවර ගැනිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පත්මසිරි දෙල්ගොල්ල මහතා විසින් කරනු ලබන යෝජනා -

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පත්මසිරි දෙල්ගොල්ල මහතා -

**06- 34.** - ජයවර්ධන මාවත අවශ්‍ය ස්ථානවල කාණු පිලිසකර කර ජලය බැස යාම විධිමත් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පත්මසිරි දෙල්ගොල්ල මහතා -

මේ මාර්ගයේ නිවාස වල ජල කානු පාරට හරවලා. ජලය බැස යන්නේ නෑ. දැනුවත් කිරිමක් සිදුකිරිමත් අවශ්‍යයි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පත්මසිරි දෙල්ගොල්ල මහතාගේ ගේ යෝජනාව අනුව ජයවර්ධන මාවත අවශ්‍ය ස්ථානවල කාණු පිලිසකර කර ජලය බැස යාම විධිමත් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පත්මසිරි දෙල්ගොල්ල මහතා -

**06- 35.** යටිපච්ච දික්ඔවිට සුසානභූමිය ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනීම ට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ශ්‍රී ඉනෝකා මල්ලවආරච්චි මිය -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි පත්මසිරි දෙල්ගොල්ල මහතාගේ යෝජනාව අනුව යටිපච්ච දික්ඔවිට සුසානභූමිය ප්‍රාදේශිය සභාව වෙත පවරා ගැනීම ට අවශය ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පත්මසිරි දෙල්ගොල්ල මහතා -</u>

**06- 36.** ඇල්ලකන්ද පාර අවිධිමත් ජලය බැසයාම පිලිබඳ ගැටළුව නිරාකරණය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ණී ඉනෝකා මල්ලවආරච්චි මිය -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>පත්මසිරි දෙල්ගොල්ල මහතාගේ</u> යෝජනාව අනුව ඇල්ලකන්ද පාර අවිධිමත් ජලය බැසයාම පිලිබඳ ගැටළුව නිරාකරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මිය විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මිය -</u>
**06- 37.** උතුරු එක්නැලිගොඩ වසමේ එරත්නගොඩ සිට කන්ද උඩ දක්වා ඇති මාර්ගය මීටර් 50 ක් පමණ කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී <u>ආශා සමන් කුමාරි මිය ගේ</u> යෝජනාව අනුව උතුරු එක්නැලිගොඩ වසමේ එරත්නගොඩ සිට කන්ද උඩ දක්වා ඇති මාර්ගය මීටර් 50 ක් පමණ කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මිය -</u>

**06- 38.** ඇඳිරියන්වල වසමේ නිලා වත්ත මාර්ගය මිටර් 50 ක් පමණ කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී <u>ආශා සමන් කුමාරි මිය ගේ</u> යෝජනාව අනුව ඇඳිරියන්වල වසමේ නිලා වත්ත මාර්ගය මිටර් 50 ක් පමණ කොන්ක්‍රීට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී ආශා සමන් කුමාරි මිය -</u>

**06- 39.** **පොල්ගහ මුකලාන අතුරු මාර්ගය 2 මිටර් 150 ක් පමණ කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී <u>ආශා සමන් කුමාරි මිය ගේ</u> යෝජනාව අනුව පොල්ගහ මුකලාන අතුරු මාර්ගය 2 මිටර් 150 ක් පමණ කොන්ක්‍රීට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා-</u>
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-</u>

**06- 40.** **වලදූර, නඩුකාරදෙනිය කොට්ඨාශවල ඇති මාර්ගවල දිග ,පළල සීමා නිශ්චිතව හඳුනාගැනීමට වැඩපිලිවෙලක් සකසා ක්‍රියාත්මක කිරිමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

**එම යෝජනාව ස්ථිර කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-</u>

**ගම්වල මාර්ග ලියකියවිලි වල විතරක් සටහන් වෙලා තිබුනාට වැඩක් නෑ. බහුතරයක් මාර්ග වලකාණු නෑ. මාර්ගයේ පළල දන්නේ නෑ. ඒ නිසා වලදූර, නඩුකාරදෙනිය කොට්ඨාශවල ඇති මාර්ගවල දිග ,පළල සීමා නිශ්චිතව හඳුනාගැනීමට වැඩපිලිවෙලක් සකසා ක්‍රියාත්මක කිරිමට කටයුතු කරන්න. තොරතුරු අරන් මේ කටයුත්ත කරමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ</u> යෝජනාව අනුව වලදූර, නඩුකාරදෙනිය කොට්ඨාශවල ඇති මාර්ගවල දිග ,පළල සීමා නිශ්චිතව හඳුනාගැනීමට වැඩපිලිවෙලක් සකසා ක්‍රියාත්මක කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-

**06- 41.** නඩුකාරදෙනිය ප්‍රෙද්ශයේ කොටසක් සඳහා මෙතෙක් භාවිතයේ පැවති රේල්පාර, යන නාමය වෙනුවට සමාධි පෙදෙස ලෙස නම් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ යෝජනාව අනුව නඩුකාරදෙනිය ප්‍රෙද්ශයේ කොටසක් සඳහා මෙතෙක් භාවිතයේ පැවති රේල්පාර, යන නාමය වෙනුවට සමාධි පෙදෙස ලෙස නම් කිරිමට අවශය ඉදිරි කටයුතු සිදු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-

**06- 42.** කුරුවිට ප්‍රාදේශීය සභාව සතු නිශ්චල දේපල වලින් සභාවට ආදායමක් එන පරිදි සංවර්ධන කටයුතුවල යෙදවිමට කටයුතු කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා-

මෙම යෝජනාව පොදුවේ කුරුවිට ප්‍රාදේශීය බල ප්‍රෙද්ශයටම අදාලයි. පසුගිය වර මේ සභාවට ආදායම් වැඩිකිරිමට උත්පාදන මාර්ග හදුන්වා දෙන්න තිබුණා. සභාවට ලැබෙන ආදායම් තුලිනුයි මන්ත්‍රී ප්‍රතිපාදනත් ලැබෙන්නේ. ඒ අනුව මේ සභාව සතු දේපල ආදායම් උත්පාදනයට යොමු කර ගත හැකියි. නමුත් ඇත්තටම මේවා සභාවට ආදායමක් එන පරිදි සංවර්ධන කටයුතුවල යෙදවිමට කටයුතු කරනවාද යන්න ප්‍රශ්නයක්. බෝපත් ඇල්ල, දෙල්ගමු රජමහා විහාරය, බටදොඹ ලෙණ, බටතොට ලෙණ මෙන්ම දෙල්ගමු රජමහා විහාරය කුරුවිටට කේන්ද්‍රගතව පිහිටා තියෙනවා. මේ ස්ථාන නැරඹීමට දෙස් විදෙස් සංචාරකයින් එනවා. අපි ඒ අය ඉලක්ක කරගෙන යම් වැඩපිලිවෙලක් සැකසිය යුතුයි අපේ ආදායම් උත්පාදනයට. මේ සංචාරකයින්ට පිරිසිදු ආහාරවේලක් ගන්න තැනක් නෑ. කොට්ඨාශ මට්ටමින් පිරිසිදු ආහාර ගන්න තැන් සැකසිය හැකියි. තොරතුරු තාක්ෂන මධ්‍යස්ථානයක් ලෙස කුරුවිට නගරයේ ඇති දුම්රිය ගොඩනැගිල්ල සකස් කල හැකියි. කුරුගහ උඩත් ඉදිකිරිම්. ආසසන්ව ඇති ගොඩනැගිල්ල ජරාජීර්ණ වෙලා. ඒවා නැවත ප්‍රතිසංස්කරනය කරලා හෙල බොජුන් අලෙවිසැලක් කල හැකියි. බෝපත් ඇල්ල ආශ්‍රිතව ආහාර ගන්න සුදුසු තැනක් නෑ. විදේශීකයන්ට ගැලපෙන පහසුකම් දිලා මේ ස්ථාන වැඩිදියුණු කිරිම වැදගත්. එය සංචාරක කේන්ද්‍රයක් කල හැකියි. පැරඩයිස් වැව සංචාරක ආකර්ශනය ලද ප්‍රෙදේශයක් කල හැකියි.

හවසට පවුලේ අය එක්ක එන්න උද්‍යානයක් සැකසිය හැකියි. සභාවට යම් ආදායමක් එන පරිදි. මේ යෝජනා ඉදිරි සංවර්ධන කටයුතු වලදී යොදාගන්න කටයුතු කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය -</u>

කුරුවිට නගරයේ හා බෝපත් ඇල්ල හෙළ බොජුන්හල් ඉදිකිරීමට අවධානය වී පවතිනවා. අදහස් අරගෙන කටයුතු කරමු.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

අපි අදහස් අරන් ඉදිරි සංවර්ධන කටයුතු වලදී ක්‍රියාත්මක කරමු. ආදායම් උත්පාදනයට මේ අදහස් වැදගත්.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>ඒ.ශෂේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතාගේ</u> යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව සතු නිශ්චල දේපල වලින් සභාවට ආදායමක් එන පරිදි සංවර්ධන කටයුතුවල යෙදවීමට කටයුතු කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා විසින් කරනු ලබන යෝජනා-</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>

**06- 43.** මෙනේරිපිටිය වසමේ දිගනගම සුභසාධක අවමංගල්‍යාධාර සමිතියට පළාත් සභාවෙන් වෙන්කර දෙන ලද පුස්සැල්ල මීගස්තැන්න වතුයායේ පර්චස් 12 ක භූමිය ප්‍රාදේශිය සභාවට ලබාගැනීමට කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා සම්බන්ධ වි ඉදිරි කටයුතු කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>

යෝජනාවත් සමග තවත් දෙයක් කිව යුතුයි. මගේ නම මේ සභා ඉතිහාසයේ සිට භාවිතව ඇත්තේ ප්‍රේමරත්න මල්කැකුළ නමින් සියළු වාර්තා ආදියේ . මම භාවිතා කරන්නේ එම නම. නමුත් මෑතක සිට මගේ නම වෙනුවට එම. ප්‍රේමරත්න යන නම භාවිතා වෙනවා. එයට විරුද්ධයි. මගේ නම ප්‍රේමරත්න මල්කැකුළ ලෙස න්‍යාය පත්‍රෙය් හා සභා වාර්තාවල යොදන්න.

<u>ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -</u>

එය ගැසට් පත්‍රෙය් ඇති නමයි. ඒ නිසා එම්. ප්‍රේමරත්න යන නම සියළු වාර්තා වල භාවිතා කරනවා. නීතිය අනුව එසේ කල යුතු බවටයි උපදෙස් ලැබී ඇත්තේ.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>එම්. ප්‍රේමරත්න මහතා ගේ</u> යෝජනාව අනුව මෙනේරිපිටිය වසමේ දිගනගම සුභසාධක අවමංගල්‍යාධාර සමිතියට පළාත් සභාවෙන් වෙන්කර දෙන ලද පුස්සැල්ල

මීගස්තැන්න වතුයායේ පර්චස් 12 ක භූමිය ප්‍රාදේශිය සභාවට ලබාගැනීමට කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා සම්බන්ධ වී ඉදිරි කටයුතු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

06- 44 . වටප්පිටිය, මෙනේරිපිටිය පාරේ නුවන් මහතාගේ නිවස අසල පැතිබැම්ම ඉදිකිරිමට ලක්ෂ 2 ක ප්‍රතිපාදන ලබාගැනිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා ගේ යෝජනාව අනුව වටප්පිටිය, මෙනේරිපිටිය පාරේ නුවන් මහතාගේ නිවස අසල පැතිබැම්ම ඉදිකිරිමට ලක්ෂ 2 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

06- 45. මෙනේරිපිටිය අළුපොත මාර්ගයේ හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානය අසල පැතිකාණුව හා අදාළ මාර්ග කොටස සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා ගේ යෝජනාව අනුව මෙනේරිපිටිය අළුපොත මාර්ගයේ හෝමියෝපති වෛද්‍ය මධ්‍යස්ථානය අසල පැතිකාණුව හා අදාළ මාර්ග කොටස සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා විසින් කරනු ලබන යෝජනා -

06- 46 . උතුරු ගලුකාගම පිට්ටනිය අසලින් වෙළ මැදින් ඇති මාර්ගයේ බෝක්කුව දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

දිගින් දිගටම මම මේ සම්බන්ධව මේ සභාවේ කතා කලා. ජනතා වරමින් මේ සභාවට තෙවතාවක් ආවා. ජනතාව මේ කටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙනවා. සමහර

ඉල්ලීම් වලදී අසරණ වෙනවා. කව්රුහරි වැඩ කරන්න ඕනි. උතුරු ගලුකාගම පිට්ටනිය අසලින් වෙළ මැදින් ඇති මාර්ගයේ බෝක්කුව දමා සංවර්ධනටය කිරිම අත්‍යාවශය කටයුත්තක්. පවුල 300 ක් විතර භාවිතා කරන මාර්ගය. කාර්මික නිලධාරී මගින් පරික්ෂා කරවලා මේ කටයුත්ත සිදු කරන්න. ජනතාවගේ ඉල්ලිමකුත් ලිපියක් මගින් ඉදිරිපත්කරලා තියෙනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>දේවින්ද කුමාර මහතාගේ ගේ</u> යෝජනාව අනුව උතුරු ගලුකාගම පිට්ටනිය අසලින් වෙළ මැදින් ඇති මාර්ගයේ බෝක්කුව දමා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

**06 – 47 .** උතුරුගලුකාගම ප්‍රධාන මාර්ගයේ ස්ථාන දෙකක ප්‍රධාන බෝක්කු දෙකක් කඩාවැටි ඇති අතර එම ස්ථානවලට බෝක්කු දමා සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ධර්මදාස මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

ගලුකාගම ගමට ඇති බරපතලම ප්‍රශ්න දෙක මේක. බරවාහනයක් ගියොත් පාර කඩා වැටෙනවා. උතුරුගලුකාගම ප්‍රධාන මාර්ගයේ නිමල් මහතාගේ නිවස අසල එක බෝක්කුවක් අනික ඒ පාරෙම මීටර් 100 ක් විතර එහායින් තියෙනවා. ඒ දෙකම එක පාරේ. මේවා පිලිබඳ අවධානය දි කටයුතු කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී <u>දේවින්ද කුමාර මහතාගේ ගේ</u> යෝජනාව අනුව උතුරුගලුකාගම ප්‍රධාන මාර්ගයේ ස්ථාන දෙකක ප්‍රධාන බෝක්කු දෙකක් කඩාවැටි ඇති අතර එම ස්ථානවලට බෝක්කු දමා සංවර්ධනය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

**06 - 48.** මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කිරීමේදී ආයතනයේදී පොදුවේ සිදුවන අපහසුතා සහ ඒවා ඉවත්කරගැනීම සම්බන්ධව යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂින්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

මේ සභාවට අපි පත්ව ආවේ මහජන ඡන්දයෙන්. යම් ගරුත්වයක් ඇතිව. නමුත් මේ වන විට මේ ගරු කැල්ල වැටිලා. අයියා වෙලා. සභාවේ අදාල ගරුත්වය දෙන්න දන්නේ නැති අය ඉන්නවා. ඒ වගේමයි කොන්ත්‍රාත් කරුවන්ගෙන් හිරිහැර තියෙනවා නිලධාරින්ටත්. සුළු සේවක යින්ගේ විවේක ගන්න කෑම කන ස්ථානයත් වහන්න කියලළු. මේක මූනටම කියලා ප්‍රශ්න ඇති කරගන්නවට වඩා හොඳයි මේ විධිහට සභාවේ කියන එක. මොකද නැත්නම් මට වෙන්නේ ගැටුමක් හදාගන්න. ගෞරවය රැකෙන පරිදි. රජයේ නිලධාරින්ට බලපෑම් කරන්න, සම පුටුවේ වාඩිවෙන්න කොන්ත්‍රාත්කරුවෙකුට ඉඩ තියන්න එපා. සභාවේ ලේකම්ගේ සභාපතිගේ ගරුත්වය හා අනෙකුත් සියළු පිරිසගේ ගරුත්වය රැකෙන පරිදි කටයුතු කරන්න. බාහිර බලපෑම් අනවශයි. මේ සම්බන්ධව ගරු මන්ත්‍රීතුමා විසින් දිර්ඝ ලෙස අදහස් දක්වන ලදී.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -

වැලිකැටියේ ගෙවල් අටකට යන පාර පුද්ගලික පාර වහලා. ඒ මිනිස්සු ජනාධිපතිට ලියලා. කාර්මික නිලධාරි බලන්න ගියා. ජනාධිපති උපදෙස් අනුව ලක්ෂ 20 ක් ඇස්තමේන්තු කල පාරේ ඒ යෝජනා ලිපිය හංගලා. දේශපාලන බලපෑම්. පාර්ලිමේන්තු මනත්‍රීවරයෙක් ඒ ඇස්තමේන්තුව අහක දැම්මා. ජනාධිපති කිව්වදේ ඇහුවේ නෑ. මේ ආයතනයේත් පයිල් තියාගෙන ප්‍රශ්න කරන්න අය හිටියේ නෑ කලින්. ඒක අනවශයි. උදේ ඉඳන් රෑ වෙනකම් ඉන්නවා. ඒක අනවශයි. මේ ආයතනයේ ගරුත්වය රැකගන්න. බාහිර පුද්ගලයෙකුගේ බලපෑම් මේ සභාවට එපා.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

අපේ සභාවේ වැදගත් වෘත්තිකයින් මන්ත්‍රී වරු ලෙස සිටිනවා. වැදගත් ලෙස රැකියාව කරපු හා කරන අය. මේ කිසිවෙකුට අනවශ්‍ය බලපෑම් අවශ්‍ය නෑ. ආයතනයේ සමගියත් අවශ්‍යයි. සමහර දේ ගැලපෙන්නේ නෑ. උඩගුකම අනවශයි. ආයතනයේ ගරුත්වය රැකෙන පරිදි සියළු දෙනා කටයුතු කරමු. මේ සම්බන්ධව ගරු උප සභාපතිතුමා විසින් දිර්ඝ ලෙස අදහස් දක්වන ලදී.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

සියළු දෙනාගේ ගරුත්වය රැකෙන පරිදියි කටයුතු කරන්නේ. හැම මන්ත්‍රී වරයෙකුටම ගරුත්වයක් තියෙනවා. මහජන නියෝජිතයෝ. කාට හරි බාධා වෙනවානම් ඊට විරුද්ධව කටයුතු කරනවා. සියළු මන්ත්‍රීතුමන්ලා එක හා සමානයි. සමාන අයිතින් මහජනතා අයිතින් වෙනුවෙන් කටයුතු කරනවා.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතාගේ ගේ යෝජනාව අනුව මන්ත්‍රීවරයෙකු වශයෙන් කටයුතු කිරීමේදී ආයතනයේදී පොදුවේ සිදුවන අපහසුතා සහ ඒවා ඉවත්කරගැනීම සම්බන්ධව කටයුතු කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

**06 – 49** .බැවිල සමගිපුර මාර්ගයේ විපුල අධිකාරිගේ නිවස අසල පාර නාය ගොස් ඇති ස්ථානයට පැති බැම්ම දැමීමට ලක්ෂ 4 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා ගේ යෝජනාව අනුව බැවිල සමගිපුර මාර්ගයේ විපුල අධිකාරිගේ නිවස අසල පාර නාය ගොස් ඇති ස්ථානයට පැති බැම්ම දැමීමට ලක්ෂ 4 ක ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

**06- 50** . වටප්පිටිය බෝගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරිමට ලක්ෂ 5 ක ප්‍රතිපාදන ලබාදිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා ගේ යෝජනාව අනුව වටප්පිටිය බෝගහවත්ත මාර්ගය කොන්ක්‍රීට් කිරිමට ලක්ෂ 5 ක ප්‍රතිපාදන ලබාදිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -

**06 – 51.** පරකඩුව සුබෝධි මාවත පාර පළුදු වි ඇති ස්ථාන තාරදමා පළුදු වැසිමට ලක්ෂ 5 ක ප්‍රතිපාදන ලබාදීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා <u>මන්ත්‍රී සම්පත් බොතේජු මහතා ගේ</u> යෝජනාව අනුව පරකඩුව සුබෝධි මාවත පාර පළුදු වී ඇති ස්ථාන තාරදමා පළුදු වැසිමට ලක්ෂ 5 ක ප්‍රතිපාදන ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී බී.එල්. සුධීරා සේමිණී ලියනගේ මිය විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී බී.එල්. සුධීරා සේමිණී ලියනගේ මිය -</u>

**06- 52.** පුස්සැල්ල කොට්ඨාශයට අයත් අංක **127/සී** මෙනේරිපිටිය වසමේ තිරිවාන හන්දියේ සිට මෙනේරිපිටිය පංසල දක්වා මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ජයලාල් මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී බී.එල්. සුධීරා සේමිණී ලියනගේ මිය ගේ යෝජනාව අනුව පුස්සැල්ල කොට්ඨාශයට අයත් අංක 127/සී මෙනේරිපිටිය වසමේ තිරිවාන හන්දියේ සිට මෙනේරිපිටිය පංසල දක්වා මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරිමට මහා සභාවේ ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී බී.එල්. සුධීරා සේමිණී ලියනගේ මිය -</u>

**06- 53. 127/** සී මෙනේරිපිටිය වසමට අදාළ මැලේවත්ත ප්‍රදේශය පදිංචි ඩබ්.එම්. ශිරෝමි විජේරත්න මහත්මියගේ නිවස අසල සිට ජේ. ඒ. ගුණතිලක මහතාගේ නිවස දක්වා පාර කොන්ක්‍රීට් කිරිමට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී බී.එල්. සුධීරා සේමිණී ලියනගේ මිය ගේ යෝජනාව අනුව 127/ සී මෙනේරිපිටිය වසමට අදාළ මැලේවත්ත ප්‍රදේශය පදිංචි ඩබ්.එම්. ශිරෝමි විජේරත්න මහත්මියගේ නිවස අසල සිට ජේ. ඒ. ගුණතිලක මහතාගේ නිවස දක්වා පාර කොන්ක්‍රීට් කිරිමට මහා සභාවේ ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය විසින් කරනු ලබන යෝජනා</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය -</u>

**06-54.** පහලගම වසමේ කැකුණපේ මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය ගේ යෝජනාව අනුව පහලගම වසමේ කැකුණපේ මාර්ගය සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය -

**06- 55.**පහලගම වසමේ ගලඋඩ මුකලාන මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය ගේ යෝජනාව අනුව පහලගම වසමේ ගලඋඩ මුකලාන මාර්ගය සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය -

**06- 56.** එල්ලාවල වසමේ මල්වත්ත මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන විජේසුන්දර මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී කේ.ඩී.චූලා ශාන්ති මිය ගේ යෝජනාව අනුව එල්ලාවල වසමේ මල්වත්ත මාර්ගය සංවර්ධනය කිරිමට මහා සභාවේ ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී .ජස්ටින් රණවීර මහතා විසින් කරනු ලබන යෝජනා
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී .ජස්ටින් රණවීර මහතා -
**06 - 57.**කිතුල්පෙ විහාරස්ථානය අසල පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.වි. ධර්මසිරි මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී .ජස්ටින් රණවීර මහතා ගේ යෝජනාව අනුව කිතුල්පෙ විහාරස්ථානය අසල පොදු ළිඳ ප්‍රතිසංස්කරණය කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී .ජස්ටින් රණවීර මහතා -

**06 – 58** .කිතුල්පෙ පාසැල අසල සිට කොස්ගල දොරළු බඩ මාර්ගයට සම්බන්ධවන මාර්ගයේ ඩි.රංජිත් මහතාගේ නිවස අසල බෝක්කුව දැම්මට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.කේ.වි. ධර්මසිරි මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී .ජස්ටින් රණවීර මහතා ගේ යෝජනාව අනුව කිතුල්පෙ පාසැල අසල සිට කොස්ගල දොරළු බඩ මාර්ගයට සම්බන්ධවන මාර්ගයේ ඩි.රංජිත් මහතාගේ නිවස අසල බෝක්කුව දැම්මට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී .ජස්ටින් රණවීර මහතා -

**06 – 59** . දොරළුබඩ කන්දඋඩ මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩග්ලස් ප්‍රේමදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී .ජස්ටින් රණවීර මහතා -

මේ මාර්ගය කාණු අවහිර වන ලෙස කන්දඋඩට යන මාර්ගයේ බෝක්කුවක් හදලා. වැස්සාම ගෙවල් යටවෙනවා. තාවකාලිකව හෝ වතුර බස්සලා මේ කටයුත්ත කරන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.ජී .ජස්ටින් රණවීර මහතා ගේ යෝජනාව අනුව දොරළුබඩ කන්දඋඩ මාර්ගයේ කාණු පද්ධතිය සකස් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා -

**06- 60 . කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරි වසමේ ගල්ගොඩදෙනිය අළුත්ගෙදර පාරේ 150 මිටර් කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා ගේ යෝජනාව අනුව කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරි වසමේ ගල්ගොඩදෙනිය අළුත්ගෙදර පාරේ 150 මිටර් කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා

**06- 61. කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරි වසමේ පහලගෙදර වත්ත පාර කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා ගේ යෝජනාව අනුව කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරි වසමේ පහලගෙදර වත්ත පාර කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා

**06- 62 . කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරි වසමේ නුගමුලපාර තානායම්ගොඩැල්ල පාරේ බෝධිමළුව කොටස 20 මිටර් පමණ කොන්ක්‍රිට් කිරිමට යෝජනා කරමි.**
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ෂශේන්ද්‍ර සම්පත් රූපසිංහ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා
මේ මාර්ගයේ වාහනයකට යන්න බෑ. හදිසියට ලෙඩෙක් ගෙනියන්න බෑ. කයීන පිංකම ලඟ එනවා. කඩිනමින් සිදු කරන්න.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු ප්‍රාදේශීය සභා <u>මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා ගේ</u> යෝජනාව අනුව කඳන්ගොඩ දකුණ ග්‍රාමනිලධාරි වසමේ නුගමුලපාර තානායම්ගොඩැල්ල පාරේ බෝධිමළුව කොටස 20 මිටර් පමණ කොන්ක්‍රිට් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා විසින් කරනු ලබන යෝජනා</u>**

**06- 63 .කුරුවිට ප්‍රාදේශීය සභා සිමාවේ ඇති නිසි බලපත්‍ර ලබාගෙන නොමැති සම්බාහන ආයතන වසා දැම්මට අවශ්‍ය පියවර ගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා</u>**

**මේක පැවති ආර්ථික අර්බුධයත් එක්ක සිදුවූ දෙයක්. කාන්තාවන් මුදල් ඉපයිමට වෙනත් ක්‍රම හදලා. එහෙම කරන්න තල්ලු වෙලා. දැන්වීම සම්භාහන උනාට කරන්නේ ගණිකා වෘත්තිය. මේවාට පාතාලයත්, මත්ද්‍රව්‍යත් ආදි විවිධ ව්‍යාපාර එකතු වෙලා. බල ප්‍රෙද්ශයටත් පැතිරිලා. පෙර වෛද්‍යවරු පංචකර්ම ක්‍රමයක් ලෙස භාවිතා කල දේ අද වන විට ස්පා හෝටල් විවිධ තැන්වල කිසිදු නිතිමය තත්වයක් නැතිව වසංගතයක් වෙලා. වෛද්‍ය ප්‍රතිකාර නෙමේ වෙන්නේ වෙනත් වෘත්තියක්. තලාවිටිය අවටින් බස්නැවතුමට තරුණියකට නගින්න බෑ. ලැජ්ජයි. දිගටම මේ ස්පා. වැරදි ඇහැකින් ඒ අය දිහාත් බලන්නේ. ඒ නිසා කුරුවිට ප්‍රාදේශීය සභා සිමාවේ ඇති නිසි බලපත්‍ර ලබාගෙන නොමැති සම්බාහන ආයතන වසා දැම්මට අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා</u>**

**මල්කැකුළ සභාපතිතුමාගේ කලේ තීන්දුවක් ගත්තා මේ සීමාවේ ස්පා වලට බලපත්‍ර දෙන්නැ කියලා. නමුත් අපේ සභාව විසුරවපු කාලේ බලපත්‍ර දිලා. එහෙම පුළුවන්ද? ඒ ගත්තු තින්දු බලාත්මක නැද්ද? ඒවා බලාත්මකයි නම් ඒ බලපත්‍ර දුන්නේ කොහොමද සොයා බලන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**මේ ස්ථාන වලට බලපත්‍ර නොදෙන්න තින්දුවක් කලිනුත් ගත්තා. බොරුවට ප්‍රතිකර්ම කියලා මේවායේ වෙන්නේ වෙන දේවල්.දුන්නා නම් අදාල අය වගකියන්න ඕනි. සභාපති අත්සන් නැතිව මේවා දෙන්නත් බෑ. වහාම නවත්තවන්න.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවල මහතා</u>**

**මීටර් සීයෙන් සියට මේ ස්පා. රනිල් ජනාධිපතිගේ කාලේ සභාව නැති කාලේ ගත්ත තීරණ. ඒ කාලේ මේවා වර්ධනය උනේ. මාලිමාව එන්න පෙර ඒවා. නීතිමය කටයුතු කරලා ඉවත් කරන්න.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නයනා ජීවනි අතුකෝරළ මිය-

පසුගිය කාලේ අපි සභාවේ හිටපු කාලේ ඉඩදුන්නේ නෑ මේවා දමන්න. මලවෙත් දාන්න හැදුවා. මංගල මන්ත්‍රීතුමා අපි එකතු වෙලා ඉඩ දුන්නේ නැ. ලොකුම අවාසනාව මේවායේ වැඩ කරන්නේ අවුරුදු 19, 20 දරුවන්. මුදල් නැති නිසා මේවායේ වැඩ කරනවා. මම ලේකම් මහත්තයාගෙන් ඇහුවා. දීලා තියෙන්නේ වෙළඳ බලපත්‍රය විතරයි. මාස තුනකට වතාවක් රුධිරය පරික්ෂාකරන ක්‍රමය මේ කුරුවිට නෑ. පාලනය කරන නීතියක් නෑ. අපි සභාව එකඟ වෙලා නවත්වමු. මේ සම්බන්ධව කඩිනම්ව කටයුතු කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා

කිරිඇල්ලේ එකක් දාන් ගිහින් හාදමුදුරුවෝ කතා කලා. අපි අවසර දීලා නෑ. එවේලෙම ගලවගෙන ගියා. බදුවත්තේ ඉඳන් 15 ක් විතර තියෙනවා. මේ ස්පා. නීතිමය රාමුවක් තුල නිසි ප්‍රතිකාර ක්‍රමයක් විධිහට තිබිය යුතු දෙයක් මුවාවෙන් අකටයුතු වෙනවා. රැවුලක් කපන්නත් බයයි. කුරුවිටත් හැමතැනම තියෙනවා. බස් හෝල්ට් එකක ඉන්න විධිහක් නැ. හැමතැනම. කිරිඇල්ලෙන් නම් අපි ඒවා පැන්නුවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා

අපි දුන්නේ නෑ. පැරඩයිස් දාන්න හැදුවා. අපි බලපත්‍ර දුන්නේ නැ. අපි පොලිසිය සමග ගිහින් නතර කලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා

අතීත ක්‍රමය රෝගවලට හොඳ ප්‍රතිකර්මයක් නමුත් දැන් වෙනස්. පාලනය කරන්න ක්‍රමයක් නෑ. අපි සභාව එකතු වෙලා මේවා නවත්වමු. අවුරුදු 19, 20 ළමයි මේවායේ වැඩ කරනවා. අපේ බෞද්ධ හර පද්ධතියට සංස්කෘතියට විරුද්ධව මේවා වෙන්නේ. දැන් තියෙන සම්බාහන ඒවාට බලපත්‍ර නොදී ඉමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා

යෝජනාව පිලිබඳව ලබාදුන් අදහස් වලට ස්තුතියි.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

පසුගිය දිනෙක ඉල්ලීමක් ආවා. සම්බාහන ආයතයක් දාන්න. මම අවසර දුන්නේ නෑ. මම ආවාට පස්සේ එකකටවත් අවසර දුන්නේ නැ. කලින් දීපුවා තියෙන්නේ. මේවා නවත්වන්න අතුරු ව්‍යස්ථා හදන්න වෙයි. අපි අදාල අංශ දැනුවත් කරලා මේ සම්බන්ධව කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා සීමාවේ ඇති නිසි බලපත්‍ර ලබාගෙන නොමැති සම්බාහන ආයතන වසා දැමීමට අවශ්‍ය ඉදිරි පියවර ගැනීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා

**06- 64.** අම්බලන්ගොඩහේන මාර්ගයේ පැති කාණු පද්ධතිය ඉදිකිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අනුරුද්ධ රංගන මහතා

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා ගේ යෝජනාව අනුව අම්බලන්ගොඩහේන මාර්ගයේ පැති කාණු පද්ධතිය ඉදිකිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා

**06 – 65** .සෙරමික් ආයතනය ඉදිරිපස ඇති මාර්ගයේ පැති කාණුව ඉදිකිරිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චූලා ශාන්ති මිය

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.මහින්ද ගුණසිංහ මහතා ගේ යෝජනාව අනුව සෙරමික් ආයතනය ඉදිරිපස ඇති මාර්ගයේ පැති කාණුව ඉදිකිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ජී. වික්‍රමසූරිය මහතා විසින් කරනු ලබන යෝජනා-

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ජී. වික්‍රමසූරිය මහතා -

**06- 66** . කුරුවිට ප්‍රාදේශීය සභාවේ නොදිරණ ඝණඅපද්‍රව්‍ය රැස්කරන ස්ථානය ආසන්නයේ ඇති ඉඩම් කොටසේ ළමා උද්‍යාණයක් පිහිටුවිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ජී. වික්‍රමසූරිය මහතා -

මේ කටයුත්තට අනුග්‍රාහකයෙකුත් ඉන්නවා. ඉඩකඩ තමා තමයි අවශ්‍ය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

මේ කටයුත්ත හොඳයි. නමුත් ඒ ඉඩම , පරිසරය ස්ථානය සුදුසුද? කසල ගැටළු එයිද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -

මහජන ක්‍රීඩාංගනය අසල බිම සුදුසුයි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

අනුග්‍රාහකයෙකුත් ඉන්න නිසා මේ කටයුත්ත වැදගත්. අපි වඩා සුදුසු ස්ථානයක් පරික්ෂා කරලා බලලා මේ සඳහා ලබා දෙමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ජී. වික්‍රමසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ නොදිරණ ඝණඅපද්‍රව්‍ය රැස්කරන ස්ථානය ආසන්නයේ ඇති ඉඩම් කොටසේ ළමා උද්‍යාණයක් පිහිටුවීමට ලබාදීම සම්බන්ධයෙන් පරික්ෂාකර බලා, ඒ අනුව ළමා උද්‍යාණයක් සැකසීමට වඩාත් සුදුසු ස්ථානයක් ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ජී. වික්‍රමසූරිය මහතා -

**06- 67.** නැගෙනහිර දෙල්ගමුව ආරාමයට යන පාර ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී චූලා ශාන්ති මිය

එම යෝජනාව ස්ථිර කරමි.
ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.එම්.ජී. වික්‍රමසූරිය මහතා ගේ යෝජනාව අනුව නැගෙනහිර දෙල්ගමුව ආරාමයට යන පාර ප්‍රතිසංස්කරණය කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. එන්.එම්. නාපාවල මහතා විසින් කරනු ලබන යෝජනා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. එන්.එම්. නාපාවල මහතා -
**06- 68.** රංදිලිගම පිහිටි ක්‍රීඩා පිටිය ප්‍රාදේශීය සභාවට පවරාගැනිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. එන්.එම්. නාපාවල මහතා -
මේ පිටිය පවරාගෙන අවශය ඉදිකිරිම් සිදුකිරිම කුරුවිටට ආයෝජනයක්. කුරුවිටට පස්සේ තියෙන එකම පිටිය. පැතිබැම්ම දාලා .දරුවන් වෙනුවෙන් ආයෝජනයක්.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

මල්කැකුළ සභාපතිතුමාගේ කාලේ එරත්න පොදු ක්‍රීඩා පිටිය සම්බන්ධව නඩවක් තිබුනා. නඩුව ඉවරද? විශාල වියදමක් දැරුවා. මම ලක්ෂ තුනක් දාලා පිටිය කපනකොට නඩු යන්න උනා. මේ සභාවවට අයත් ක්‍රිඩා පිටි මැනලා වෙන් කරලා සංවර්ධනය කරන්න. සමාජයේ තියෙන නොයෙන් උවදුරු වලට ක්‍රීඩාවත් ප්‍රතිකර්මයක්.
ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -

ආපදාවලින් අවතැන් උන අයට දුන්න ඉඩමේ පුස්සැල්ල වැව්ලි සමාගමෙන්. ඒ පොදු කටයුතු ඉඩමඅපි ජේසිබී දාලා කැපුවා. ඒ දිනවල විරෝධතාවක් තිබුනා. මේ ඉඩම පවරාගන්න පහසුයි. ගැටළු නෑ. ඒ ගැන කටයුතු කරන්න. එරත්න ඉඩමත් ඒ දිනවල නඩුවක් තිබුනා. ඒ සම්බන්ධවත් කටයුතු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දුමින්ද කසුන් අමරසිංහ මහතා

තෙප්පනාව කුමාර විද්‍යාලයේ අසල පිටිය පැතිබැම්ම දාලා හදලා දෙන්න. කපන්නත් ඉඩ තියෙනවා.
ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. එන්.එම්. නාපාවල මහතා ගේ යෝජනාව අනුව
රංදිලිගම පිහිටි ක්‍රීඩා පිටිය ප්‍රාදේශීය සභාවට පවරාගැනිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ජී. එන්.එම්. නාපාවල මහතා -

**06- 69.** වැටුම්මල ප්‍රජාශාලාවේ වහලය අළුත්වැඩියා කිරිමට හා වැසිකිළි පද්ධතියක් සැකසිමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  සම්පත් බොතේජු මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  එන්.ජී. එන්.එම්. නාපාවල මහතා ගේ යෝජනාව අනුව වැටුම්මල ප්‍රජාශාලාවේ වහලය අළුත්වැඩියා කිරිමට හා වැසිකිළි පද්ධතියක් සැකසිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 70.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාල තක්සේරු කටයුතු අවසන් කර ඇති බැවින් විශේෂ දේපල හැර අනෙකුත් දේපල වල වාර්ෂික වටිනාකම අනුව අයවිය යුතු තක්සේරු මුදල වන රු. **2086140.00** ක මුදල තක්සේරු දෙපාර්තුමේන්තුවට ගෙවිම සඳහා මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි

ගරු සභාපති එම්.විකසිත පුෂ්පසූරිය මහතා -

මෙම කරුණ සම්බන්ධයෙන් තක්සේරු දෙපාරතමේන්තුවෙන් දැනුම්දිමක් සිදුකරලා තියෙනවා. ඒ අනුව කුරුවිට ප්‍රාදේශිය සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාල තක්සේරු කටයුතු අවසන් කර ඇති බවත් විශේෂ දේපල හැර අනෙකුත් දේපලවල වාරෂික වටිනාකම අනුව අයවිය යුතු තක්සේරු ගාස්තුව රු. **2,711,140.00** ක් බවත් අත්තිකාරම් වශයෙන් රු. **625000.00** මුදල් ගෙවා ඇති බැවින් විශේෂ දේපල හැර අනෙකුත් දේපලවල තක්සේරු ප්‍රතිශෝධනය වෙනුවෙන් ඉතිරි තක්සේරු මුදල වන රු. **2, 086,140.00** රජයේ තක්සේරු දෙපාරතමේන්තුවට ගෙවිම් සිදුකරන ලෙසත් දැනුම් දීලා.

රු. **2, 086,140.00** මුදල තක්සේරු දෙපාරතමේන්තුව වෙත ගෙවීම සඳහා අවශ්‍ය කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ වරිපනම් ප්‍රතිශෝධනයට අදාල තක්සේරු කටයුතු අවසන් කර ඇති බැවින් විශේෂ දේපල හැර අනෙකුත් දේපල වල වාර්ෂික වටිනාකම අනුව අයවිය යුතු තක්සේරු මුදල වන රු.

**2086140.00** ක මුදල තක්සේරු දෙපාර්තුමේන්තුවට ගෙවීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 71.** කුරුවිට ප්‍රාදේශීය සභාව මගින් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් බදු පදනම මත ලබාගෙන ඇති ඉඩම් කොටස් සඳහා **2014** වර්ෂයේ සිට ගෙවිය යුතු බදු මුදල ලෙස රු. **2626003.42** ක මුදලක් ගෙවීම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.
<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි. තොරතුරු සොයාබලා ගෙවීම් පිළිබඳ කටයුතු කරන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා</u>
අක්කර නමයහමාරක් කැබිනට් අනුමැතියකින් සභාවට පවරලා තියෙනවා. නමුත් අපි දුම්රිය දෙපාර්තුමේන්තුවට බදු ගෙවනවා. **25.08.12** සභාවේ යෝජනා අංක **22** යටතේත් කතාකලා මම. පරණ අම්බලම ගොඩනැගිල්ල සභාව නාගරික සංවර්ධන අධිකාරියට දීලා රෙපෙයාර් කරන්න. බදුත් ගෙවනවා අපි. නමුත් දුම්රිය දෙපාර්තුමේන්තුව ඒක වෙන කෙනෙකුට දීලා. නගරේ තැන තැන බදු දීලා. ඒ ගොඩනැගිල්ල ගැන දුම්රිය දෙපාර්තුමේන්තුව එක්ක සාකච්ජා කරන්න හිටියට ඒක වෙලාත් නෑ. මේ සම්බන්ධව අපි නවරත්න මහත්තයා එක්ක නඩුවක් තියෙනවා. අපි නඩු කියනවා අපිට අයිති නැති ඒ ගොඩනැගිල්ලට. ඒක දුම්රිය දෙපාර්තුමේන්තුව වෙන අයට බදු දීලා. කුරුවිට නගරේ පාක් එක වෙන අයට දීපු එක ගැනත් ප්‍රශ්ණ තියෙනවා. කැබිනට් පේපර් එකකකින් අපට දුන්න එකකට අපි බදු ගෙවන්න ඕනිද? මෙතන **2014** ඉඳන් බදු මුදලක් එකතු වෙලා තියෙනවා.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

නීත්‍යානුකූල බවක් තියෙනවා බදු ගෙව්වොත්. **2014** සිට ගෙවලා නෑ. පුස්සැල්ල පුහුණු මධ්‍යස්ථානය අසළ නෙළුගොල්ල මාර්ගයේ ජලනල එලීම, පොදු වෙළඳපල කඩ කාමර සහිත ඉඩම, තෙමහල් ගොඩනැගිල්ල දෙමහල් ගොඩනැගිල්ල, තනිමහල් ගොඩනැගිල්ල, රථවාහන නැවතුම් ස්ථානය, පුස්සැල්ල ක්‍රීඩා පිටිය හා සායනය, ආදී ලෙස සඳහන්. ගෙවිය යුතු බදු මුදල ලෙස රු. **2626003.42** ක මුදලක් දැනුම් දී තියෙනවා. ගෙවීම් පැහැර හැරීම තුලින් දුම්රිය රක්ෂිතය නැවත එම දෙපාර්තුමේන්තුවට පවරාගැනීමට අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට හෙතු වන බවත් දැනුම් දී තිබෙනවා. එසේම මෙම ගෙවිම පැහැරහැරියොත් අපිට තියෙන අයිතියට නීත්‍යානුකූලබවක් නැතිව යනවා.

ගරු ප්‍රාදේශීය  සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

කැබිනට් පේපර් එකකින් පවරා දුන්න දේකට අපි බදු ගෙව්වාත් අපි බදු කරුවෙක් පමනක් වෙනවා. පුස්සැල්ල ඉඩමට ගෙව්වට ගැටළුවක් නෑ. නමුත් මේ විසිහයලක්ෂ ගානම එකවර ගෙවලා අර අපිට තියෙන අක්කර නමය හමාරට ත් අපි ගෙව්වා වෙනවා. මේ ගැන පළාත් පාලන කොමසාරිස්ගෙන් අහලා නිරාකරණය කරගමු. තවදුරටත් මේක විෂයභාර ඇමතිතුමා එක්ක හරි සාකච්ජා කරන්න.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  එම්. ප්‍රේමරත්න මහතා

අක්කර නමය හමාරට බදු ගෙවන එක සම්බන්ධව ගැටළුවක් තියෙනවා. කැබිනට් පේපර් එක සොයාගන්න. සභාවේ සේප්පුවේ ඇති. පුද්ගලයෙක් අනවසර ඉදිකිරිමක් කරලා නගරේ  සභාව පොලිසි ගියා. ඒ වෙලාවේ දුම්රිය දෙපාර්තුමේන්තුව කියනවා ඒ ඉඩම ඒ අයට බදු දෙන්න තීරණය කරලාළු තියෙන්නේ.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

දුම්රිය ආවොත් අපේ ඒ භූමියේ තියෙන කඩ අහිමි වෙනවාද?

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා -

අහිමි වෙන තැන් වලට වෙනත් වෙළඳ සංකීර්ණ හැදෙනවා. අපි මේ කටයුත්ත කාලයක් අරන් අධ්‍යයනය කරලා කරමු. අපි නොගෙව්වොත්  , වෙන අයට දෙනවද සොයලා බලලා හදිසි ඒවාට ගෙවමු. අපි දැනටමත් නගරේ මැද ගොඩනැගිල්ල ගැනත්  සාකච්ජා  කළා. තව දුරටත් සොයා බලනවා. ඉදිරි සභාව දැනුවත් කරන්නම්.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය  ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාව මගින් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් බදු පදනම මත ලබාගෙන ඇති ඉඩම් කොටස් සඳහා 2014 වර්ෂයේ සිට  ගෙවිය යුතු බදු මුදල  ලෙස රු. 2626003.42 ක  මුදලක්  ගෙවීම සම්බන්ධයෙන් තව දුරටත් අධ්‍යනය කර, අවශ්‍යතාව අනුව ගෙවීම් කටයුතු සිදුකිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**72.** කුරුවිට ප්‍රාදේශීය සභා බල සීමාවේ පිහිටි කරපිංච වතුයායට ජලය ලබාගැනීම සඳහා ජල නල එලීමේදී මාර්ගයට සිදුවන හානිය වෙනුවෙන් රු. **315000.00** ක තැම්පත් මුදලක් තබාගැනීම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

එම යෝජනාව ස්ථිර කරමි. කරපිංචට වතුර ගන්නකොට තැම්පත් මුදලක් තියන්න වෙනවා. රු. **315000.00** ක්. මේ ජනතාව වෙනුවෙන් සහනයක් දෙන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

වතු නිවාස වල ජනතාවට මේ වතුර ඉල්ලන්නේ. මේ වතුර ගන්න **70** ක් **80** ක් විතර ඉන්නවා. කාණු කපන්න වෙන්නේ. පාරට හානියක් උනොත්, කාණු කපලා වැහුවේ නැත්නම් අර මුදලෙන් පියවන්න තමා මුදලක් නියම කරලා තියෙන්නේ. මමත් චන්ද්‍රකුමාර් මන්ත්‍රීතුමාත් ඒ වගකීම දරනවා. පාරට යම් හානියක් උනොත් ගෙවිය යුතු මුදල අපි ගෙවනවා. මේ ඇප මුදලෙන් නිදහස්ව මේ කටයුත්තට අවසර දෙන්න. අපි වගකීම දරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා -

කරපිංච හන්දියේ . අඩි **7, 8** කොන්ක්‍රීට් කෑල්ලක් තියෙනවා. ඒ ටික විතරයි කැඩෙන්නේ. ඇප තැම්පතුවෙන් නිදහස් කර දෙන්න. අපි වගකීම දරනවා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මාර්ග හානිය අවම වන ක්‍රමවේදයක් අනුව කරමු. මේ ක ආදර්ශයට අරන් තවත් අය ඉල්ලුවොත් අර්බුධයක් වෙනවා. ඒ නිසා මෙය මේ කටයුත්ත කරන්න සුදුසුම තැන නිසා අනුමැතිය දෙමු. ආදර්ශයක් විධිහට නොයා ඉමු. මේ සම්බන්ධව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා වගකීම දරන බවට ප්‍රකාශ කලා. ක්‍රමවේදය සකසලා මේ කටයුත්ත සම්බන්ධයෙන් ඇප තැම්පතුවෙන් තොරව ඉදිරි කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බල සීමාවේ පිහිටි කරපිංච වතුයායට ජලය ලබාගැනීම සඳහා ජල නල එලීමේදී මාර්ගයට සිදුවන හානිය වෙනුවෙන් රු. 315000.00 ක තැම්පත් මුදලක් තබාගැනීම සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.චන්ද්‍රකුමාර් මහතා විසින්, යම් මාර්ග හානියක් උවහොත් ඒ සම්බන්ධව තමන් විසින් වගකියනු ලබන බව දැනුම් දුන් අතර ඒ අනුව අවශ්‍ය ක්‍රමවේදය සකසා ඇප තැම්පතුවෙන් තොරව මෙම කටයුත්ත සිදුකිරිමට අනුමැතිය ලබාදිමට අනුමැතිය ලබා දීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06- 73.** **කුරුවිට,හේනේපොල සිට කඳංගොඩ දක්වා ගමන්කල හැකි මාර්ගය රාජකීයපණ්ඩිත පූජ්‍යපාද මඩලගම වජිරබුද්ධි හිමි නාමයෙන් නම්කිරිම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**
**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලීන් අධිකාරම් මහතා</u>**
**මම පන්සලට ගිය අවස්ථාවේ මේ සම්බන්ධව විමසුවා. ඒ නායක හාමුදුරුවෝ ප්‍රදේශයට විශාල සේවාවක් කලා. මේ මාර්ගය මිල්ලවිටියෙන් ආරම්භ වී ලෙල්ලාගොඩ පාර ඕවිටිගම දක්වා ඇති මාර්ගයේ මීටර් ½ පමන එනවිට හමුවන හේනේපොල කඳංගොඩ දක්වා ගමන්කලහැකි මාර්ගයයි. හාමුදුරුවන්ගේ නමින් මාර්ගය නම්කල යුතු යයි ජනතාවගේ ඉල්ලීම. ඉල්ලිම මිල්ලවිටිය දර්ශන සුබසාධක සමිතිය විසින් සිදුකර ඇත. මේ කටයුත්ත සිදුකිරීම ඉතාමත් සුදුසුයි. ඉදිරි කටයුතු කරමු.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්.ජයසේකර මහතා -</u>**

**රාජකීයපණ්ඩිත පූජ්‍යපාද මඩලගම වජිරබුද්ධි හිමි මගේ පන්ති භාර ගුරුතුමා. මිල්ලවිටිය විහාරෙට යන්න පෙර කඳංගොඩ ශ්‍රී විසුද්ධාරාමයේ වැඩ හිටියා. ඒ අතීතයේ සිටම දායක පවුල් ලෙස අපිත් සමග කටයුතු කලා. 70 දශකයේ පාර්ලිමේන්තු මන්ත්‍රී සරත් මුත්තෙට්ටුවේ ගම මැතිතුමා, නන්ද එල්ලාවල මැතිතුමා , ආදි අය එක්ව හේනේපොල බටහිර කඳංගොඩ හරහා ලෙල්ලගොඩ දක්වා පාරක් කැපුවා. ඒක දියුණු කලා. පාරට පළල මදි තැන් වලින් ඒ අය එක්ක කතා කරලා ඉඩ ගත්තා. ඒ අවස්ථාවේ බොහෝ කටයුතු කලා විනී මනම්පේරි මහතා. මේ කටයුතු වලදි ජීවිත පරිත්‍යාග පවා තිබුණා. කෙසේ වෙතත් හැම පාරක්ම සකසලා මඩලගම වජිරබුද්ධි හිමි විශාල සේවාවක් කලා. ඒවායේ ප්‍රතිපල විධිහට තමා පසුකාලිනව ඒ මාර්ග කොන්ක්‍රිට් කරලා, විදුලිය අරන් අද මේ තත්වයේ තියෙන්නේ. ඒ නිසා මේ මාර්ගය නම් කිරිම ඉතා වැදගත්.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

කුරුවිට,හේනේපොල සිට කඳංගොඩ දක්වා ගමන්කල හැකි මාර්ගය රාජකීයපණ්ඩිත පූජ්‍යපාද මඩලගම වජිරබුද්ධි හිමි නාමයෙන් නම්කිරිම සම්බන්ධව ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට,හේනේපොල සිට කඳංගොඩ දක්වා ගමන්කල හැකි මාර්ගය රාජකීයපණ්ඩිත පූජ්‍යපාද මඩලගම වජිරබුද්ධි හිමි නාමයෙන් නම්කිරිම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

06- 74. කුරුවිට ප්‍රාදේශීය සභාවේ රු.20000.00 ට අඩු මිලදීගැනීම් වලදී ප්‍රසම්පාදන කටයුතු සඳහා පොදු ප්‍රසම්පාදන කමිටුවක් පත්කරගැනීමට මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

දැනට ප්‍රසම්පාදන කටයුතු සඳහා මුදල් කමිටු ව ප්‍රසම්පාදන කමිටුව ලෙස කටයුතු කරන අතර රු. 20000.00 ට වඩා අඩු ලෙස නිතර සිදුකෙරෙන මිලදී ගැනීම් ආදියට ප්‍රසම්පාදන කමිටුව කැඳවා ගැනීම නිතර සිදුකිරිම ප්‍රායෝගිකව අසීරු කටයුත්තකි. ඒ අනුව රු. 20000.00 ට වඩා අඩු මිලදීගැනිම් සඳහා ප්‍රසම්පාදන කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කිරීමට ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා, ලේකම් වරයා, කාර්මික නිලධාරි මනමේන්ද්‍ර මිය, ප්‍රධාන කළමණාකරනසහකාර, ආදායම් පරිපාලක ගෙන් සමන්විත පිරිස යොදාගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ රු.20000.00 ට අඩු මිලදීගැනීම් වලදී ප්‍රසම්පාදන කටයුතු සඳහා පොදු ප්‍රසම්පාදන කමිටුවක් පත්කරගැනීමටත් එහි කමිටු සාමාජිකයින් ලෙස ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා, ලේකම් වරයා, කාර්මික නිලධාරි, ප්‍රධාන කළමණාකරනසහකාර, ආදායම් පරිපාලක ගෙන් සමන්විත පිරිස පත් කිරිමටත් ඒකමතිකව සභා තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 75. 2026 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව සතු දේපල හා වෙළඳ අයිතින් බදු ලබාදීම සඳහා මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි. පසුගිය සභාවල සිදුකල ආකාරයෙන් කරන්න. හරක් යන්න වෙනුවට ගව ලෙස යොදන්න.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

දැනට පවතින ක්‍රමවේදය අනුව **10%** එකතු කර අයකිරීම සිදු කරමු. ඒ අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් දේපල හා වෙළඳ අයිතීන් **2026** වර්ෂයට අදාලව වාර්ෂික බදු පදනම මත බදු ලබාදිය යුතුවේ.

**01.** කුරුවිට සතිපොළ

**02.** වාණිජ A එළහරක්මස් වෙළඳසැල

**03.** වාණිජ A එළු හා කුකුළු මස් වෙළඳසැල

**04.** වාණිජ A සංකීර්ණයේ පිහිටි ධීවර සංස්ථා මාළු අලෙවි සැල

**05.** කිරිඇල්ල පොදු වෙළඳ සංකීර්ණයේ එළහරක් මස් වෙළඳ සැල

**06.** කිරිඇල්ල පොදු වෙළඳ සංකීර්ණයේ මාළු වෙළඳසැල

**07.** කුරුවිට නගරයේ මහ පාලම අසල මහජන වැසිකිළිය

**08.** බෝපත් ඇල්ල රථ ගාල

- ඉහත සඳහන් වාර්ෂික බදු පදනම මත ලබාදෙනු ලබන දේපල සඳහා **2025** වර්ෂයට අදාලව ටෙන්ඩර් ගත වූ මුදල හා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැම්පත් මුදල ටෙන්ඩර් පෝරම ගාස්තුව පහත පරිදි වේ.

| දේපළ නාමය | **2025** වර්ෂයේ ටෙන්ඩර් ගතවූ මුදල | **2026** වර්ෂය සඳහා **10%**එකතු කර අය කල යුතු මුදල | ටෙන්ඩර් පෝරම ගාස්තු | ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇප තැන්පත් මුදල |
|---|---|---|---|---|
| කුරුවිට සතිපොළ | **636,800.00/=** | **700,480.00** | **5000.00/=** | **5000.00/=** |

| | | | | |
|---|---|---|---|---|
| වාණිජ A එළහරක්මස් වෙළඳසැල | **960,000.00/=** | **1,056,000.00** | **5000.00/=** | **5000.00/=** |
| වාණිජ A එළු හා කුකුළු මස් වෙළඳසැල | **177,500.00/=** | **195,250.00** | **5000.00/=** | **5000.00/=** |
| කිරිඇල්ල එළ හරක් මස් වෙළඳසැල | **308,500.00/=** | **339,350.00.** | **5000.00/=** | **5000.00/=** |
| කිරිඇල්ල මාළු වෙළඳසැල | **92,550.00/=** | **101,805.00** | **5000.00/=** | **5000.00/=** |
| කුරුවිට නගරයේ මහ පාලම අසල මහ ජන වැසිකිළිය | රජයේතක්සේරු මුදල **(රු.15000.00)** ටෙන්ඩර්ගත වූ මුදල මාසික **රු.1300.00)** | **-** | **5000.00/=** | **5000.00/=** |
| බෝපත් ඇල්ල රථ ගාල | තක්සේරු මුදල **(රු.11,500.00)** | **-** | **5000.00/=** | **5000.00/=** |

- කුරුවිට එළ හරක් මස්වෙළඳ සැළ බදු ලබා දීමේදී ප්‍රාදේශීය සභා බල ප්‍ර දේශයේ පිහිටි අනුමත සෝගාතකාගාර වලින් පමණක් මස් ලබා ගන්නා අයට ටෙන්ඩර් පත් නිකුත් කිරීමට **2022.09.09** දිනැති මහා සභාවේ තීරණ අංක **5-20** සහා තීරණය යටතේ සභා සම්මත කර ඇත.
- ලංකා ධිවර සංස්ථා මාළු අලෙවිසැල පෙර වර්ෂ වලදී ටෙන්ඩර් කර නොමැති අතර එකී වාර්ෂික බදු මුදලට **10%** ක මුදලක් එකතු කර බදු ලබා දී ඇත. ඒ අනුව එම වෙළඳ සැල සඳහා **2025** වර්ෂයට අදාලව අයකල යුතු මුදල **රු.531,023.19** කි.
- **2026** වර්ෂයට අදාලව දේපල බදු ලබා දීමේදී අයකල යුතු ටෙන්ඩර් පෝරම ගාස්තුව, ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇපතැම්පත් මුදල තීරණය කිරීම. ( **2025** වර්ෂයේ ටෙන්ඩර් පෝරම ගාස්තුව **රු.5000.00** ක් හා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් ඇපතැම්පත් මුදල **රු.5000.00** කි.
- කුරුවිට සති පොල කඩ මැසිසඳහා පොළ පැවැත්වෙන එක් දිනකට **රු.170.00**
- කුරුවිට නගරයේ මහජන වැසිකිළිය සඳහා එක් පුද්ගලයෙකුගෙන් අයකරන ගාස්තුව **රු.20.00**

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව **2026** වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව සතු දේපල හා වෙළඳ අයිතින් බදු ලබාදීමේදී ඉහත වගුවේ **2026** වර්ෂයට අදාලව දක්වා ඇති අවම ලංසු මුදල යටතේ ටෙන්ඩර් කැඳවීමටද ලංකා ධිවර සංස්ථා මාළු

**අලෙවිසැල 2025 වර්ෂයේදි ලබාදුන් මුදල වන රු.531,023.19 ට අවම ලංසු මුදල ලෙස සලකා ටෙන්ඩර් කැඳවීමටද ටෙන්ඩර් පෝරම ගාස්තුව සඳහා 2025 වර්ෂයේ අදාල ගාස්තුව වන රු. 5000.00 ක් ලෙසම අයකිරිමටද ටෙන්ඩර් ඇප තැම්පතු මුදල ද 2025 වර්ෂයේ ගාස්තුව වන රු. 5000.00 ලෙසම අයකිරිමටද දේපල බදු ලබාදීමේදි ටෙන්ඩර් දැන්වීම භාෂා ත්‍රිත්වයෙන්ම සිදු කිරීමටද ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06-76. කිරිබත්ගල කුරුවිට මාර්ගය සඳහා බස් රථයක් යෙදවීමට නව මාර්ග බලපත්‍රයක් ලබාදීම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
**එම යෝජනාව ස්ථිර කරමි.**
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>
**සබරගමු මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය විසින් මේ මාර්ගයට ටෙන්ඩර් ක්‍රමවේදය යටතේ නව මාර්ග බලපත්‍රයක් ලබාදීමට කටයුතු කරලා. මේ සම්බන්ධව නිර්දේශයක් ඉල්ලලා. මාර්ගය සම්බන්ධයෙන් කාර්මික නිලධාරි වාර්තාවක් ලබාදි තියෙනවා. ඒ අනුව සභා අනුමැතිය දන්වා අරිමු.**
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා -</u>
ගලුකාගම කොට්ඨාශයේ හැරණියාවක අවුරුදු හතරකට පහකට පෙර බස් රථයක් ගියා. වැරණියගොඩ දක්වා. දැන් නැවතිලා. ඒ බස් රථය සේවාව නැවත දෙන්න. මාර්ගය කාපට් කරපු එකක්. සුදුසු තත්වයේ තියෙනවා. ක්‍රමවේදයට වෙනත් අයෙකුට හරි දීලා මේ මාර්ගයට බස් රථයක් ලබාදෙන්න. ජනතාවගේ ඉල්ලීමක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-</u>
**මෙනේරිපිටිය, අඹගහහන්දිය සිට වටප්පිටිය හරහා අමුහේන්කන්ද ,ඇහැලියගොඩ දක්වා ගමන්කල බස්රථය දැන් ධාවනය වෙන්නේ නෑ. ඒ සම්බන්ධව දැනුම්දීලා ඒ බස් රථයේත් සේවය ලබාදෙන්න.**

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සම්පත් බොතේජු මහතා-</u>
වලදූර යහලකොට්ටුන්න පුද්ගලික බස්රථ සේවය අඩපන වෙලා. උදේ සවස සේවයේ යොදවන්න ලංගම බස් රථයක් දෙන්න.
<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා-</u>
**අපි ප්‍රවාහන අධිකාරිය එක්ක කතා කරලා බස් රථයක් ඒ පාරට දමන්න හැදුවා. නමුත් දේශපාලන බලය මත ඒ රථය වෙන පාරකට දාලා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී නිරෝෂා ලියනගේ මිය.

වලඳුර යහලකොට්ටුන්න බස් රථය දැනට ධාවනය වෙන්නේ නෑ. මේ සම්බන්ධයෙන් අදාල අංශ වලට දැනුම් දුන්නා. සති දෙකක් තුල දැනුම් දෙයි. ප්‍රදේශයේම දෙදෙනෙක් මාර්ගයේ බස්රථයක් ධාවනය කරන්න ඉල්ලනවා. ජනවාරි සිට ලංගම බස් රථ සේවයක් ක්‍රියාත්මක විමට නියමිතයි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

සබරගමු මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියට කිරිබත්ගල කුරුවිට මාර්ගය සඳහා බස් රථයක් යෙදවීමට අනුමැතිය යවමු. අනෙක් ඉල්ලීම් සම්බන්ධවත් දැනුම් දෙන්න.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කිරිබත්ගල කුරුවිට මාර්ගය සඳහා බස් රථයක් යෙදවීමට නව මාර්ග බලපත්‍රයක් ලබාදීම සම්බන්ධව අනුමැතිය ලබාදීමට හා බස් රථ සේවය සම්බන්ධ අනෙකුත් ඉල්ලීම් ද සබරගමු මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය වෙත දන්වා යැවීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 77 .** කුරුවිට ,පුස්සැල්ල ,පරකඩුව පිහිටි ර/චෛතියගිරි පිරිවෙන් විහාර්ස්ථානයට යන මාර්ගය පූජ්‍ය රත්නපුරේ මංගල ස්වාමීන්ද්‍ර පිරිවෙන් මාවත ලෙස නම්කිරිම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මේ සම්බන්ධව ඉල්ලීමක් ර/චෛතියගිරි පිරිවෙනේ විහාරාධිපති හිමියන් විසින් ඉදිරිපත් කර තියෙනවා. මේ පිලිබඳව අවශ්‍ය තොරතුරු ලබාගෙ කුරුවිට, පුස්සැල්ල, පරකඩුව පිහිටි ර/චෛතියගිරි පිරිවෙන් විහාරස්ථානයට යන මාර්ගය පූජ්‍ය රත්නපුරේ මංගල ස්වාමීන්ද්‍ර පිරිවෙන් මාවත ලෙස නම්කිරිමට අවශ්‍ය ඉදිරි කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට , පුස්සැල්ල , පරකඩුව පිහිටි ර/චෛතියගිරි පිරිවෙන් විහාරස්ථානයට යන මාර්ගය පූජ්‍ය රත්නපුරේ මංගල ස්වාමීන්ද්‍ර පිරිවෙන් මාවත ලෙස නම්කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 78. 2026** වර්ෂයට අදාළව කුරුවිට ප්‍රාදේශීය සභාවට භාණ්ඩ හා සේවා සැපයිම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමට හා ඒ සම්බන්ධව පුවත්පත්වල පළකිරිමට මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>
එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**2026** වර්ෂයට අදාළව කුරුවිට ප්‍රාදේශීය සභාවට භාණ්ඩ හා සේවා සැපයිම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමට හා ඒ සම්බන්ධව පුවත්පත්වල පළකිරිමට අවශ්‍ය කටයුතු කරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතාගේ යෝජනාව අනුව **2026** වර්ෂයට අදාළව කුරුවිට ප්‍රාදේශීය සභාවට භාණ්ඩ හා සේවා සැපයිම සඳහා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරිමට හා ඒ සම්බන්ධව පුවත්පත්වල පළකිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06- 79.** කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සඳහා වාර්ෂික පොත්මිලදි ගැනීම යටතේ **2025** වර්ෂයට වෙන්කර ඇති රු. **1000000.00** ක මුදලින්, පාඨක ඉල්ලිම් අනුව දයාවංශ, ගොඩගේ, සරසවි,සුසර ,සූරස, සූරිය, අධ්‍යාපන පොත් ප්‍රකාශක මණ්ඩලය,විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය යන ආයතනවලින් හෝ සුදුසු ප්‍රසිද්ධ පොත් අලෙවි ආයතන වලන් අවම වශයෙන් තුනකින් වන පරිදි ග්‍රන්ථ මිලදීගැනීම සඳහා මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සඳහා වාර්ෂික පොත්මිලදි ගැනීම යටතේ 2025 වර්ෂයට වෙන්කර ඇති රු. 1000000.00 ක මුදලින්, පාඨක ඉල්ලීම් අනුව දයාවංශ, ගොඩගේ, සරසවි,සුසර ,සුරස, සූරිය, අධ්‍යාපන පොත් ප්‍රකාශක මණ්ඩලය,විජේසූරිය ග්‍රන්ථ කේන්ද්‍රය යන ආයතනවලින් හෝ සුදුසු ප්‍රසිද්ධ පොත් අලෙවි ආයතන වලින් අවම වශයෙන් තුනකින් වන පරිදි ග්‍රන්ථ මිලදීගැනීම ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

06- 80. කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත්, බදු ලබාදී ඇති, කඩ අහිමි වී ඇති හා ඉල්ලුම්කර ඇති කඩ කාමර සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කිරිම සඳහා කමිටුවක් පත්කොට කටයුතු කිරීමට මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත්, බදු ලබාදී ඇති, කඩ අහිමි වී ඇති හා ඉල්ලුම්කර ඇති කඩ කාමර සම්බන්ධයෙන් ගැටළු රැසක් පවතින නිසා ඒ සම්බන්ධව කටයුතු කරන්න තමයි මේ කමිටුව පත් කිරීමේ අරමුණ.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

මේ කමිටුවට සාමාජිකයින් ලෙස ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් වික්‍රමසූරිය මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා පත් කරමු. එසේම ප්‍රාදේශීය සභාවේ ලේකම් වරයා , ආදායම් පරිපාලකවරයා, කාර්මික නිලධාරීවරයා වද ඇතුලත් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා

ගරු උපසභාපති අනිල් ලියනගේ මහතාවත් පත්කරමු.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත්, බදු ලබාදී ඇති, කඩ අහිමි වී ඇති හා ඉල්ලුම්කර ඇති කඩ කාමර සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කිරිම සඳහා පත් කල කමිටුවට සාමාජිකයින් ලෙස සභාපතිවරයා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් වික්‍රමසූරිය මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා ,ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා,
ප්‍රාදේශීය සභාවේ ලේකම් වරයා , ආදායම් පරිපාලකවරයා සහ කාර්මික නිලධාරීවරයා වද ඇතුලත් කරගමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත්, බදු ලබාදී ඇති, කඩ අහිමි වී ඇති හා ඉල්ලුම්කර ඇති කඩ කාමර සම්බන්ධයෙන් පවතින ගැටළු නිරාකරණය කිරිම සඳහා කමිටුවක් පත්කොට කටයුතු කිරීමටත් එම කමිටුවේ සාමාජිකයින් ලෙස ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කපිල අබේසිරි මුණසිංහ මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් වික්‍රමසූරිය මහතා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා ,ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා, ප්‍රාදේශීය සභාවේ ලේකම් වරයා , ආදායම් පරිපාලකවරයා සහ කාර්මික නිලධාරීවරයා ඇතුලත් කොට කටයුතු කිරීමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 81. 1987** අංක **15** දරණ ප්‍රාදේශීය සභා පනතේ **147 – 149 -152 ( i )** හා **150 ( i)** වගන්ති යටතේ **2026** වර්ෂයට කුරුවිට ප්‍රාදේශීය සභාවේ ගාස්තු අයකරනු ලබන වෙළඳ බලපත්‍ර/ ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළකිරිම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය  සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -

එම යෝජනාව ස්ථිර කරමි.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

මෙහි ව්‍යාපාර බදු අංක 38 යටතේ ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන සඳහන්.

ගරු ප්‍රාදේශීය  සභා මන්ත්‍රී  එම්. ප්‍රේමරත්න මහතා -

මේ ව්‍යාපාරය නීත්‍යානුකූලව අදාල ප්‍රමිතියෙන් යුක්තව සිදුකලොත් බලපත්‍රයක් ලබාදීමේ හැකියාව සභාව සතුවිය යුතුයි. නැත්නම්  ව්‍යාපාරය හිමි අයට නීතිය ඉදිරියට යා හැකියි. ඒ නිසා නීත්‍යානුකූලව සිදුකරන ව්‍යාපාරයකට සභා තීරණයක් ගෙන බලපත්‍ර නිකුත් කරනවාද? නැද්ද? තීරණය කරමු. ඒ බව සඳහන් කරන්න.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

ආයුර්වේද සම්බාහන මධ්‍යස්ථාන සම්බන්ධව සභා තීරන ගෙන කටයුතු කරමු. එම ව්‍යාපාරයට මහා සභා අනුමැතිය ලබාගැනීම අනිවාර්ය කරමු.

ඒ අනුව 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වැනි වගන්තිය හා 149 වැනි වගන්ති යටතේ ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ හෝ එකි පනත යටතේ සාදන ලද අතුරු ව්‍යවස්ථාවක විස්තර කර ඇති මෙහි උප ලේඛනයෙහි I වන තිරුවේ නිරූපිත යම් කාර්යක් සඳහා කුරුවිට ප්‍රාදේශීය සභා ප්‍රදේශය ඇතුලත යම් ස්ථානයක්  හෝ පරිශ්‍රයක් පාවිච්චි කිරීමට බලය දෙමින් 2026 වර්ෂයේ නිකුත් කරනු ලබන යම් බලපත්‍රයක් සම්බන්ධයෙන් උපලේඛනයෙහි IIවන තීරුවේ අනුරූප සටහනේ නිරූපිත බලපත්‍ර ගාස්තුවක් 2026 වර්ෂය සඳහා නියම විය යුතු බවටද, තවද එකීස්ථානය හෝ පරිශ්‍රය 1968 අංක 14 දරණ සංචාරක මණ්ඩල පනතේ කාර්යය සඳහා සංචාරක මණ්ඩලයේ අනුමත කර ඇති, පිළිගෙන ඇති හෝටලයක් , ආපන ශාලාවක්,නවාතැන්පලක් වන විටදී, එය අදාල බලපත්‍ර ලබා දිමේදි එම ස්ථානයේ හෝ පරිශ්‍රයේ 2025 වර්ෂයේ ලැබීම් වලින් 1%ක බලපත්‍ර ගාස්තුවක් ලෙස 2026 වර්ෂය සඳහා නියම විය යුතු බව තීරණය කරමු. උපලේඛණය පහත පරිදි වේ.

| අනු අංකය | I වන තීරුව<br>බලය දෙනු ලබන කාර්යය | II වන තීරුව<br>පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750. 00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ට ඉක්මවන එහෙත් 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 1 | සිල්ලර වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| 2 | ආහාර සැපයුම් ස්ථාන පවත්වාගෙන යාම ( බේකරි /කේටරින්/පීසා හට්/ආපනශාලා) | 500.00 | 750.00 | 1000.00 |
| 3 | තේ,කෝපි කඩ,කෙටි ආහාර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 4 | හෝටල් | 500.00 | 750.00 | 1000.00 |
| 5 | උත්සවශාලා | 500.00 | 750.00 | 1000.00 |
| 6 | එළවළු/පළතුරු අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| 7 | ගල්වලවල්/ගල් ඇඹරුම්හල් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 8 | ආහාර පිණිස සතුන් ඝාතනය කිරීම හා ඝාතනය සඳහා රඳවා තබා ගන්නා ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 9 | මස් විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | මාළු විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 11 | රූපලාවන්‍ය මධ්‍යස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 12 | ලැඟුම්හලක් /නවාතැන්පලක්/නිවාඩු නිකේතන | 500.00 | 750.00 | 1000.00 |
| 13 | සංචාරක වෙළඳාම | 500.00 | 750.00 | 1000.00 |
| | අප්‍රසන්න වෙළඳාම | | | |

| | | | | |
|---|---|---|---|---|
| 1. | මිනිරන් ශුද්ධ කිරීම හා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම (සිල්ලර) | 500.00 | 750.00 | 1000.00 |
| 3. | සම් පදම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 4. | රබර් නිෂ්පාදනය කිරීම හෝ රබර් රොටී තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 5. | රබර් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 6. | ඔට්ටපාලු ගබඩා කර තබා ගැනීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. | පොල්කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 8. | සත්ව ආහාර නිපදවීම,ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 9. | සබන් නිෂ්පාදනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | අලුත් ලෝහ හෝ පරණ ලෝහ මිලට ගැනීම හෝ ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | ලෝහ සුන්බුන් හා අබලි ද්‍රව්‍ය මිලයට ගැනීම හෝ ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ඔප දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | වේවැල් භාණ්ඩ නිපදවීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | වඩු කර්මාන්තශාලාවක් පවත්වා ගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | පොල් ලෙලි පෙඟවීම ( පල් කිරීම) | 500.00 | 750.00 | 1000.00 |
| 16. | බුරුසු වර්ග නිපදවීම( දත් බුරුසු හැර) | 500.00 | 750.00 | 1000.00 |
| 17. | පින්තාරු තීන්ත,වාර්නිස් හෝ ඩිස්ටෙම්පර් නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 18. | කෙදි සායම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | සම් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ නැවත ඇසිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | ගෑස් මැන්ටල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 22. | පොටි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | කපුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 24. | ලියන තීන්ත,අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 25. | රෙදි සෝදන නිල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 26. | ලාකඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 27. | සුවඳ විලවුන් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 28. | පාසල් රටහුණු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 29. | ටයර් හෝ ටියුබ් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 30. | ටයර් නැවත පිරවීම | 500.00 | 750.00 | 1000.00 |
| 31. | ටයර්,ටියුබ් වෝල්කනයිස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 32. | සිමෙන්ති ගබඩා කිරීම,ඇස්බැස්ටස් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 33. | සිමෙන්ති භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 34. | වැලි කඩදාසි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 35. | ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 36. | ගඩොල් පිළිස්සීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 37. | යන්ත්‍රානුසාරයෙන් රෙදි විවීම | 500.00 | 750.00 | 1000.00 |
| 38. | භාවිතයට ගත් ගෝනි,බැරල් හා භාජන පිරිසිදු කර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 39. | යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 40. | කුරුඳු,කරදමුංගු වේලා සකස් කිරීම හා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 41. | ගම් වර්ග නිපදවීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 42. | විෂබීජනාශක වර්ග නිෂ්පාදනය හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 43. | බැටරි පිරවීමේ හෝ ගබඩා කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 44. | පරණ බෝතල් එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 45. | අවමංගල සේවාවක් පවත්නාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 46. | මැණික් කැපීම හෝ ඔප දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 47. | | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | පිටි හෝ කුළුබඩු ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | | | |
| 48. | ධාන්‍ය වර්ග ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 49. | පොලිතීන් හෝ ඒ ආශ්‍රිත නිෂ්පාදන කිරීම හෝ විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 50. | සපත්තු නිෂ්පාදනය හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 51. | ඉටිපන්දම් නිෂ්පාදනය හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| | | | | |
| | අන්තරාදායක ව්‍යාපාර | | | |
| | | | | |
| | | | | |
| 1. | යාන්ත්‍රික බලයෙන් දැව ඉරීම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | කොප්පරා නිපදවීම හා ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 3. | යන්ත්‍රානුසාරයෙන් පොල්තෙල් හෝ වෙනත් යම් තෙල් වර්ගයක් සිඳීම හෝ ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 4. | පුළුන් ගබඩා කර තබා ගැනීම හා ඒ ආශ්‍රිත නිෂ්පාදන සකස් කර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 5. | ගිනිපෙට්ටි නිෂ්පාදනය හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 7. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 8. | කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් භාණ්ඩ නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 9. | පාවිච්චි කළ ඇඳුම් ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | ස්වර්ණාභරණ නිෂ්පාදනය හා අළුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | දර විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 12. | උළු හා ගඩොල් ගබඩා කර තබා ගැනීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 13. | දැව ආශ්‍රිත ලෑලි නිෂ්පාදනය හා දැව කුඩු ආශ්‍රිත නිෂ්පාදන | 500.00 | 750.00 | 1000.00 |
| 14. | කාඩ්බෝඩ් හා කඩදාසි භාවිතයෙන් කරන නිෂ්පාදන ගබඩා කර තබා ගැනීම හා විකිණීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | ගල් හා පතුරු ගල්ආශ්‍රයෙන් කරන කර්මාන්ත | 500.00 | 750.00 | 1000.00 |
| 16. | මැටි හා මැටි ආශ්‍රිත කර්මාන්ත | 500.00 | 750.00 | 1000.00 |
| 17. | නිමි ඇඳුම් නිෂ්පාදන ආයතන | 500.00 | 750.00 | 1000.00 |
| 18. | රසායන ආශ්‍රිත රෙදි නිෂ්පාදන කර්මාන්ත | 500.00 | 750.00 | 1000.00 |
| 19. | රෙදි සේදීමේ ස්ථාන | 500.00 | 750.00 | 1000.00 |
| 20. | බීඩි නිෂ්පාදන හා ගබඩා කර තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | වාහන අලුත්වැඩියා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 22. | වාහනවල බඳ කොටස අලුත්වැඩියා කර තීන්ත ආලේප කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | වාහන සේවා කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | මුද්‍රණාලයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 25. | පරණ පත්තර හා කඩදාසි එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 26. | විසිරි පින්තාරු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 27. | ලෝහ සංස්කාර්යය කර්මාන්ත යන්ත්‍රෝපකරණ,ආයුධ,උපකරණ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| | <u>අප්‍රසන්න හා අන්තරාදායක ව්‍යාපාර.</u> | | | |
| 1. | ඩ්‍රයි ක්ලීන් කිරීම හෝ සායම් දැමීම | 500.00 | 750.00 | 1000.00 |
| 2. | රෙදි මුද්‍රණය කිරීම ,සායම් කිරීම හෝ බතික් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 3. | විද්‍යුත් ලෝහ ආලේපනය කිරීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 4. | තෙල් හෝ සත්ත්ව මේද නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 5. | හුණුගල් හෝ හිරිගල් පිලිස්සීම | 500.00 | 750.00 | 1000.00 |
| 6. | ගිනිකෙලි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 7. | ෆයිබර් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 8. | බැටරි විදුලිත් ආරෝපණය කිරීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 9. | ලෝහ වර්ග පෑස්සවීම | 500.00 | 750.00 | 1000.00 |
| 10. | යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 11. | වාත්තු වැඩපලක් පවත්වාගෙන යාම (වෑල්ඩින් වැඩපල) | 500.00 | 750.00 | 1000.00 |
| 12. | බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 13. | මෝටර් වාහන බොඩි තැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 14. | කෘමිනාශක,දිලීරනාශක,පැලෑටිනාශක හෝ පළිබෝධනාශක නිපදවීම හෝ නැවත පිරවීම | 500.00 | 750.00 | 1000.00 |
| 15. | විෂබීජනාශක නිපදවීම හා මදුරු දගර නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 16. | දැව ආරක්ෂණ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 17. | ගල්තාර හා සිමෙන්ති ආශ්‍රිත පූර්ව සැකසුම් මධ්‍යස්ථානය | 500.00 | 750.00 | 1000.00 |
| 18. | වීදුරු භාණ්ඩ නිපදවීම හා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 19. | යකඩ තහඩු ගැල්වනයිස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 20. | පාස්සන ඊයම් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 21. | කටුකම්බි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 22. | කම්බි ඇණ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 23. | කාබන් කඩදාසි හෝ යතුරු ලියන රිබන් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 24. | බෙලෙක් බඳුන්,වානේ පීප්ප හෝ කාබන් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 25. | ජී.අයි.බාල්දි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 26. | වායු සමන යන්ත්‍ර,ශීතකරණ,අධි ශීතකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 27. | බ්රේක් ලයිනර්,ක්ලච් ලයිනර් නිපදවීම හා අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 28. | යන්ත්‍රෝපකරණ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 29. | විදුලි භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 30. | රබර් මිශ්‍රිත කෙඳි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 31. | සංචායත බැටරි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 32. | මෝටර් වාහන එකලස් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 33. | රේඩියේටර් නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 34. | ඉලෙක්ට්‍රොනික් උපකරණ නිපදවීම හෝ අලුත්වැඩියා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 35. | වියලි කෝෂ බැටරි නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 36. | විදුලි බුබුළු නිෂ්පාදනය සහ අලුත්වැඩියාව | 500.00 | 750.00 | 1000.00 |

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 152 වැනි වගන්තියේ (i)වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර එකී පනතේ 150 වන වගන්තිය යටතේ යම් කර්මාන්ත බද්දක් ගෙවීමට අවශ්‍ය නොවන්නාවූ හා වෘත්තියක් නොවන්නාවූ කිසියම් ව්‍යාපාරයක් කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත 2026 වර්ෂයේ දී කරගෙන යනු ලබන සෑම තැනැත්තෙකුගෙන්ම , එකී ව්‍යාපාරයේ ඊට පෙර වර්ෂයේ ලැබීම් මෙහි පහත උප ලේඛනයේ Iවන තීරුවේ නිරූපිත යම් විෂයාංකයක සීමාවන් ඇතුලත පවත්නා අවස්ථාවක ,එහි II වන තිරුවේ අනුරූප සටහනෙහි නිරූපිත අනුප්‍රමාණය අනුව වූ ව්‍යාපාර බද්දක් 2026 වර්ෂයට ගෙවිය යුතු බවත්, කරගෙන යනු ලබන පහත සඳහන් උප ලේඛනයේ I වන තිරුවේ සඳහන් එක් එක් ව්‍යාපාරය වෙනුවෙන් එහි II වන තීරුවේ ඒ එක් එක් ව්‍යාපාර පවත්වාගෙන යනු ලබන ස්ථානය වාර්ෂික වටිනාකමට අනුරූපී තීරුවේ නිරූපිත ප්‍රමාණයක ව්‍යාපාර බද්දක් 2026 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව ට අදාල කරගමු. උපලේඛනය පහත පරිදි වේ.**

**<u>1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(i) වගන්තිය යටතේ 2026 වර්ෂය සඳහා ව්‍යාපාර බදු පැනවීම.</u>**

උපලේඛනය

| I වන තීරුව | II වන තීරුව |
|---|---|
| බද්ද අදාළවන වර්ෂයට පෙර වර්ෂයේ ව්‍යාපාරයෙන් ලත් ලැබීම් ප්‍රමාණය | ගෙවිය යුතු බද්ද රු.ශත |

I. රු.6,000.00 නොඉක්මවන අවස්ථාවක
නැත

II. රු.6,000.00 ඉක්මවන නමුත් රු.12,000.00 නොඉක්මවන විට
90.00

III. රු.12,000.00 ඉක්මවන නමුත් රු.18,750.00 නොඉක්මවන විට
180.00

IV. රු.18,750.00 ඉක්මවන විට නමුත් රු.75,000.00 නොඉක්මවන විට
362.00

V. රු.75,000.00 ඉක්මවන විට නමුත් රු.150,000.00 නොඉක්මවන විට
1,200.00

VI. රු.150,000.00 ඉක්මවන විට
3,000.00

ව්‍යාපාර බදු අදාළ වන ව්‍යාපාර ලැයිස්තුව:

1. රටබීම අලෙවිය
2. සුපිරි වෙළඳසැල් ( ෆුඩ් සිටි)
3. වාහන සේල්
4. බැංකු
5. මූල්‍ය ආයතන
6. උකස් මධස්ථාන
7. රක්ෂණ නියෝජිත ආයතනය
8. ලීසිං මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
9. තොග බඩු අලෙවිය
10. ගෑස් තොග අලෙවිය
11. පානීය ජලය අලෙවිය
12. පුද්ගලික අධ්‍යාපන ආයතන

13.ක්‍රීඩා භාණ්ඩ අලෙවිය
14.ඉන්ධන පිරවුම්හල්
15.තේ කර්මාර්තශාලාව
16.පුද්ගලික තැපැල් කාර්යාල
17.දුම්පරීක්ෂා කිරීමේ ස්ථාන
18.තොග වෙළඳ මධ්‍යස්ථාන
19.දන්ත ශල්‍යාගාරය
20.වෛද්‍ය රසායනාගාරය
21.ඉංග්‍රීසි බෙහෙත්ශාලා
22.සිංහල බෙහෙත්ශාලා
23.රියදුරු පුහුණු ආයතන
24.සන්නිවේදන මධ්‍යස්ථාන
25.බ්‍රෝකර්වරුන්
26.වෙන්දේසිකරුවන්
27.නීතීඥ කාර්යාලයක්
28.නොතාරිස් කාර්යාල
29.කොමිස් ඒජන්තවරු
30.දුරකථන සම්ප්‍රේෂණාගාර/දුරකථන කුළුණු
31.දුරකථන කුටි
32.රේස් ඔට්ටු අල්ලන බුකි
33.කායවර්ධන මධ්‍යස්ථානයක් පවත්වාගෙන යාම
34.දිවා සුරැකුම් මධ්‍යස්ථාන
35.ශාරීරික අභ්‍යාස පුහුණු ආයතනයක්
36.පරිගණක පුහුණු මධ්‍යස්ථාන
37.වැලි ගොඩදැමීම හෝ ගබඩා කිරීම
38.ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථානය
39.සිනමාශාලාවක් පවත්වාගෙන යාම
40.සමාජශාලාවක් පවත්වාගෙන යාම
41.විදුලි බලාගාර
42.නිවාස සැලසුම් ඇඳීම
43.පානීය ජලය නිෂ්පාදනය
44.නිම් ඇඳුම් අලෙවිය
45.ඇස් කණ්ණාඩි අලෙවිය
46.ෆාමසි
47.ගොඩනැගිලි ද්‍රව්‍ය අලෙවිය

**48.**සත්ව ගොවිපල
**49.**සිංහල බෙහෙත්බඩු අලෙවිය
**50.**විදුලි උපකරණ අලෙවිය
**51.**පා පැදි අලෙවිය
**52.**පාවහන් අලෙවිය
**53.**විසිතුරු භාණ්ඩ අලෙවිය
**54.**සාප්පු බඩු අලෙවිය
**55.**ප්ලාස්ටික් බඩු අලෙවිය
**56.**ලී බඩු අලෙවිය
**57.**ලොතරැයි අලෙවිය
**58.**පිත්තල භාණ්ඩ අලෙවිය
**59.**උත්සව භාණ්ඩ අලෙවිය
**60.**පූජා භාණ්ඩ අලෙවිය
**61.**සංගීත භාණ්ඩ අලෙවිය
**62.**නිලමේ ඇඳුම් කුලියට දීම
**63.**ජොතිෂ්‍ය කාර්යාල
**64.**බාබර් සාප්පු
**65.**නිල ලාංඡන සැකසීම
**66.**කොමියුනිකේෂන්
**67.**ජංගම දුරකථන අළුත්වැඩියාව/ පරිඝනක අළුත්වැඩියාව
**68.**ඡායාරූප රාමු කිරීම
**69.**ඔරලෝසු අළුත්වැඩියාව
**70.**කාර්මික උපකරණ කුලියට දීම
**71.**පොත්පත් ලිපි ද්‍රව්‍ය පාසල් උපකරණ අලෙවිය
**72.**මංගල,අවමංගල භාණ්ඩ කුලියට දීම
**73.**බුලත්,බුලත් විට,පුවක් අලෙවිය
**74.**සුරතල් මසුන් අලෙවිය/ සුරතල් සතුන් අලෙවිය
**75.**යතුරුපැදි/ත්‍රිරෝද රථ/වාහන අමතර කොටස් අලෙවිය
**76.**ඡායාරූපශාලාව
**77.**ලිහිසිතෙල් අලෙවිය
**78.**මල් තවාන

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 150 වැනි වගන්තියේ (i)වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර , කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කරගෙන යනු ලබන පහත සඳහන් උප ලේඛනයේ I වන තිරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් එහි II වන තීරුවේ ඒ එක් එක් කර්මාන්තය පවත්වාගෙන යනු ලබන ස්ථානය වාර්ෂික වටිනාකමට අනුරූපී තීරුවේ නිරූපිත ප්‍රමාණයක කර්මාන්ත බද්දක් 2026 වර්ෂය සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාව ට අදාල කරගමු. උපලේඛනය පහත පරිදි වේ.**

**1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150 (i) වගන්තිය යටතේ 2026 වර්ෂය සඳහා කර්මාන්ත බදු පැනවීම.**

| අනු අංකය | I වන තීරුව කර්මාන්තය | II වන තීරුව පරිශ්‍රයේ වාර්ෂික වටිනාකම | | |
|---|---|---|---|---|
| | | රු. 750. 00 නොඉක්මවන අවස්ථාවක | රු. 750.00 ට ඉක්මවන එහෙත් 1500.00 නොඉක්මවන අවස්ථාවක | රු. 1500.00 ඉක්මවන අවස්ථාවක |
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| | බිම්මල් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| | කිරි ආශ්‍රිත නිෂ්පාදන හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| | පැකට් කර අලෙවිය (තේ කොළ ආදිය) | 500.00 | 750.00 | 1000.00 |
| | නූඩ්ල්ස් නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |
| | කිතුල් ආශ්‍රිත නිෂ්පාදනය හා අලෙවිය | 500.00 | 750.00 | 1000.00 |

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 – 149 -152 ( i ) හා 150 ( i) වගන්ති යටතේ ඉහත දක්වා ඇති නියමයන් වලට අදාලව 2026 වර්ෂයට කුරුවිට ප්‍රාදේශීය සභාවේ ගාස්තු අයකරනු ලබන වෙළඳ බලපත්‍ර/ ව්‍යාපාර බදු හා කර්මාන්ත බදු රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළකිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06 - 82.** **කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් හා අක්කර බදු ගාස්තු - 2026 වර්ෂය සඳහා අයකිරිමට අදාලව, ගාස්තු හා ගාස්තු සංශෝධනය පිලිබඳව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**වරිපනම් හා අක්කර බදු සම්බන්ධව ගාස්තු අයකිරීමේදි පහත පරිදි කටයුතු කරමු.**

| අනු අංක | අයකරනු ලබන කාරණය | දැනට අයකරනු ලබන ගාස්තුව | 2026 වරෂයේදී අයකිරීමට බලාපොරොත්තු වන ගාස්තුව |
|---|---|---|---|
| **01** | නම සංශෝධන අයදුම පත්‍ර ගාස්තු | රු.**500.00** | රු.**500.00** |
| **02** | තාවකාලික අංක නිකුත් කිරීමේ ගාස්තු | දැනට ගාස්තු අය නොකරයි | රු. **500.00** |
| **03** | බදු නොගෙවන බවට සහතික නිකුත් කිරිමේ ගාස්තු | දැනට ගාස්තු අය නොකරයි | රු. **250.00** |

ඒ අනුව නම සංශෝධන අයදුම්පත්‍ර ගාස්තු රු. **500.00** සංශෝධනය නොකිරීමටත්, ඉදිරියේදී තාවකාලික අංක නිතුක් කිරීමේ කටයුතු තක්සේරු දෙපාරත්තමේන්තුව වෙතින් සිදු කිරීමට නියමිත බැවින් ඔවුන් වෙත ගොනුවක් සඳහා රු.**200.00** ක මුදලක් ගෙවීමට සිදුවන බැවින් **(**දෙපාර්තමේන්තු චක්‍රෙලඛ අංක **2023/02** අනුව **)** ඒ සඳහා රු. **500.00**ක මුදලක් අයකිරීමටත්

**බදු නොගෙවන බවට සහතික නිකුත් කිරිම සඳහා රු. 250.00 මුදලක් අයකිරීමටත් කටයුතු කරමු.**
**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් හා අක්කර බදු ගාස්තු - 2026 වර්ෂය සඳහා අයකිරිමට අදාලව, ගාස්තු හා ගාස්තු සංශෝධනය කිරිම සම්බන්ධව සංශෝධන අයදුම්පත්‍ර ගාස්තු රු. 500.00 සංශෝධනය නොකිරීමටත්, ඉදිරියේදී තාවකාලික අංක නිකුක් කිරීමේ කටයුතු තක්සේරු දෙපාරත්තමේන්තුව වෙතින් සිදු කිරීමට නියමිත බැවින් ඔවුන් වෙත ගොනුවක් සඳහා රු.200.00 ක මුදලක් ගෙවීමට සිදුවන බැවින් (දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 2023/02 අනුව ) ඒ සඳහා රු. 500.00ක මුදලක් අයකිරීමටත් බදු නොගෙවන බවට සහතික නිකුත් කිරිම සඳහා රු. 250.00 මුදලක් අයකිරීමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06 - 83 . කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් හා අක්කර බදු ගාස්තු - 2026 වර්ෂය සඳහා අයකිරිමට අදාලව රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළකිරිම සඳහා මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**නව වරිපනම් ප්‍රතිශෝධන සමඟ 2026 වර්ෂය සඳහා පවතින වරිපනම් ප්‍රතිශතය යටතේ (6%) කුරුවිට ප්‍රදේශීය සභාවට අයත් කුරුවිට ප්‍රධාන කාර්යාලයේ සහ උප කාර්යාලයන්හි (නාමල්දෙණිය (එල්ලාවල) උප කාර්යාලය, කිරිඇල්ල උප කාර්යාලය හා දොඩම්පේ උප කාරයාලය) වරිපනම් බදු හා අක්කර බදු පැනවීම සමබන්ධව හා වරිපනම් බදු හා අක්කර බදු පොතේ දේපල අයිතිය ලියාපදිංචි කිරීම සඳහා ඔප්පු උදෘත ගාස්තු හා වරිපනම් බදු නොගෙවන බවට සහතික නිකුත්කිරීමේ ගාස්තු (නම සංශෝධන ඉල්ලුම්පත්‍ර ගාස්තු හා තාවකාලික වරිපනම් අංක නිකුත්කිරීමේ ගාස්තු ) සභාව වෙත යොමුකල වරිපනම් ගාස්තු අයකිරීම ලිපිය පරිදි 2026 වර්ෂයේ අදාල ගාස්තු අයකිරීම සම්බන්ධ රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරනු ලබන ගැසට් පත්‍රයේ පල කිරීම ට කටයුතු කරමු.**
**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවට අයත් වරිපනම් හා අක්කර බදු ගාස්තු - 2026 වර්ෂය සඳහා අයකිරිමට අදාලව රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළකිරිම ට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**06 – 84 .** කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඇති ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු, වෙනත් අයකිරිම් , අලෙවි ප්‍රවර්ධන කටයුතු හා තාවකාලික අලෙවිකුටි සඳහා ගාස්තු අයකිරිම 2026 වර්ෂයේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළකිරිම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.

<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

එම යෝජනාව ස්ථිර කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>

සංශෝධන සහිතව කරමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

දැන්වීම් පුවරු අධික ලාභයක් ලබනවා. මේ පුවරුත් අනු කොන්ත්‍රාත් දීලා. මාස හයෙන් හයට මේවායේ දාන දැන්වීම් වෙනස් වෙනවා. දෙවතාවක් අලෙවි වෙනවා. මේ ගාස්තු වැඩි කරන්න.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

2011.09.02 දින අංක 1722 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ IV(අ) කොටසේ ගැසට් පත්‍රයේ පළ කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන ප්‍රකාරව කුරුවිට ප්‍රාදේශීය බල සීමාව තුළ යම් වීදියකට, පාරකට, ඇළකට හෝ අහසට පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උපලේඛනයේ දැක්වෙන ගාස්තු 2026 වර්ෂය සඳහා අයකරමු. අවශ්‍ය සංශෝධන දෙන්න.

උපලේඛනය

| | විස්තරය | මාසයකට හෝ ඉන් කොටසක් සඳහා වර්ග අඩි 01කට ගාස්තු (තාවකාලික පුවරු/බැනර් සඳහා) | වර්ෂයකට වර්ග අඩි 01කට ගාස්තු (ස්ථිර දැන්වීම් පුවරු සඳහා) |
|---|---|---|---|

| | | රු.<br>ශත | රු.<br>ශත |
|---|---|---|---|
| I | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් නොවන වෙනත් ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා | 100.00 | 150.00 |
| II | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රචාරක දැන්වීම් සඳහා | 100.00 | 150.00 |
| III | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව බිත්තියක හෝ පුවරුවක ප්‍රදර්ශනය කරන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීම් සඳහා | 100.00 | 150.00 |
| IV | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන්නා වූද ලණු ආධාරයෙන් ප්‍රදර්ශනය කර ඇත්තා වූ ප්‍රචාරක දැන්වීමක් සඳහා | 100.00 | 150.00 |
| V | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන ප්‍රතිදීප්ත ප්‍රචාරක දැන්වීම් සඳහා | 100.00 | 150.00 |
| VI | යම් රිය පෙට්ටියක රිය කාරයක හෝ කරත්තයක සවිකර ඇති විට හෝ ප්‍රචාරක දැන්වීමක් මතුපිට පින්තාරු කර යම් රිය පෙට්ටියක රිය කාරයක හෝ කරත්තයක ජංගම ප්‍රචාරක පුවරුවක් හෝ දැන්වීමක් සඳහා | 100.00 | 150.00 |
| VII | වේදිකා නාට්‍ය හෝ සිනමා ලේඛික ප්‍රසංගයක් පිළිබඳව ප්‍රචාරක දැන්වීමක් නොවන ආධාරක මත පිහිටුවා ඇති ගුවන් ප්‍රචාරක දැන්වීමක් සඳහා | 100.00 | 150.00 |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

**ස්ථිර දැන්වීම් පුවරු සඳහා වර්ෂයකට වර්ග අඩි 100 ට වැඩිනම් ට ගාස්තුව රු. 250.00 ලෙස සංශෝධනය කරන්න. වර්ග අඩි 100 ට අඩු නම් රු. 150.00 කරන්න.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා -</u>

**ස්ථිර දැන්වීම් පුවරු සඳහා වර්ෂයකට වර්ග අඩි 100 ට වැඩි නම් ගාස්තුව රු. 250.00 ලෙසත් වර්ග අඩි 100 ට අඩු නම් රු. 150.00 පනවමු.**

**2026 වර්ෂයට වෙනත් අය කිරීම් යටතේ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් බෝපත් ඇල්ල නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් හා බෝපත් ඇල්ල රථගාලේ ගාල් කරනු ලබන වාහන සඳහා 2026 වර්ෂයේ සිට පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකිරිම සම්බන්ධව පහත උපලේඛනය පරිදි විස්තර දක්වා ඇත.**

උප ලේඛනය

| අනු අංකය | සේවාව | රු. ශත |
|---|---|---|
| **1.** | බෝපත් ඇල්ල රථගාල වෙත පැමිණෙන වාහන සඳහා අයකල යුතු ගාස්තු | |
| | **I.**දොර දෙක බස් සඳහා | **200.00** |
| | **II.**කාර්/ලොරි/තනි දොර බස්/වෑන් සඳහා | **150.00** |
| | **III.** ත්‍රීරෝද රථ සඳහා | **100.00** |
| | **IV.** මෝටර් බයිසිකල් සඳහා | **50.00** |
| **2.** | බෝපත් ඇල්ල නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් සඳහා අයකල යුතු ගාස්තු | |
| | **I** .දේශීය වැඩිහිටි | **50.00** |
| | **II** .විදේශීය වැඩිහිටි | **300.00** |
| | **III** .පාසල් හා අනෙකුත් ළමුන් | **20.00** |

**වෙනත් අය කිරීම් යටතේ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් බෝපත් ඇල්ල නැරඹීමට පැමිණෙන දෙස් විදෙස් සංචාරකයින් හා බෝපත් ඇල්ල රථගාලේ ගාල් කරනු ලබන වාහන සඳහා 2026 වර්ෂයේ සිට පහත උපලේඛනයේ සඳහන් ගාස්තු අයකිරිම සංශෝධනයක් සිදු නොකෙරිණි.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

***2026 වර්ෂය ට අදාල වෙනත් අය කිරීම් යටතේ* කුරුවිට ප්‍රාදේශීය සභා බල සීමාව තුළ ගව මස් ප්‍රවාහන බලපත්‍ර ලබා දීම හා තාවකාලික ගෝඝාතකාගාර සඳහා බලපත්‍ර ලබා දීම සඳහා පහත උපලේඛනයේ සඳහන් ගාස්තු ඉදිරිපත්කර ඇත. අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරන්න.**

උප ලේඛනය

| අනු අංකය | සේවාව | රු. | ශත |
|---|---|---|---|
| **1.** | කුරුවිට ප්‍රා දේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ගවමස් වෙළඳ සැල් සඳහා වාර්ෂික ගවමස් ප්‍රවාහන ගාස්තු | **5500** | **00** |
| **2.** | කුරුවිට ප්‍රා දේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත පිහිටි ගව මස් වෙළඳ සැල් සඳහා සභා බල ප්‍රදේශය තුල වාර්ෂික ගවමස් ප්‍රවාහන ගාස්තු | **10500** | **00** |
| **3.** | උත්සව හා වෙනත් කටයුතු සඳහා තාවකාලික බලපත්‍ර ලබා දීම ඉල්ලුම් කරනු ලබන එක් දිනක් සඳහා එක් සතෙකු සඳහා ගාස්තු | **10000** | **00** |

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>

**කුරුවිට ප්‍රා දේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ගවමස් වෙළඳ සැල් සඳහා වාර්ෂික ගවමස් ප්‍රවාහන ගාස්තුව වැඩිකරමු. රු. 7500.00 කරමු.**

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

**ප්‍රදේශයෙන් පිටත පිහිටි ගව මස් වෙළඳ සැල් සඳහා සභා බල ප්‍රදේශය තුල වාර්ෂික ගවමස් ප්‍රවාහන ගාස්තුව රු. 11000.00 කරමු.**
**ඒ අනුව කුරුවිට ප්‍රා දේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ගවමස් වෙළඳ සැල් සඳහා වාර්ෂික ගවමස් ප්‍රවාහන ගාස්තුව රු. 7500.00 ක් ලෙසත් කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත පිහිටි ගව මස් වෙළඳ සැල් සඳහා සභා බල ප්‍රදේශය තුල වාර්ෂික ගවමස් ප්‍රවාහන ගාස්තුව රු. 11000.00 ක් ලෙසත් සංශෝධනය කරමු.**

**2026 වර්ෂයට අදාලව කුරුවිට ප්‍රාදේශීය සභාවේ අලෙවි ප්‍රවර්ධන කටයුතු හා තාවකාලික අලෙවි කුටි සඳහා ගාස්තු අයකිරීමසම්බන්ධයෙන් පහත උපලේඛනයේ පරිදි විස්තර දක්වා ඇත. අවශ්‍ය සංශෝධන ඉදිරිපත්කරන්න.**

උප ලේඛනය

| අනු අංකය | සේවාව | රු. | ශත |
|---|---|---|---|
| 1. | උත්සව අවස්ථාවලදී තාවකාලික අලෙවි කුටි සඳහා (වර්ගඅඩි 100 සඳහා ) | 1000 | 00 |
| 2. | රජයේ ආයතනයක ලියාපදිංචි ලබා ඇති ස්වයං රැකියා කටයුතුවල නිරතවන අය සඳහා එක් දිනකට ගාස්තු | 2000 | 00 |
| 3 | තාවකාලික සේල් පොළවල් සඳහා එක් දිනකට ගාස්තු | 3000 | 00 |
| 4 | අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා එක් දිනකට ගාස්තු | 5000 | 00 |
| 5 | දේශපාලන රැස්වීම් හා ලාභ නොලබන සංවිධාන මඟින් පවත්වනු ලබන රැසවීම් සඳහා එක් දිනකට ගාස්තු | 5000 | 00 |

❖ පොදු කටයුතු සිදු කරන අවස්ථාවලදී ගාස්තු අය නොකෙරේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>

උත්සව අවස්ථාවලදී තාවකාලික අලෙවි කුටි සඳහා (වර්ගඅඩි 100 සඳහා ) අයකිරීම් දිනකට ලෙස සඳහන් කරන්න. තාවකාලික සේල් පොළවල් සඳහා වර්ග අඩි ප්‍රමාන දාන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිණී තනූජා දීපානි චන්ද්‍රිකා මිය.</u>

උත්සව කාලෙට තාවකාලික කඩ දිම ගැන ප්‍රශ්න රැසක් තියෙනවා. සභාව පිලිබඳ අප්‍රසාදයෙන් බදු ගෙවන කඩ හිමියෝ ඉන්නේ. අවුරුදු කාලෙට වගේ සීසන් කාලෙට තමා ලාභයක් එන්නේ. නමුත් සමාන තාවකාලික වෙළඳාම් ස්ථිර කඩ ඉදිරිපිටම දුන්නාම ඒක ගැටළුවක්. උදාහරන විදිහට ප්ලාස්ටික් බඩු කඩයක් තවත් ප්ලාස්ටික් බඩු තියෙන කඩයක් ඉදිරිපිට දැම්මාම එතන ප්‍රශ්නයක්. නගරයේ ව්‍යාපාර ප්‍රජාව රැකගෙන කටයුතු කරමු. ඒ අයට පැත්තක් වෙන් කරලා දෙන්න. කපිල මන්ත්‍රිතුමාත් මේ ගැන දන්නවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>

උත්සව කාලේ තාවකාලිකව අලෙවිකුටි කරන අයටත් අවස්ථාවක් දෙන්න වෙනවා. ක්‍රමවේදයක් අනුව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  කපිල මුණසිංහ මහතා -

දිගු කාලෙක සිට තියෙන ගැටළුවක්. නගරේ ව්‍යාපාරික අයට සිසන් කාලෙට නිසි ලාභයක් ලැබෙන්නේ නැතිළු. ව්‍යාපාරිකයෝ අපිට බදු ගෙවනවා. තව අපි විශේෂ සහායක් සභාවට ඉල්ලුවොත් කරනවා. කුරුවිට ඔර්ලෝසු කණුව ඉදිරිපිට දෙන්න එපාලු. අඩු මුදලට නිසා මිනිස්සුත් යන්නේ ඒවාට. දීර්ඝ කාලයක් බදු ගෙවාගෙන ඉන්න අයට පාඩුයිළු. මේ නිසා විරෝධතා තියෙනවා. මම නගරේ සේවය කරන කාලෙත් මේ ගැන පැමිණිලි තිබුණා. මේ ගැන සොයාබලලා විධිමත් කටයුත්තක් සිදු කිරීම  අවශ්‍යයි.
දෙපාර්ශවයටම සාධාරණයක් වෙන පරිදි කටයුතු කරමු.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

උත්සව කාලේ තාවකාලිකව අලෙවිකුටි ,වර්ගඅඩි 100 සඳහා .සඳහා යම් මුදලක් වැඩි කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  දේවින්ද කුමාර මහතා -

තාවකාලිකව අලෙවිකුටි වර්ගඅඩි 100 සඳහා දිනකට රු. 1500.00 කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී  මංගල ඩයස් මහතා -

ඔර්ලෝසු කණුව ලඟ මේ කටයුතු වලට නොදී ඉමු. හදිසියේ වාහනයක් දමන්න ඉඩක් නෑ. ලොරි රථ ගාලේ සමහර වාහන උදේ ඉඳන් දවස පුරාම නතර කරලා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

2026 වර්ෂයේ අපි කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඇති ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු, වෙනත් අයකිරිම් , අලෙවි ප්‍රවර්ධන කටයුතු හා තාවකාලික අලෙවිකුටි සඳහා ගාස්තු අයකිරීම යටතේ තිබෙන මිළ ගනන් සංශෝධන ලෙස ස්ථිර දැන්වීම් පුවරු සඳහා වර්ෂයකට වර්ග අඩි 100 හා 100 ට වැඩි ට ගාස්තුව රු. 250.00 ලෙසත්  වර්ග අඩි 100 ට අඩු නම් රු. 150.00 ලෙසත් , කුරුවිට ප්‍රා දේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ගවමස් වෙළඳ සැල් සඳහා වාර්ෂික ගවමස් ප්‍රවාහන  ගාස්තුව රු. 7500.00 ක් ලෙසත් කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත පිහිටි ගව මස් වෙළඳ සැල් සඳහා සභා බල ප්‍රදේශය තුල වාර්ෂික ගවමස් ප්‍රවාහන ගාස්තුව රු. 11000.00 ක් ලෙසත් සංශෝධනය කලා. එසේම උත්සව කාලේ තාවකාලිකව අලෙවිකුටි ,වර්ගඅඩි 100 සඳහා ගාස්තුව  දිනකට රු. 1500.00 ලෙස ත් සංශෝධනය කලා. අනෙක් ගාස්තු එලෙසම වේ.

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ඇති ප්‍රචාරක දැන්වීම් පුවරු ගාස්තු, වෙනත් අයකිරීම් , අලෙවි ප්‍රවර්ධන කටයුතු හා තාවකාලික අලෙවිකුටි සඳහා ගාස්තු අයකිරීම යටතේ තිබෙන මිළ ගනන් සංශෝධන ලෙස ස්ථිර දැන්වීම් පුවරු සඳහා වර්ෂයකට වර්ග අඩි 100 හා 100 ට වැඩි ගාස්තුව රු. 250.00 ලෙසත් වර්ග අඩි 100 ට අඩු ගාස්තුව රු. 150.00 ලෙසත් , කුරුවිට ප්‍රා දේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ගවමස් වෙළඳ සැල් සඳහා වාර්ෂික ගවමස් ප්‍රවාහන ගාස්තුව රු. 7500.00 ක් ලෙසත් කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙන් පිටත පිහිටි ගව මස් වෙළඳ සැල් සඳහා සභා බල ප්‍රදේශය තුල වාර්ෂික ගවමස් ප්‍රවාහන ගාස්තුව රු. 11000.00 ක් ලෙසත් සංශෝධනය වූ අතර උත්සව කාලයට තාවකාලිකව අලෙවිකුටි ,වර්ගඅඩි 100 සඳහා ගාස්තුව දිනකට රු. 1500.00 ලෙස ත් සංශෝධනය විය. අනෙකුත් ගාස්තු ඉහත සඳහන් පරිදිම වේ. ඒ අනුව සියළු ගාස්තු 2026 වර්ෂයේ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළකිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06- 85. බදුවත්තේ අංක 14 හා 14/1ස්ථානයේ 2025 වසරේ පවත්වාගෙන ගිය ගව හා කුකුළු මස් වෙළඳසැළට 2026 වසර සඳහා බදු මුදල 10% කින් වැඩිකර බලපත්‍රය අළුත්කර ලබාදීම සම්බන්ධව මහා සභා තීරණයක් ගැනීමට යෝජනා කරමි.**

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහින්ද ගුණසිංහ මහතා -</u>**
**එම මස් වෙළඳසැළ සම්බන්ධයෙන් පැමිණිලි තියෙනවා. ඒ මස්කඩේ අපද්‍රව්‍ය ඇළට දානවා කියලා ගොවිජනතාවගේ චෝදනා තියෙනවා. ඇළට අපද්‍රව්‍ය යොමුකිරීම නැවැත්විය යුතුයි.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
**ඒ සම්බන්ධව මහජනසෞඛ්‍ය පරීක්ෂක මගින් වාර්තාගෙන කටයුතු කරමු.**
**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව බදුවත්තේ අංක 14 හා 14/1ස්ථානයේ 2025 වසරේ පවත්වාගෙන ගිය ගව හා කුකුළු මස් වෙළඳසැළට 2026 වසර සඳහා බදු මුදල 10% කින් වැඩිකර බලපත්‍රය අළුත්කර ලබාදීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 86 . කුරුවිට ප්‍රාදේශීය සභාවේ නොදිරණ කසළ කළමණාකරණයහ පහසු කරගැනීම සඳහා මිළදී ගත් බේලර් යන්ත්‍රය වෙනුවෙන් රු. 1764100.00 ක මුදල ස්කයිලයින් මැෂිනරි ඇන්ඩ් ඉක්විප්මන්ට් පුද්ගලික සමාගමට ( නො.312, ගාලුපාර, මීගමුව) වෙත ගෙවීම් කිරිමට යෝජනා කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**මෙය නීතයානුකූල ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව සිදුකර තිබෙනවා. මිළ ගනන් කැඳවා 2024 වසරේ දෙසැම්බර් මස. ආණ්ඩුකාර අනුමැතිය ලබා තියෙනවා. තාක්ෂනික කමිටු නිර්දේශය දී ඇත්තේ මෙම ආයතනයෙන් මිලදීගැනීමට. නමුත් ගල්ෆ් යුද්ධය නිසා කාලයක් පහුවෙලා. ගිය සභාවට පසුවයි භාණ්ඩය ලැබී ඇත්තේ. දැනට බන්ධනාගාරයේ සභාවේ පොහොර ව්‍යාපෘතියේ පොලිතින් ඇඹරීමට යෙදෙව්වා. යන්ත්‍රෙය් මුදල රු.1764100.00 ක් වෙනවා. ලක්ෂ 10 ට වැඩි මුදලක් ගෙවීම් කිරිමක් නිසා සභා තීරණයක් ගත යුතුයි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -

**බන්ධනාගාරයට මෙය යවන්න එපා. සභාවේ තැනක ඒ කාර්යට අදාල තැනක යොදවන්න. ආණ්ඩුකාර අනුමැතිය අරන්. මුදල් ගෙවන්නේ දැන් සභාවෙන්.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -

**පොහොරබාව ඒ කටයුතු සිදුවෙන්නේ නැද්ද?**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**අවශ්‍යතාවය අනුව ස්ථානවලට මෙය ප්‍රවාහනය කල හැකියි.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දමින්ද නලින් අධිකාරම් මහතා -

**මම ඒ පොහොර ව්‍යාපෘතියට ගියා. පරිසර කමිටු සාමාජිකයෙක් ලෙස.ඉල්ලුම්කල යන්ත්‍රය හා සැසඳෙනවද බලන්න. සින්ගල් ෆේස් එකක් තිබුනේ. ඉල්ලුම්කරලා තිබුනේ ත්‍රී ෆේස්. දැන් ඒක නිවැරදි කලා.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
කාර්මික කමිටුවත් යොමුකර බලමු.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -

මිළ ගනන් අරන්. සීමිත ටෙන්ඩර් කරලා. අවශ්‍ය ඉංජිනේරු නිර්දේශ අරන්. මේ භාණ්ඩය තියෙනවා. ප්‍රසම්පාදන ක්‍රමවේදය අවසන් වෙලා.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

අදාල කටයුතු අවසන් වෙලා ගෙවීම් සිදුකරමු.

ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව කුරුවිට ප්‍රාදේශීය සභාවේ නොදිරණ කසළ කළමණාකරණය පහසු කරගැනීම සඳහා මිළදී ගත් බේලර් යන්ත්‍රය වෙනුවෙන් රු. 1764100.00 ක මුදල ස්කයිලයින් මැෂිනරි ඇන්ඩ් ඉක්විප්මන්ට් පුද්ගලික සමාගමට ( නො.312, ගාලුපාර, මීගමුව) වෙත ගෙවීම් කිරිමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

06- 87. 2026 වසර සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සම්බන්ධව අයකරනු ලබන ගාස්තු රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළ කිරීමට යෝජනා කරමි.

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
එම යෝජනාව ස්ථිර කරමි. එම ගාස්තුම අයකරමු.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
එම ගාස්තු පහත පරිදි දක්වලා තියෙනවා. එම ගාස්තුම 2026 වසරටත් අදාල කරගමු.

| අනු අංකය | විස්තරය | පාසල් ලමුන්ට රු. | වැඩිහිටි රු. |
|---|---|---|---|
| **01.** | පුස්තකාල අයදුම්පත්‍ර ගාස්තුව | **රු. 25.00** | **රු. 25.00** |
| **02.** | සාමාජික ගාස්තුව | **රු.50.00** | **රු. 200.00** |
| **03.** | සාමාජික අළුත් කිරීමේ ගාස්තුව | **රු. 50.00** | **රු. 50.00** |
| **04.** | ප්‍රමාද ගාස්තු | **රු. 02.00(දින 1 ට)** | **රු. 5.00( දින 1 ට )** |

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව 2026 වසර සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ මහජන පුස්තකාල සම්බන්ධව ඉහත සඳහන් ගාස්තු රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළ කිරීමට ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**06 – 88. 2026 වසර සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ අදාහනාගාරය, ක්‍රීඩා පිටි, විනෝද බඳු හා සතුන් සඳහා අයකරනු ලබන ගාස්තු රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළ කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**
**යෝජනාව ස්ථිර කරමි. ගාස්තු වැඩිවීම් සිදු කරන්න එපා.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**
ආදාහනාගරයේ ගාස්තු සම්බන්ධව තොරතුරු ඉදිරිපත්කර තියෙනවා.එසේම 2025 ජූලි මස ආදාහනාගාරයේ ආදායම් වියදම් දක්වා තියෙනවා. 2025 ආදාහන වලින් ලත් ආදායම( ආදාහන 26 කට) රු. 286,000.00 ක්. වියදම රු. 553,890.00 ක් වෙනවා. දෛනික වියදම රු. 17,868.00 ක් වෙනවා. එක් ගෑස් සිලින්ඩරයක මිල රු.17,592.00 ක්. එක් ගෑස් එකකකින් සිදුකල හැකි ආදාහන ගණන 02 හෝ 2 1/2 ක් වෙනවා. දැනට කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආදාහනයක් සිදුකිරීම සඳහා රු.11,000.00 ක මුදලක් අය කරගන්නා අතර බල ප්‍රදේශයෙන් පිට ආදාහනයක් සිදුකිරීම සඳහා රු.12,000.00 ක මුදලක් අය කරගන්නවා. ආදාහනාගාර කුටි සඳහා ගාස්තුව රු.3,000.00 ක්. මෙක සේවාවක් විදිහට තමා පවත්වාගෙන යන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ප්‍රේමරත්න මහතා -</u>**

දෛනිකව වියදම රු. 17,368.00 ක් වෙන නිසා යම් මුදලක් වැඩි කරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

මේක සේවාවක් විදිහට පවත්වාගෙන යන එකක්. ගාස්තු වැඩි කරන්න එපා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>**

පාඩු නොලබන ලෙස වැඩි කරමු. රත්නපුරේ පිට ආදාහනයකට රු. 20,000.00 ක්. අයකරනවා.

<u>උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මට මේ දෛනික වියදම පිලිබඳ පිලිගන්න අමාරුයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

දවසට ආදාහන කීපයක් සිදුවෙනවා. එරත්න වගේ ඈත ඉඳන් ආදාහනයක් එනවිට ඒ මිනිස්සුන්ට වියදමත් අධිකයි. මරණයක් සිදුවෙන වෙලාවට කව්රුත් අසරණයි. වියදම වැඩියි. සභාව සේවාවක් විදිහට පවත්වාගෙන යන දෙයකට ලාභය තක්සේරු කරන්න එපා. මිය යන්නේ මේ බලප්‍රදේශයේම පුරවැසියෙක්. අයකිරීම් කරන්නේ ඒ අයගෙන්. මේ සිලින්ඩර් සිසිල් වෙන්න වතුර ඕනි. එතකොට වැඩි දහන ප්‍රමාණයක් පවත්වාගෙන යන්න පුළුවන්. ක්‍රමවේද කරන්න වෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර් මහතා -</u>**

රු. 17,368.00 ක් වියදම් වෙන්නේ කොහොමද?

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා –</u>**

මේ සේවාව පවත්වාගෙන යන්න ඕනි. වියදම දරාගන්න ඕනි. ලාභයක් විධිහට නෙමේ. පවත්වාගෙන යාමට යම් මුදලක් වැඩිකරන්න වෙයි. රු. 1000.00 ක් වගේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>**

කැඩුනොත් හදන්න ඕනි. කාලයක්ම රු. 11,000.00 ට කලා.

<u>උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>

මේ දෛනික වියදම් මුදල ඇතුලත සේවක වැටුප් , අතිකාල, ඉන්ධන වියදම්, ආදියත් ඇතුලත්.

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා –</u>**

අපි කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආදාහනයක් සිදුකිරීම සඳහා රු.12,000.00 ක මුදලක් හා බල ප්‍රදේශයෙන් පිට ආදාහනයක් සිදුකිරීම සඳහා රු.13,000.00 ක මුදලක් අයකරමු.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

ගාස්තුව වැඩි කිරිම සම්බන්ධයෙන් එකඟ නෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කැළුම් ශ්‍රී ධර්මදාස මහතා -</u>**

ගාස්තුව වැඩි කිරිම සම්බන්ධයෙන් එකඟ නෑ.

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**දැනට කුරුවිට මහජන ක්‍රීඩාපිටිය සඳහා අයකරනු ලබන ගාස්තු සඳහන් කර ඇත.**

| අනු අංක | **කුරුවිට මහජන ක්‍රීඩාපිටිය සඳහා අයකරනු ලබන ගාස්තු** | රු. ශත |
|---|---|---|
| 01. | කුරුවිට බල ප්‍රදේශය තුළ පාසල්, සියළුම පෙර පාසල් සඳහා | 1500.00 |
| 02. | කුරුවිට බල ප්‍රදේශයෙන් පිටත පාසල්/ සියළුම පෙර පාසල් සඳහා | 2000.00 |
| 03 | රාජ්‍ය ආයතන සඳහා | 2000.00 |
| 04. | කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි ක්‍රීඩා සමාජ සඳහා සහනදායී මුදල | 2000.00 |
| 05. | කුරුවිට චාන්ස් ක්‍රීඩා සමාජය (මුදල් අය කිරීම් සිදු කරන තරඟ සඳහා සහනදායී මුදල) | 2000.00 |
| 06. | කුරුවිට චාන්ස් ක්‍රීඩා සමාජය විසින් මුදල් පදනමකින් තොරව සිදු කරනු ලබන ක්‍රීඩා පුහුණු තරඟ සඳහා | ගාස්තු නිදහස් |
| 07. | කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරීන් අතර පවත්වනු ලබන ක්‍රීඩා තරඟ හා උත්සව සඳහා | ගාස්තු නිදහස් |
| 08. | කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි වැඩිහිටි බල මණ්ඩල සහ ආබාධිතයන්ගේ සංගමය සඳහා | ගාස්තු නිදහස් |
| 09. | කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වසරකට එක් වතාවක් පවත්වන අන්තර් යෞවන ක්‍රීඩා සමාජ සඳහා | ගාස්තු නිදහස් |
| 10. | කුරුවිට ප්‍රාදේශීය සභාව මඟින් පවත්වනු ලබන තරඟ හා උත්සව සඳහා | ගාස්තු නිදහස් |
| 11. | කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ලියාපදිංචි නොමැති ක්‍රීඩා සමාජ හා අනෙකුත් සංවිධාන සහ පෞද්ගලික ආයතන සඳහා | 7500.00 |
| 12. | පාසල් ක්‍රීඩා තරඟ සහ උත්සව සඳහා ඇප මුදල් වශයෙන් | 5000.00 |
| 14 | ඇප මුදල් වශයෙන් (ක්‍රීඩා පිටිය පළුදු කිරීම් සිදු නොකර නිසි පරිදි ක්‍රීඩා පිටියේ කැලි කසල ඉවත් කර ඇත්නම් මෙම රැඳවුම් මුදල නිදහස් කරනු ලැබේ.) | 10,000.00 |

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>**

**වාහන හා සතුන් පිළිබඳ බදු පැනවීම හා විනෝද බදු පහත පරිදි වේ.**

| *කාරණය* | *ගාස්තුව* |
|---|---|
| (i) මෝටර් රථයක්, ජින් රික්ෂෝවක්, මෝටර් ලොරියක්, මෝටර් කාරයක්, මෝටර් බයිසිකලයක් හෝ කරත්තයක්, රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | රු. ශත 25.00 |
| (ii)සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ සෑම කරත්තයක් සඳහා<br>(අ)වෙළඳ කාර්යයක් සඳහා යොදවන්නේ නම්<br>(ආ)වෙළඳ නොවන කාර්යයක් සඳහා යොදවන්නේ නම් | <br><br>18.00<br>4.00 |
| (iii)සෑම කරත්තයක් සඳහා | 20.00 |
| (iv)සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |
| (v)සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| (vi)සෑම අශ්වයෙකු, පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15.00 |
| (vii)සෑම ඇතෙකු සඳහා | 50.00 |

- **විනෝද බදු**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 148 වන වගන්තිය සහ 94 වන උපලේඛනයේ විධිවිධානවලින් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර, කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ කරනු ලබන සියළුම චිත්‍රපට දර්ශනයක්, මැජික් සංදර්ශනයක්, සර්කස් දර්ශනයක් හා සෑම සංගීත සංදර්ශනයක් සඳහාම එම දර්ශනය නැරඹීම සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රවලින් 10% විනෝද බද්දක් අය කරනු ලැබේ.

**මෙම ගාස්තු සංශෝධනයක් සිදු නොවිණි.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සහා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව 2026 වසර සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ අදාහනාගාරය, ක්‍රීඩා පිටි, විනෝද බදු හා සතුන් සඳහා අයකරනු ලබන ගාස්තු සම්බන්ධයෙන්** කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ආදාහනයක් සිදුකිරීම සඳහා

රු.12,000.00 ක මුදලක් හා බල ප්‍රදේශයෙන් පිට ආදාහනයක් සිදුකිරීම සඳහා රු.13,000.00 ක මුදලක් ගාස්තු ලෙස අයකිරිමට සංශෝධනය කිරිමටත් අනෙකුත් ගාස්තු එලෙසම අයකිරීමටත් ඉහත දක්වා ඇති සියළු **ගාස්තු රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළ කිරිමට ද ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා -</u>**

**06 – 89. 2026 වසර සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ ජල බවුසර සේවාව වෙනුවෙන් අයකරුන් ලබන ගාස්තු රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළ කිරිමට යෝජනා කරමි.**

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

**එම යෝජනාව ස්ථිර කරමි.**

**<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා -</u>**

**2025 වර්ෂයේ දෙවන කාර්තුවට අදාලව දිස්ත්‍රික් මිළ කමිටුවාර්තාව අනුව ජල බවුසරයක් ( ජලය රහිත )දිනකට ( පැය 08 ට ) රු. 14000.00 ක් වන අතර බවුසරය ප්‍රවාහනය සඳහා කි.මී. 1 ට රු.38 ක්වේ. කම්කරු කුලිය (පුහුණු ) දිනකට ( පැය 08) රු. 3500.00 ක් වන අතර රඳවා/ගැනීමේ ගාස්තු දිනකට රු. 1000.00 ක් වේ.**

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**
**එම මිළ ගනන් යොදාගමු.**

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**

**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසුරිය මහතා ගේ යෝජනාව අනුව 2026 වසර සඳහා කුරුවිට ප්‍රාදේශීය සභාවේ ජල බවුසර සේවාව ලබාදීම වෙනුවෙන්, 2025 වර්ෂයේ දෙවන කාර්තුවට අදාලව දිස්ත්‍රික් මිළ කමිටුවාර්තාවේ සඳහන් මිළ ගනන් පරිදි ජල බවුසරයක් ( ජලය රහිත ) දිනකට ( පැය 08 ට ) රු. 14000.00 ක් වශයෙන්ද බවුසරය ප්‍රවාහනය සඳහා කි.මී. 1 ට රු.38 ක් ද කම්කරු කුලිය (පුහුණු ) දිනකට ( පැය 08) රු. 3500.00 ක් වශයෙන්ද රඳවාගැනීමේ ගාස්තු දිනකට රු. 1000.00 ක් වශයෙන්ද අයකිරීමටද මෙම ගාස්තු රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළ කිරිමට ද ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -

**06- 90. නිවාස හා නගර සැළසුම් ආඥාපනත යටතේ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල ගොඩනැගිලි සැළසුම් හා බිම් සැළසුම් වෙනුවෙන් අයකරුනු ලබන ගාස්තු රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළ කිරීමට යෝජනා කරමි.**

ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -
**එම යෝජනාව ස්ථිර කරමි.**

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -
මේ සම්බන්ධයෙන් අදාල ගාස්තු පහත පරිදි වේ. අවශ්‍ය සංශෝධන ඉදිරිපත්කරන්න.
ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව - රු. 500.00
විපීරේඛා අයදුම්පත්‍ර ගාස්තුව - රු. 100.00
වීපීරේඛා සහ නොපරවාගැනීමේ සහතික නිකුත් කිරීම - රු. 1600.00

උක්ත කලාපයට අයතුනොවන නාගරික ප්‍රෙද්ශයෙන් පිටත පිහිටා ඇති නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක ප්‍රදේශවල පහත පරිදි ගාස්තු අයකෙරේ.

| ඉඩම් අනුබෙදුම් සැලැස්මක් සම්බන්ධයෙන් අනුමැතියට අදාළ එක් බිම් කොටසක් සඳහා | |
|---|---|
| පර්චස් 06 සිට 10 දක්වා | රු 1200.00 |
| පර්චස් 10 සිට 20 දක්වා | රු 1700.00 |
| පර්චස් 20 ට වැඩි | රු 2200.00 |

| ඉඩම් සැලැස්මක් සම්බන්ධයෙන් අනුමැතියට අදාළ එක් බිම් කොටසක් සඳහා | |
|---|---|
| පර්චස් 06 සිට 10 දක්වා | රු 1700.00 |
| පර්චස් 10 සිට 20 දක්වා | රු.2200.00 |
| පර්චස් 20 ට වැඩි | රු 2700.00 |

| ඉඩම් සැලැස්මක් අනුමත කර ගැනීමකින් තොරව අනුබෙදුම් කර ඇති අවස්ථාවක නියමානුකූල කිරීම සඳහා අදාළ අනුබෙදුම් සැලැස්ම අනුමත කිරීම සඳහා අයකළ යුතු නියමිත ගාස්තුවට අමතරව එම ගාස්තුවෙන් | |
|---|---|
| පර්චස් 06 සිට 10 දක්වා | 35% |
| පර්චස් 10 සිට 20 දක්වා | 45% |
| පර්චස් 20 ට වැඩි | 55% |

| ගොඩනැගිලි ඉදිකිරීම්/ නැවත ඉදිකිරීම් හා වෙනත් ඉදිකිරීම් සඳහා (එක් වර්ග මීටරයක් සඳහා) | | | |
|---|---|---|---|
| ගෙබිම් විශාලත්වය (වර්ග මීටර්) | නේවාසික | | නේවාසික නොවන |
| | තනි නිවාස | මහල් නිවාස | |
| 400 දක්වා | රු 27.00 | රු.32.00 | රු.32.00 |
| 401-1000 දක්වා | රු 27.00 | රු 32.00 | රු 32.00 |
| 1001-1500 දක්වා | රු 30.00 | රු 34.00 | රු 34.00 |
| 1501-2000 දක්වා | රු 30.00 | රු 37.00 | රු 37.00 |
| 2000 ට වැඩි වන සෑම වර්ග මීටර් 90ක් සඳහාම | රු 2700.00 | රු 2700.00 | රු 2700.00 |

| නියමානුකූල කිරීමේ ගාස්තුව අත්තිවාරම දක්වා - නිමකර ඇති අවස්ථාවක | | |
|---|---|---|
| සංවර්ධනයේ ස්වභාවය | අදාළ ගොඩනැගිලි සැලැස්ම අනුමත කිරීම සඳහා අයකළ යුතු නියමිත ගාස්තුවට අමතරව එම ගාස්තුවෙන් | |
| | නේවාසික | නේවාසික නොවන |
| අත්තිවාරම් මට්ටම දක්වා | 25% | 30% |
| වහල මට්ටම දක්වා ඉදිකිරීමේ ටැම් සහ බාල්ක ඇතුළුව ඉදිකර ඇති විට (වහලය හැර) | 35% | 40% |
| වහලය සහ බිත්ති ඉදිකිරීම | 50% | 60% |

| තාප්ප / පැති බැම් ආදිය සඳහා ( දික් මීටරයක් සඳහා) | | |
|---|---|---|
| | උස මීටර් 2ට අඩු | උස මීටර් 2ට වැඩි |
| දිග මීටර් 50ට අඩු | රු .30.00 | රු .60.00 |
| දිග මීටර් 50ට වැඩි | රු .40.00 | රු .70.00 |
| වෙනත් ඉදිකිරීම් | | |
| | ඉදිකිරීම සඳහා | නියමාණුකූල කිරීම |
| සන්නිවේදන / ඇන්ටනා කුළුණු / සම්ප්‍රේෂණ කුළුණු | රු .40000.00 | රු .75000.00 |

| අනුකූලතා සහතික නිකුත් කිරීම | |
|---|---|
| ගොඩනැගිලි (නේවාසික) | රු .3000.00 |
| ගොඩනැගිලි (නේවාසික නොවන) | රු .5000.00 |
| ඉඩම් අනුබෙදුම් සැලැස්ම | රු .3500.00 |
| පදිංචියට සුදුසු බවට සහතික නිකුත් කිරීම | රු. 3000.00 |
| කාලය දීර්ඝ කිරීම (එක් වසරක් සඳහා) | රු.3000.00 |

**<u>ගරු උප සභාපති අනිල් ලියනගේ මහතා -</u>**

***සම්ප්‍රේෂණ කුළුණු වලට ගාස්තුව වැඩි කරමු. ඉදිකිරීමට රු. 50000.00 ලෙසත් නියමාණුකූල කිරීමට රු. 100000.00 ලෙසත්. ගාස්තුව වැඩි කරමු.***

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

***වැඩි දියුණු ගම් ප්‍රදේශ කියලා පාරේ සිට මීටර් 150 ක දුරක් නියම කරලා. වලදූරේ බන්ධනාගාර පාරේ බන්ධනාගාරය ලඟට ඇවිත්. බන්ටෙක ලඟ ඇලදිගේ . තව ප්‍රදේශ වලත්***

*මේක වෙලා ඇති. ඒ පැත්තේ සමහර පවුල් වලට ඉන්න ගෙයක් වත් නෑ. ඒවා ගම්. ඉහල නිලධාරි උපරිමයෙන් දඩ අය කරන්න කටයුතු කරනවා. මේ ප්‍රදේශවල මිනිස්සු වැසිකිලියක්, කුස්සියක් හදන්නේ ගෙට පලයක් බාලා. නමුත් ඒවාටත් දඩ එයි. අනුමැතින් ගන්න කියයි. අසාධාරන දඩ. පාරේ ඉඳලා මීටර් 100 දුර කලා නම් හරි. නාගරික සංවර්ධන අධිකාරියට කියන්න. මම නම් මේ කටයුත්තට හැමදාම විරුද්ධ උනා. අවුරුදු හතරෙන් හතර මේ කටයුත්ත තක්සේරු දෙපාර්තුමේන්තුවෙන් කරනවා. 46 දෙනාම මැදිහත් උනොත් මේක බේරුම් කරගන්න පුළුවන්. ජනතාවට පීඩනයක්. වරිපනම් 6% ත් වැඩියි. එම ප්‍රමාණයත් වැඩියි.*

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -</u>
*එහෙම බලපෑමක් නෑ. මිනිස්සු ගම්වල ඉදිකිරිම් කරනවා.*

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>
**වෙනත් ඉදිකිරිම් යටතේ දක්වා ඇති සන්නිවේදන, ඇන්ටනාකුළුණු, සම්ප්‍රේෂණ කුළුණු වල ගාස්තුව සංශෝධනය කරමු.** ***ඉදිකිරිමට රු. 50000.00 ලෙසත් නියමාණුකූල කිරිමට රු. 100000.00 ලෙසත්. අනෙක් ගාස්තු එපරිදිම දක්වමු.***

**ඒ අනුව සභා මතය විමසීමෙන් අනතුරුව පහත තීරණය ඒකමතිකව සභා සම්මත විය.**
**ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා ගේ යෝජනාව අනුව නිවාස හා නගර සැළසුම් ආඥාපනත යටතේ කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අදාල ගොඩනැගිලි සැළසුම් හා බිම් සැළසුම් වෙනුවෙන් අයකරුනු ලබන ගාස්තු සම්බන්ධව වෙනත් ඉදිකිරිම් යටතේ දක්වා ඇති සන්නිවේදන, ඇන්ටනාකුළුණු, සම්ප්‍රේෂණ කුළුණු වල ගාස්තුව සංශෝධනය කර** ***ඉදිකිරිමට ගාස්තුව රු. 50000.00 ලෙසත් නියමාණුකූල කිරිමට ගාස්තුව රු. 100000.00 ලෙසත්*** **ගාස්තුව පැනවීමටත් අනෙක් ගාස්තු ඉහත දක්වා ඇති පරිදිම අයකිරිමටත්, රජයේ මුද්‍රණාල දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කරනු ලබන ගැසට් පත්‍රයේ පළ කිරීමටත් ඒකමතිකව මහා සභාවේ තීරණය විය.**

**07. කාරක සභාවල වාර්තා ඉදිරිපත් කිරීම -**

**07 - 01. 2025.09.19 දිනැති මුදල් කමිටු වාර්තාව.**

<u>ගරු උපසභාපති අනිල් ලියනගේ මහතා</u> -
වීදිලාම්පු මිලදීගත්තේ නැතිද?
එම විස්තර මේකට අදාල නෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රන්ජන් ප්‍රදීප් මහතා -</u>
මුදල් කමිටුවේ නිර්දේශ නොවේද? පෙර මුදල් කමිටුවට දාලා මහා සභාවට දැම්මා. දැන් එසේ අනවශ්‍යද? ඇස්තමේන්තු වල නම් නෑ. අදාල මන්ත්‍රී වරයාගේ. නීතිය අනුව කටයුතු කරන්න. ඇස්තමේන්තු මහා සභාවේ අනුමත වෙලා නෑ. පිලිවෙලක් නෑ. මේවාට උපදෙස් දෙන්න. මම මුදල් කමිටුවේ නෑ. නමුත් මේ කටයුතු පිලිවෙලක් විය යුතුයි.
<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා</u>

මේ ඇස්තමේන්තු සභාවට කලින් දාපුවා. ලක්ෂ 10 ට අඩු ඒවා. ඒ පිලිබඳව කටයුතු කිරිමට මුදල් කමිටුවට බලය පවරලා තියෙන්නේ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>**

අදාල මන්ත්‍රිගේ නම දාලා මුදල දාන්න. විනිවිදව තොරතුරු මේකේ නෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංගල ඩයස් මහතා -</u>**

මුදල් කමිටුවට පුළුවන් නිර්දේශ දෙන්න විතරයි. හදිසි ඒවාට තීරන ගන්නත් පුළුවන්. මේකේ අංක 10,20,25,09,ආදි කර්මාන්ත ගොඩක සභාවේ ඇස්තමේන්තු අනුමත කරන්නැතිව දාලා. ටෝනර් යන්ත්‍ර කීපයක් අරන්. ඒවා යන්ත්‍ර විය යුතුයි. සංග්‍රහ කටයුතු වලට 40000.00 ක් ඕනද?

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ක්‍රමවේදය අනුව කරමු. සංග්‍රහයට 40000.00 ක් අත්තිකාරම් ගන්න මුදල් කමිටුවේ තීරණය කලා. එය අවශ්‍යතාවය පරිදියි වැයබර දරන්නේ. සමහර දිනට තේ පැන් පමනක්. ඉතිරි මුදල් නැවත සභාවට බදිනවා. රාත්‍රි උනොත් දිවා ආහාරය දෙන්න වෙනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද කුමාර මහතා -</u>**

සංග්‍රහය සොයාබලා දෙන්න. සමහරු මාළු කන්නේ නෑ. එළවළු කනවා. අහලා දෙන්න. වතුරත් දෙන්න. දැන් දෙනවා.

<u>ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා -</u>

ඒ මුදල ඇතුලත බුපේ දෙන්න හැකිද ලබන්නම්.

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මහේෂ් නාපාවලමහතා -</u>**

6-3 යටතේ මේක සංවර්ධනය උනේ වසරකට පෙර. නමුත් දැන් කැඩිලා. රැඳවුම් මුදල් නිදහස්කරන්න 2025 යෝජනා කරලා. සොයාබලන්න.

ඒ අනුව **2025.09.19 දිනැති** මුදල් කමිටු වාර්තාව මහා සභාවේ සලකා බලන ලදී.

**07 –** 02. 2025.09.09 දිනැතිනිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

2025.09.09 දිනැතිනිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව මහා සභාවේ සලකා බලන ලදී.

07. – 03. 2025.09.11 දිනැති පුස්තකාල උපදේශන කමිටු වාර්තාව.
_2025.09.11 දිනැති පුස්තකාල උපදේශන කමිටු වාර්තාව මහා සභාවේ සලකා බලන ලදී.

**08 . ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ,එකතු කල ආදායම් පිලිබඳ ප්‍රගති වාර්තා-**

**08-01. 2025සැප්තැම්බර් මස ගෙවීම් වාර්තාව.**

**2025 සැප්තැම්බර් මස ගෙවීම් වාර්තාව පිලිබඳව මහා සභාවේ සළකා බලන ලදී.**

**08-02. 2025** අගොස්තු මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව

**2025** අගොස්තු මස ආදායම් අයකිරීමේ ප්‍රගති වාර්තාව මහා සභාවේ සළකා බලන ලදී.

**08-03. 2025 අගොස්තු මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය.**

**2025 අගෝස්තු මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය මහා සභාවේ සළකා බලන ලදී.**

**08- 04. 2025 අගෝස්තු මස ඒකාබද්ධ වැය සාරාංශය.**

**2025 අගෝස්තු මස ඒකාබද්ධ වැය සාරාංශය මහා සභාවේ සළකා බලන ලදී.**

**09.** සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්

**1.**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දේවින්ද මහතා -

මේ සභාව මෙපමන රෑ වෙන්නේ මීට කලින් අවසන් කිරිමට පුළුවන්. සභා වාර්තාවත් ඉතා දීර්සයි. යම් සීමාවක් පනවාගෙන කටයුතු කරමු. දැන් රෑ හතයි. කලින් මෙච්චර රෑ උනේ නෑ. කැමත් දිලා කලින් ගෙදරත් ගියා. ඒ වගේම මේ මාධ්‍ය මහත්තයාට යම් මුදලක් අපි වෙනම දෙමු. එතුමා දවස පුරාම ඉන්නවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ප්‍රේමරත්න මහතා -

**මලව බන්ධනාගාරේ ව්‍යාපෘතිය ගෙවීම්. ව්‍යාපෘති දෙකක්ද? මේ ගෙවීම ලක්ස 40 ක්. මේකේ ඉවත්කල පරණ භාණ්ඩ කෝ?.වයර් රෝල් ආදිය. අහලා කියන්න. තොරතුරු දෙන්න. මේ ඉදිකිරිම් අනවසරයි. මේවාට අධිභාර එයි. ඒ නිසා මේගැන සොයලා ලබන සභා වාරෙට තොරතුරු දෙන්න. පොහොරබාව අක්කර 10ක් තියෙනවා. මේ කටයුතු කරන්න.**

මෙම අවස්ථාවේදී සභාවේ වාහන වලට ඉන්ධන සැපයීම පිලිබඳව සාකච්ජාවක් පැවති අතර මෙම ඉන්ධන සැපයීම පිලිබඳව විමසිලිමත් විමට සාකච්ජා විය. සියළු වාහන සඳහා ඉන්ධන සැපයීමේදි යම් පරික්ෂාවක් සිදුකර අවශ්‍ය ප්‍රමාණ තීරණය කිරිමට සාකච්ජා විය. කුරුවිට කොට්ඨාශයේ ප්‍රධාන මාර්ගයේ කසළ මෙම දිනවල එකතු නොවීම සම්බන්ධව සාකච්චා වූ අතර මේ පිලිබදව හේතු සොයාබැලීමට හා නිවරදි කිරීමට සාකච්ජා විය.

ගරු සභාපති එම්. විකසිත පුෂ්පසූරිය මහතා

**මෙදිනට නියමිත මහා සභාවේ කටයුතු අවසන් වූ අතර ගරු සභාපතිතුමා විසින් සභාවේ සියළු කටයුතු සඳහා සහාය දුන් සියළු ගරු මන්ත්‍රී තුමන්ලාට හා ගරු උප සභාපති තුමාට , මාධ්‍ය හිතවතුන්ට, කාර්ය මණ්ඩලයට ස්තුතිය පළ කරන ලදි.**

**මහා සභා රැස්වීමේ කටයුතු ප.ව.7. 00 ට පමණ අවසන් කරන ලදී.**

එම්.විකසිත පුෂ්පසුරිය ,
සභාපති,
ප්‍රාදේශීය සභාව, කුරුවිට

පිටපත් : -

01.කුරුවිට ප්‍රාදේශීය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලා වෙතට - (දැ.ගැ.පි)
02.පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා - (දැ.ගැ.පි)
03.විගණකාධිපති,විගණකාධිපති උපකාර්යාලය,මහ නගර සභාව,රත්නපුර - (දැ.ගැ.පි)
04.ප්‍රධාන කාර්යාලයේ සියලුම වැඩසටහන්
සහකාරවරුන්,සංවර්ධන නිළධාරීන්, කළමණාකාර සහකාරවරුන්
හා කාර්මික නිලධාරීන් වෙතට - ඔබ විෂයට අදාල කටයුතු කිරීමට
05.කාර්ය භාර නිලධාරීන් - එල්ලාවල, කිරිඇල්ල, දොඩම්පේ - ඔබ කාර්යාලයට අදාල කරුණ ගැන අවධානය යොමු කිරීමට
06.ප්‍රජා සංවර්ධන නිලධාරී

<u>මහා සභාතීරණ ලබාදීම -2025.10.14 අංක 06-02.</u>

**2025.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 06-02 යටතේ ගරු සභාපති විකසිත පුෂ්පසූරිය මහතා විසින් ඉදිරිපත් කල යෝජනාව.**

**06-02.** කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින ආහාර සැකසුම් හා අලෙවිකරණ ස්ථාන වල ආහාර සුරක්ෂිත ක්‍රමවේදයන් ඉහල නැංවීම අරමුණුකොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සමඟ එක්ව සුදුසු ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරිමට යෝජනා කරමි.

තීරණය - කුරුවිට ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින ආහාර සැකසුම් හා අලෙවිකරණ ස්ථාන වල ආහාර සුරක්ෂිත ක්‍රමවේදයන් ඉහල නැංවීම අරමුණුකොට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාල සමඟ එක්ව සුදුසු ක්‍රමවේදයක් සකසා ක්‍රියාත්මක කිරිමට ඒකමතිකව මහා සභා තීරණය විය.

<u>මහා සභාතීරණ ලබාදීම -2025.10.14 -අංක 06- 15.</u>

**2025.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 06-15 යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.කේ.ඩී.පී.කේ. ජයනෙත්ති මහතා විසින් ඉදිරිපත් කල යෝජනාව**

**06- 15.** සංචාරක ආකර්ශනයක් ඇති සූදාගල ඇල්ල මාර්ගය සහ දියඇල්ල ආශ්‍රිත ප්‍රදේශය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීමට යෝජනා කරමි.

**තීරණය - සංචාරක ආකර්ශනයක් ඇති සූදාගල ඇල්ල මාර්ගය සහ දියඇල්ල ආශ්‍රිත ප්‍රදේශය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදුකිරිමට ඒකමතිකව මහා සභා තීරණය විය.**

<u>මහා සභාතීරණ ලබාදීම **-2025.10.14 - අංක 06-21.**</u>

**2025.10.14 දින කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 06-21 යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී_එම්.කේ. විජේසිරි මහතා මහතා විසින් ඉදිරිපත් කල යෝජනාව**

**06– 21. කුරුවිට ලෙල්ලගොඩ ලංගම බස්රථය සෙනසුරාදා, ඉරිදා, හා රජයේ නිවාඩු දිනවල ලෙස ධාවනය කිරිම සඳහා රත්නපුර ඩිපෝවේ බලධාරින් දැනුවත් කිරිමට යෝජනා කරමි.**

**තීරණය - කුරුවිට ලෙල්ලගොඩ ලංගම බස්රථය සෙනසුරාදා, ඉරිදා, හා රජයේ නිවාඩු දිනවල ලෙස ධාවනය කිරිම සඳහා රත්නපුර ඩිපෝවේ බලධාරින් දැනුවත් කිරිමේ කටයුතු සිදුකිරිමට ඒකමතිකව මහා සභා තීරණය විය.**

<u>**2025.10.14 දිනැතිව කුරුවිට ප්‍රාදේශීය සභාවේ පැවති මහා සභාවේ යෝජනා අංක 06 -05 හි තීරණයේ උද්‍ධෘතය**</u>